# සංක්ෂිප්ත කරන ලද
# ජාතීන්ගේ ධනය
# සහ
# අපූර්ව ලෙස සංක්ෂිප්ත කරන ලද
# ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය

ර්මෝන් බට්ලර්

© සිංහල පරිවර්තනය අරුණි ශපීරෝ 2017

ඇඩම් ස්මිත් ඉන්ස්ටිටියුට්හි විවෘත පරිහරණ ප්‍රතිපත්තියක් අනුගමනය වෙයි. කොපිරයිට් අයිතිය, අයිතිකරුවා සතුව තිබුණ ද, භාවිතා කරන අයට බාගත කරගෙන, 'සේව්' කරගෙන, කැමති ආකාරයකින් නැවත බෙදාහැරීමට පුළුවන් පහත කොන්දේසි යටතේය: (1) ඇඩම් ස්මිත් ඉන්ස්ටිටියුට් යන නම සඳහන් කළ යුතුයි; (2) මෙම නිවේදනය සමඟ එහි වෙබ් ලිපිනය www.adamsmith.org සඳහන් කළ යුතුයි; (3) අන්තර්ගතය කිසිදු වෙනස් කිරීම් වලින් තොරව සම්පූර්ණයෙන් යොදාගත යුතුයි [විවේචනය හෝ සමාලෝචනය සඳහා කොටස් භාවිතය පුළුවනි]; (4) මෙය යළි-විකිණිය නොහැක; (5) මේ හා කරන ඕනෑම අන්තර්ජාල භාවිතයක දී එහි සබැඳිය info@adamsmith.org වෙත යැවිය යුතුයි.

මෙම වාර්තාවේ දැක්වෙන අදහස් කර්තෘගේ මිසෙක ප්‍රකාශකයාගේ හෝ කොපිරයිට් අයිතිකරුවාගේ අදහස් අනුව එකඟතාවයක් දැක්වෙන්නක්ම නොවේ. මෙය ප්‍රකාශනය කරන්නේ මහජන විවාදය සඳහා කරන මෙහෙවරක් හැටියට ය.

© Adam Smith Research Trust 2011
Published in the UK by ASI (Research) Ltd.
ISBN: 1–902737–77–6
Some rights reserved
Printed in England

# අන්තර්ගතය

1 හැඳින්වීම

2 සංක්ෂිප්ත කරන ලද *ජාතීන්ගේ ධනය*

I පොත: ආර්ථික කාර්යක්ෂමතාවය සහ නිෂ්පාදන සාධක
II පොත: ප්‍රාග්ධන සමුච්චය
III පොත: ආර්ථික වර්ධනයේ ප්‍රගතිය
IV පොත: ආර්ථික න්‍යාය සහ ප්‍රතිපත්ති
V පොත: රජයේ භූමිකාව

3 ඉතා අපූරු ලෙස සංක්ෂිප්ත කරන ලද *ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය*

4 වැඩිදුර කියැවීම

# 1 හැඳින්වීම

ඇඩම් ස්මිත්ගේ අර්ථ ශාස්ත්‍රය ගැන වූ පුරෝගාමී කෘතිය, ජාතීන්ගේ ධනය (1776), පිටු 950 ක් පමණ දීර්ඝ වූවකි. නූතන පාඨකයාට ඊට පිවිසීම කළ නොහැකි බවක් දැනේ: එහි භාෂාව අලංකාරයෙන් අනූනය, එහි පද වහර කල් ඉකුත් වී ගියකි, එහි කතාවෙන් පිට යන අවස්ථා ඇත, එක අවස්ථාවක දී එසේ මාතෘකාවෙන් බැහැර යෑම පිටු 70 ක් පුරා පැතිර යයි, එහි එන 18 වැනි සියවසේ විවිධ විෂම වූ උදාහරණ අපිව දැනුවත් කරනවා වෙනුවට බොහෝ විට අපව තක්බීරි කරවයි.

එනමුත්, ජාතීන්ගේ ධනය යනු ලෝකයේ ඉතාමත් වැදගත් පොත් අතරින් එකකි. ඩාවින් විසින් ජීව විද්‍යාවට දායද කරන ලද්ද, නිව්ටන් විසින් භෞතික විද්‍යාවට දායාද කරන ලද්ද, මෙම පොතෙන් අර්ථ ශාස්ත්‍රයට දායාද කරන ලදි.  අපිට උරුම වූ වෙළඳාම, වානිජ්‍යය, සහ රජයේ ප්‍රතිපත්ති පිළිබඳ පැරණි යල්පැන ගිය නුවණ සැලකිල්ලට ගෙන, එය සම්පූර්ණයෙන් නව්‍ය කරමින්, අදත් ප්‍රයෝජනවත් ලෙසින් භාවිතා කරත හැකි මූලධර්ම ලෙසින් පිරිනමන ලදි. ජාතික ධනය මැනීම සඳහා මිනුම් දණ්ඩක් ලෙසින් දළ දේශීය නිෂ්පාදිතයේ සංකල්පය ගැන ස්මිත් වටසනක් ගැසීය. විශේෂ ප්‍රාගුණ්‍ය තුලින් පාදා ගත හැකියාව ලැබෙන දැවැන්ත නිෂ්පාදන වාසි ඔහු පෙන්වා දුන්නේය. විකුණන්නා පමණක් නොව වෙළඳාමේ දී දෙපැත්තේම ඉන්නා අය යහපතක් සාධනය කරගන්නා ආකාරය ඔහු හැඳිනගත්තේය. විශිෂ්ට කාර්යක්ෂමව බවකින් සම්පත් බෙදාහරින්නට සමත් වූ ඖපපාතික යාන්ත්‍රණයක් හැටියට ඔහු වෙළඳපොල පිළිගත්තේය. එසේම ඔහු පහදා ගත්තේ විවිධ නිෂ්පාදකයන් අතර මේ යාන්ත්‍රණය පවතිද්දී, ඔවුන් ප්‍රචුල හා සාරවත් ලෙසින් සහයෝගයෙන් කටයුතු කරන බවයි. සියවස් දෙකක් ඉක්මවා යද්දී ද ආර්ථික විද්‍යාවේ භාස්මික නිර්මිතයේ කොටසක් ලෙසින් මේ සියළු අදහස් පවතී.

ඉතින් ජාතීන්ගේ ධනය කියැවීම වටිනේය. නමුත් එය කියැවීම නොහැකි තරම් වූවකි. අද අපට අවශ්‍ය එයට වඩා බෙහෙවින් කෙටි වූවකි: ස්මිත්ගේ අදහස් නියෝජනය කරන, නූතන මත දක්වන අයෙකු වෙතින් පෙරහන් වී වැටෙන්නක් නොව, අපට අවශ්‍ය නූතන භාෂාවෙන් ලියැවෙන ලද්දකි. මේ පොතේ අරමුණ එය පමණක් ඉටු කිරීමයි. එනම්, භාෂාව සහ තාක්ෂණික පද වහර යාවත්කාලීන කිරීමයි. අලංකාරාත්මක බවේ හෝඩුවාවක් දැනෙන තරමට පමණකින් ස්මිත්ගේ උදාහරණ හා උපුටනයන් යොදා ගැනීමයි. එසේම වර්තමානයේ ආර්ථික සංකල්ප තුලින් ස්මිත්ගේ ඒ මුල් අදහස් වර්ධනය වී ඇත්තේ කෙසේදැයි දක්වන සටහන් ඇතුලත් කිරීමයි.

ස්මිත්ගේ අනෙක් පොත, ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, ඔහුව සුප්‍රසිද්ධ කරන ලද පොත ද මෙයාකාරයෙන්ම ඉදිරිපත් වෙයි. එය ග්ලැස්ගෝ විශ්ව විද්‍යාලයේ දී දර්ශනය නිර්දේශයක් සඳහා ස්මිත් උගන්වන ලද්දේ නිමැවුමයි. අපේ ස්වභාවය සහ එය සමාජ ජීවීයන් ලෙස සැලකිල්ලට ගනිමින් ආචාර ධර්ම පැහැදිලි කරන ලද්දකි. එය තරුණ බුක්ලේ ඩ්‍යුක්වරයාගේ සුළු පියාව කොතරම් විස්මජනක සතුටට පත්කරන්නට සමත් වූවාදැයි කියතොත්, ජීවිත කාලයටම ගෙවන වේතනයක් පිරිනමා, තරුණයාට උගන්වමින් යුරෝපයේ අධ්‍යාපන චාරිකාවක් රැගෙන යාමට, ස්මිත්ව වහාම සේවයට බඳවා ගැනෙන ලදි.

ඒ සංචාරයන් වලින් අලුත් අත්දැකීම් උකහා ගත් ස්මිත්, ඒ සඳහා නොමඳව කාලය වැයකරන්නට ඉඩ ලැබෙද්දී, ජාතීන්ගේ ධනය නමින් ඉදිරිපත් කරන පොතේ කටු සටහන් ගහන්නට පටන් ගත්තේය. ස්කොට්ලන්තයේ පැවති සිය නිවහනේ දී ඔහු එය ලියන්නට සහ ඔප දමන්නට මෙන්ම එහි දක්වන තම අදහස් ගැන ලන්ඩනයේ විසූ එවක විද්වතුන් හා විවාද කරන්නට ද ඔහු තවත් දශකයක් ගන්නා ලදි. නිම වූ පොත තවත් දැවැන්ත වානිජ්‍ය සාර්ථකත්වයකි. ඉතා සීඝ්‍රයෙන් මුද්‍රණ ගණනාවක් හා පරිවර්තන ගණනාවක් බිහිවිණ.

එහි අන්තර්ගතය විප්ලවීය වූවකි. තම වෙළඳාම අනෙක් රටවල් වලින් ආරක්ෂා කරගත යුතු යන එවක පැවති අදහසට කෙළින්ම පහරක් එයින් එල්ල විය. සිය දේශයේ අය අතර මෙන්ම, ජාතීන් අතර නිදහස් වෙළඳාම සිද්ධ වෙද්දී, දෙපැත්තම වඩා යහපත් වෙන ආකාරය එයින් පෙන්වා දෙනු ලැබීය. ඒ නිදහසට නියාමන, රේගු බදු හා බදු පනවමින් ආණ්ඩු මැදිහත්වෙද්දී, ඒවා ඒ රටවල ජනතාව ධනවත් කරනවා වෙනුවට දුප්පත් කරවන බව එහි තර්කය විය.

ස්මිත්ගේ අදහස් දේශපාලනඥයන්ට බලපෑම් එල්ල කරන්නට සමත් වී සමහර සිදුවීම් ද වෙනස් කරන්නට පාදක විය. වෙළඳ ගිවිසුම්, බදු ප්‍රතිසංස්කරණ හා සහනාධාර සහ රේගු බදු අයින් කිරීම සඳහා ද මුල් වෙමින්, ලෝක සමෘද්ධියේ වර්ධනය ඇති වූ නිදහස් වෙළඳාමේ ශ්‍රේෂ්ඨ 19 වැනි සියවස මුදා හැරිණ.

මේ පොත සකස් වී ඇති අයුරු

පහත අන්තර්ගතයේ කර්තෘවරයා විසින් ඇඩම් ස්මිත්ගේ තර්කයන් සංක්ෂිප්ත කරන ලද අවස්ථා සාමාන්‍ය අකුරු වලින් දැක්වේ. ටිකක් මැදට ගෙනෙන ලද වගන්ති ස්මිත්ගේම වචන වෙති. *ඇද අකුරු වලින් දක්වා ඇති කොටස් ස්මිත් කියන කොටස්වල පැහැදිලි කිරීමක් සහ එය වැදගත් වෙන්නේ ඇයි දැයි කරන පැහැදීමකි.*

# 2 සංක්ෂිප්ත කරන ලද ජාතීන්ගේ ධනය

ජාතික ධනය යනු එහි ඒක පුද්ගල (ප්‍රතිශීර්ෂ) ජාතික නිෂ්පාදිතයයි -සාමාන්‍ය පුද්ගලයෙක් සැබැවින්ම නිෂ්පාදනය කරන ප්‍රමාණයයි. රටක් සතුව ඇති ඕනෑම ස්වභාවික සම්පත් මිශ්‍රණයක් ගත්විට, එහි නිෂ්පාදනයේ යෙදෙන ජනගහණයට සමානුපාතිකව මෙම ඒක පුද්ගල ජාතික නිෂ්පාදනය රඳා පවතියි. නමුත් එය, ඊටත් වඩා වැදගත්කමෙන් යුතුව, මේ නිෂ්පාදනය කරන ශ්‍රමය කොතරම් කාර්යක්ෂම දැයි සහ කොතරම් කුසලතා වලින් යුතුදැයි යන්න මත රඳා පවතී.

*එවක දී, මේ අදහස දැවැන්ත නවොත්පාදනයක් විය. එවක සත්‍යය යැයි සිතූ පිළිගැනීම වූයේ ධනය ඇත්තේ මුදල් වල -රන් රිදී වැනි වටිනා ලෝහ තුල යැයි කියායි. ස්මිත් තරයේ කියා සිටියේ සැබෑ ධනය නම් මුදල් වලින් ගත හැකි දේවල් බවයි. එනම්, 'භූමියේ වාර්ෂික නිෂ්පාදනයන් සහ සමාජයේ ශ්‍රමය' බවයි. දළ ජාතික නිෂ්පාදිතය නැත්නම් GNP හැටියට අපි අද දැන සිටින්නේ මෙයයි. ඒ ඒ රටවල සමෘද්ධිය මනින මිනුමක් හැටියට එය භාවිතා කෙරේ.*

I පොත[1] විමසා බලන්නේ නිෂ්පාදන කාර්යක්ෂමතාවය වැඩි දියුණු කරවන යාන්ත්‍රණය ගැනය. ඵලදායී රකියාව රඳන්නේ (එය පැහැදිලි කෙරෙයි) කොතරම් ප්‍රාග්ධන[2] ප්‍රමාණයක් කුමන ආකාරයකින් භාවිතා වෙන්නේ ද යන්න මතයි. II පොත මෙය විමර්ශනය කරයි.

III පොතෙන් සැලකිල්ලට පාත්‍ර වෙන්නේ ජාතික නිෂ්පාදනය විශාල ලෙසින් මහජන ප්‍රතිපත්තියේ බලපෑමට ලක්වෙන ආකාරයයි. IV පොත මේ කාරණා සැලකිල්ලට ගනිමින් විවිධ ආර්ථික න්‍යායන් අගැයුමට ලක් කරයි. V පොත අනතුරුව රජයක නිසි භූමිකාව, බදුගැසීමේ සිද්ධාන්තයන්, සහ ආර්ථිකයකට ආණ්ඩුව විසින් කරන බලපෑම හඳුන්වා දෙයි.

## I පොත: ආර්ථික කාර්යක්ෂමතාවය සහ නිෂ්පාදක සාධක

### විශේෂ ප්‍රාගුණ්‍ය සහ ඵලදායිතාව

ආර්ථික කාර්යක්ෂමතාවය සඳහා ප්‍රධාන වෙනුයේ විශේෂ ප්‍රාගුණ්‍යය හෙවත් ශ්‍රම විභජනයයි. උදාහරණයක් හැටියට අල්පෙනෙත්තක් වැනි සුළු දැයක් හදන කර්මාන්තය සලකා බලන්න. ලෝහ අප සතුව තිබියත් සහ එය ලෝපස් කර අපට දුන්නත් අපි බොහෝ දෙනෙකුට එක දවසෙන් අල්පෙනෙත්තක් හදාගැනීම වුවද දුෂ්කරය. අපිට අල්පෙනෙති දහයක් හදා ගැනීම කෙසේවත් කරනු නොහැකියි. ඒත් දහ දෙනෙක් සිටින කම්හලකට අල්පෙනෙති 48,000 ක් නිපදවන්නට පුළුවනි. මන්ද, ඒ හැම අයෙක්ටම එම ක්‍රියාවලියේ ඒ ඒ කොටස ගැන විශේෂ ප්‍රාගුණ්‍යයක් ඇති නිසායි. අයෙක් කම්බියක් ඇද ගනියි. තවකෙක් එය ඍජු කරවයි. තෙවැන්නා එය කපයි. හතරවැන්නෙක් එය උල් කරයි. පස්වැන්නා එහි මුදුන සමතලා කර හිස ලබාගන්නට සකස් කරයි. එයට කොටසක් එකතු කිරීමට හැකි පරිදි මේ මුදුනේ හිස සෑදීමට තවත්

[1]ජාතීන්ගේ ධනය පොත් පහකට බෙදා ඇති අතර, ඒවා අනතුරුව පරිච්ඡේද අනුව බෙදා ඇත.

[2]ස්මිත් 'කොටස්' යැයි ලියන්නට අපි අද 'ප්‍රාග්ධනය' යැයි සාමාන්‍යයෙන් භාවිතා කරමු.

විශේෂ ක්‍රියාවලියක් උවමනා කරයි. අල්පෙනෙති පිරිසුදු කරවන්නට සහ පැකට් කරවන්නට තව අයගේ විශේෂ ප්‍රාගුණ්‍යයන් අවශ්‍ය වේ. විශේෂ ප්‍රාගුණ්‍ය විසින් මේ ක්‍රියාවලිය දහස් ගුණයකින් වඩාත් ඵලදායී කර ඇත.

ඵලදායීත්වයෙන් ලැබෙන මහා වාසිය නිසා විශේෂ ප්‍රාගුණ්‍යය වෙළඳ අංශයක් ඇතුලත පමණක් නොව වෙළඳ අංශ අතර ද හඳුන්වා දෙනු ලබයි. නිදසුනක් වශයෙන් ගොවිතැන ගත්විට, ගෙදර බඩු හදාගන්නට සහ මෙවලම් හදාගන්නට කාලය මිඩංගු කරනවා වෙනුවට තම වගාව හා සත්වපට්ටිය වෙනුවෙන් මුළු කාලයම යොදවනවා නම් ගොවියාට වැඩියෙන් කාර්යක්ෂම විය හැකියි. එයාකාරයෙන්ම, යකඩ තලන්නන්ට සහ ලීබඩු හදන්නන්ට තමන්ගේ ආහාර තමන් විසින්ම වගාකර නොගනිද්දී, ඔවුන්ට මේ ගෘහ භාණ්ඩ වැඩියෙන් නිෂ්පාදනය සඳහා තම වෑයම යොදවන්නට කාලය ලැබේ. තමන් වැඩියෙන් හොඳින් හදන භාණ්ඩ අපනයනය කරමින් තමනට අවශ්‍ය අනෙකුත් හුවමාරු භාණ්ඩ (රන් රිදී බොරතෙල් වැනි) ආනයනය කරමින් සම්පූර්ණ රටවල් පවා විශේෂ ප්‍රාගුණ්‍යයේ යෙදෙති.

> ශ්‍රමයේ ඵලදායී බලයේ විශිෂ්ටතම වැඩි දියුණුවත් සහ කුසලතාවයේ විශාලතම කොටස හැඩගැසිය හැකියාව, එය කුමන පැත්තට යොමු කරනවා ද, කෙසේ යොදාගන්නවා ද යනාදී කරුණු ශ්‍රම විභජනයේ ප්‍රතිඵලයක් ලෙසින් ඇති වූ බව පෙනී යයි.[3]

විශේෂ ප්‍රාගුණ්‍යයට ඉඩදීම නිසා ඇතිවූ කාර්යක්ෂම බවේ දැවැන්ත ඉහළ යාම සාධක තුනකින් පැහැදිලි වේ.

- පළමුවැන්න නම් එකම කාර්යය නැවත නැවත කරද්දී එයට කුසලතාවය ජනතාව වැඩි වර්ධනය කරගැනීමයි. කුසලතාවයෙන් යුතු ශ්‍රමිකයෙක් කාර්යයක නියැළෙන ආකාරය සමහර අවස්ථාවල දී විශ්මය ජනක ය.
- දෙවැන්න, එක කාර්යයකින් තවත් කාර්යයකට මාරුවෙන්නට යන කාලය අපතේ යෑම අඩුවේ. රෙදි වියන්නා තමන්ම වගා කරන කුඩා ගෙවත්ත බලාගැනීමට රෙදි වීවීම නවතා, ගොවි මෙවලම් ද රැගෙන වත්තට ඇවිද යා යුතුයි. එක කාර්යයකින් තවත් කාර්යයකට මාරු වෙද්දී, එහි නියැළෙන නිසි ආකාරයට මනස සකස් කරගැනීමට ද යම් කාලයක් ද වැයවේ. එයින් නැවත එද්දී ද එය යළිත් කරන්නට සිදුවේ. මෙවැනි බාධාවන් ගෙනෙන වැදගත්කම අවතක්සේරු කළ නොයුතුයි.
- තෙවැන්න, ඒ සඳහාම කැප වූ යන්ත්‍ර භාවිතයට ගන්නට විශේෂ ප්‍රාගුණ්‍යය ඉඩක් පාදයි. එයින් කර්මාන්ත නිෂ්පාදනයට අවශ්‍ය කාලය හා වෑයම පැහැදිලිවම අඩුකරගන්නට හැකියාව ලැබේ. බොහෝ විට, මේ ශ්‍රමය ඉතිරි කරගන්නා උපකරණ නවෝත්පාදනය කරගන්නේ ශ්‍රමිකයන් විසින්මයි. අනෙක් දියුණු කිරීම් යන්ත්‍ර සාදන අය වෙතින් ලැබේ. ඒ අය දැන් ඔවුන්ටම විශේෂිත වූ වෙළඳාමක නියැළෙති.

කර්මාන්ත ක්‍රමයේ යෙදෙන සියල්ලන් අතරම ඉතා ඉහළ මට්ටමකින් සිද්ධ වෙන සහයෝගය ශ්‍රම විභජනය සඳහා පැහැදිලිවම අවශ්‍ය වේ. සැබැවින්ම, ඉතාමත් සරල වූ දැය නිෂ්පාදනයට පවා දහස් ගණනකගේ සහයෝගය අවශ්‍යයි. උදාහරණයක් හැටියට වූල් කබායක් හදන්නට එඬේරුන්, රෙදි හැදීමට වූල් තෝරන අය, රෙදි හැදීමට වූල් සකසන අය, වූල් වලට පාට දමන අය, රෙදි වියන අය සහ තවත් විශාල සංඛ්‍යාවක්

[3]ජාතීන්ගේ ධනය, I පොත, I පිටුව, 1 වන වගන්තිය

අවශ්‍යයයි. වූල් ගන්නට බැටළුවාගේ ලොම් කපන අයට පවා පතල් කරුවන්ගේ හා යකඩ තලන්නන්ගේ සේවය අවශ්‍යයයි. වූල් ප්‍රවාහනය කරන්නට නාවිකයන්ගේ, නැව් හදන අයගේ, සහ රුවල් හදන අයගේ සේවය අවශ්‍යයයි. ලැයිස්තුවේ නිමාවක් නැත.

> උදාහරණයක් හැටියට, දවසේ පඩියට වෙහෙසෙන්නාව ආරක්ෂා කරන වූල් කබාය, කොතරම් රළු හා සණකමෙන් පෙනුන ද, එය මහා විශාල ශ්‍රමිකයන් ගණනාවකගේ එකමුතුවෙන් සිද්ධ වූ ශ්‍රමයෙහි ඵලදාවයි. එඬේරා, වූල් තෝරන්නා, පාට දමන්නා, ලියන්නා, කටින්නා, රෙදි වියන්නා, රෙදි අපුල්ලන්නා, රෙදි වේලන්නා, සහ තවත් බොහෝ පිරිසක්, මේ වාම් නිෂ්පාදනය නිම කරන්නට ඔවුන්ගේ විවිධ වූ කලා සියල්ලම එකට එකතු කළ යුතුයි.[4]

මේ ඉතා ඉහළ විශේෂ ප්‍රාගුණ්‍යයෙන් යුතු දහස් ගණනකගේ සහයෝගීත්වය යනු ඉතා දියුණු ආර්ථික ක්‍රමයකි: එසේම එය, අනිවාර්ය ලෙසින්ම, සංවර්ධිත රටවල විශාල ධනයේ ප්‍රභවයයි. එයින් කියැවෙන්නේ වඩාත්ම කාර්යක්ෂම ලෙසකින් බඩු නිෂ්පාදනය වෙන බවයි. ඒ නිසා ඒවායේ මිල අඩු වෙන බවයි. අතේ ප්‍රමාණවත් තරමකට මුදල් නැතිකම නිසා ලබාගන්නට නොහැකිව සිටි සමාජයේ දුප්පත්ම සාමාජිකයාට ද, විශේෂ ප්‍රාගුණ්‍ය පවතිද්දී අනේක වූ භාණ්ඩ සහ සේවා රාශියක් තුලින් සිය තෝරාගැනීම් කරන්නට ඉඩ ලැබෙන බවයි.[5]

හුවමාරුව තුලින් අන්‍යෝන්‍ය වාසි ලැබීම

බඩු හුවමාරුවට සහ හුවමාරු කරගැනීමට මිනිසා තුල පවතින ස්වභාවික නැඹුරුව නිසා විශේෂ ප්‍රාගුණ්‍යය වර්ධනය විය. අපි කැමති භාණ්ඩ අයිති මිනිසුන්ව අපි දකිද්දී, ඒ අය ඒ බඩු ඔවුන්ගේ හිත හොඳකම නිසා අපිට ලබා නොදෙන බව අපි දනිමු. නමුත් ඒ වෙනුවට ඔවුන්ට දෙන්නට අපි සූදානම්, ඒ අයට අවශ්‍ය දෙයක් අප සතුව තිබිය හැකියි.

> අපේ රාත්‍රී ආහාරය අපි බලාපොරොත්තු වෙන්නේ, මස්කඩකාරයාගේ, මත්පැන් පෙරන්නාගේ නැත්නම් බේකරිකාරයාගේ හොඳ හිත තුලින් නොව, ඔවුන්ගේම ස්ව යහපත උදෙසා සිද්ධ වෙන්න තුලිනි. ඔවුන්ගේ මිනිස්කමට නොව අප යොමුවෙන්නේ ඔවුන්ගේ ස්වාර්ථයටයි. අපි කතා කරන්නේ අපේ අවශ්‍යතා ගැන නොව ඔවුන්ට ලැබෙන වාසි ගැනයි.[6]

*'ස්වාර්ථය' නැත්නම් 'ස්වකීය වාසිය තකන' යනුවෙන් ස්මිත් අදහස් කරනුයේ 'කෑදරකම' හෝ 'ආත්මාර්ථකාමය' නොවේ. ඔහු අදහස් කරන ලද්දේ අපි අපගේ සුබසාධනය ගැන දක්වන මුළුමනින්ම ස්වභාවික වූ ද, නිසියාකාර වූ ද, සැලකිල්ල ය. ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය පොතේ ඔහු එය හඳුන්වන්නේ 'විචක්ෂණය' හැටියටයි. මිනිස් සමාජයේ නිරෝගී බවට මූලික වනුයේ 'යුක්තිය' -අනෙකුකට හානියක් නොකිරීම- යැයි ඔහු තරයේ කියා සිටියි.*[7]

---

[4]ජාතීන්ගේ ධනය, I පොත, I පරිච්ඡේදය, 22 පිටුව, 11 වගන්තිය.
[5]ජාතීන්ගේ ධනය, I පොත, I පරිච්ඡේදය, 22 පිටුව, 10 වගන්තිය.
[6]ජාතීන්ගේ ධනය, I පොත, II පරිච්ඡේදය, 26-7 පිටු, 12 වගන්තිය.
[7]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, VI කොටස, I ඛණ්ඩය.

හුවමාරුවෙන් ලැබෙන මේ වාසි, සහ එහි නියැළෙන්නට අප තුල ඇති ස්වභාවික කැමැත්ත, ශ්‍රම විභජනය උත්තේජනය කරන්නට සමත් වෙයි. අනෙකුත් අය හා හුවමාරු කරගන්නට යමක් තිබීම සඳහා අපි පුද්ගලිකව හොඳින් නිර්මාණය කරන දැයක අතිරික්තයක් හැදීම අපට වටිනාකමක් උපදවයි. එය සරලම ලෙසකින් දක්වන්නට, අපි ප්‍රාථමික සමාජයක් ගැන සිතා බලමු. යම් විශේෂිත මානසික හෝ ශාරීරික කුසලතාවයක් නිසා එක් පුද්ගලයෙක් අනිත් අයට වඩා හොඳින් ඊතල හදන්නට, නිවාස හදන්නට, නැත්නම් සත්වයන්ගේ හම් ගලවන්නට, එහෙමත් නැත්නම් යකඩ වැඩ කරන්නට හපන් වෙති. ඔවුන්ගේ පුද්ගලික අවශ්‍යතා වලට උවමනා ප්‍රමාණයට වැඩියෙන් ඒ විශේෂ කුසලතාවයෙන් භාණ්ඩ නිමකරන්නට ඔවුන් සමත් වෙද්දී, ඔවුන්ට අනෙක් අය සමඟ හුවමාරු කරගන්නට දැයක් ලැබී ඇත. ඉතින් එවිට ඒ සෑම පුද්ගලයෙකුට අනෙකා හා හුවමාරු කරගත හැකි පරිදි කාර්යක්ෂම නිපැයුම්කරුවන් වීම ගැන අවධානය යොමු කළ හැකියි. යකඩ තලන්නා ඔහු හැදූ අතිරික්ත පිහි ඊතල හදන්නාගේ ඊතල සඳහා හුවමාරු කරගනියි. හම් හදන්නා ඇඳුම් හුවමාරු කරගන්නේ නිවාසයකටයි. ඒ ඒ පුද්ගලයා තමන්ට උවමනා දේවල් වලින් මිශ්‍රණයකට අයිතිය කියන්නට හැකියාව ලබති. ඒ සියල්ලම ඔවුනොවුන්ට විශේෂිත වූ දැනුමෙන් කාර්යක්ෂම ලෙසින් නිෂ්පාදනය කරන ලද දේවල් වෙති.

එකිනෙකාට වෙනස් වූ ජනතාව පවා මෙයාකාරයෙන් සහයෝගයෙන් කටයුතු කරති -ඔවුන් එසේ කරන්නේ ගුණවත්කම ගැන වූ විශිෂ්ට හැඟීමකින් නොවේ. ඔවුන් හදන දැයකින් පුද්ගලිකවම වාසියක් ලබාගත හැකි යැයි දෙපැත්තේම අය දකින නිසායි.

විසල් වෙළඳපොල විසල් වාසි ගෙනෙයි

අපිව විශේෂ ප්‍රාගුණ්‍යයට යොමු කරවනු ලබන්නේ හුවමාරුවෙන් අපි ලබන යහපතයි. ඒ නිසා අතිරික්තය වැඩි කරගන්නට අපි අනුන් හා හුවමාරුව පවත්වා ගත යුතුයි. ඒ විශේෂ ප්‍රාගුණ්‍යය කොතරම් දුරකට යනවා දැයි රඳා පවතින්නේ කොතරම් දුරකට හුවමාරුවට හැකියාව ඇත්දැයි මත. එනම්, *වෙළඳපොලේ*[8] වපසරිය මතයි.

සමහර වෙළඳාම් -නිදසුනක් හැටියට නට්ටාමියාගේ වෘත්තිය- සඳහා ඉඩකඩ ලැබෙන්නේ, නිතර වැඩ ලැබෙන තරම් පාරිභෝගිකයන් සෑහෙන ප්‍රමාණයක් සිටින විශාල නගර වල දී පමණි. එම මිම්මේ අනෙක් කොනේ සිටින්නේ ස්කොට්ලන්තයේ දුර බැහැර ගම්බද ඒ ඒ පවුල් වෙති. ඔවුන් ගොවිතැන්, මස්කඩකාරයන්, බේකරිකාරයන්, මත්පැන් පෙරන්නන්, හා වඩුවැඩ කාර්මිකයන් හැටියට ඒකීයව කටයුතු කරති. ඒ අතරට යකඩ වැඩ කරන ගම්බද වැසියෙක් ඕනෑම ආකාරයක යකඩ වැඩක් කරදෙන්නට ඉදිරිපත් වෙයි. ගම්බද වඩුවැඩ කාර්මිකයා ද ලීයෙන් සියල්ල කරන්නෙක් වෙයි; දොරවල් ජනේල නිවාසයට එකතු කරන, අල්මාරි හදන, කැටයම් දමන, කරත්ත රෝද හදන සහ කරත්ත හදන්නා ද වෙයි.

මුදල් හා අගය

අනිවාර්ය ලෙසකින්ම වෙළඳපොල ප්‍රසාරණය කරවන දැය මුදල්[9] වෙයි. විශේෂ ප්‍රාගුණ්‍යය ශක්තිමත්ව පවතින වානිජ සමාජයක අපි අපේ අවශ්‍යතාවය පිණිස යමක් හදාගන්නේ ඉතාමත් අඩු ප්‍රමාණයකිනි. අපේ

---

[8] ජාතීන්ගේ ධනය, I පොත, III පරිච්ඡේදය.
[9] ජාතීන්ගේ ධනය, I පොත, IV පරිච්ඡේදය.

උවමනාවන් සපයන්නට අප හා අනෙක් අය හුවමාරු කරගනීවි යැයි අපි බලාපොරොත්තු වෙමු. ඒත් උදාහරණයක් හැටියට නොමිල පරිභෝජනයට බඩගිනි මත්පැන් පෙරන්නන්ට බඩගිනි බේකරිකාරයන්ව හොයා ගන්නට සිද්ධ වුවහොත් හුවමාරුව දුෂ්කර විය හැකියි. තමන්ගේ අවශ්‍යතාවය සපයන්නට හැකි වූ ද, ඒ සඳහා තමන් සපයන්න උවමනා වූ ද, අයෙක් සොයා ගැනීම මත හුවමාරුව පවත්වා ගන්නවා වෙනුවට, පුරාතන සමාජය හුවමාරුව සඳහා මාධ්‍යයක් සොයා ගියහ. තම නිෂ්පාදනය වෙනුවෙන් සතුටින් බාරගන්නට කැමති, එයින් වෙන අය හා හුවමාරුවේ යෙදිය හැකි තෙවැනි භාණ්ඩයක් ඔව්හු සොයා ගත්හ.

හෝමර්ගේ කාලයේ දී එය හරකාබාන විය. ඇබිසීනියාවේ එය ලුණු විය. ඒ සඳහා ඉන්දියාවේ සිප්පි කටු යොදා ගැනිණ. නිව්ෆවුන්ඩ්ලන්තයේ වියළි මෝර මාළු විය. වර්ජිනියාවේ දුම්කොළ ද, බටහිර කොදෙව් දූපත් වල දී සීනි ද ඒ සඳහා භාවිතා වුණි. එහෙත් කාලයාගේ අවෑමෙන්, සම්මත මුදල් හැටියට ලෝහ පත්විය. එය කල් තබා ගත හැකියි, එසේම (හරකාබාන මෙන් නොව) අවශ්‍යතාවයට සරිලන අන්දමින් පාඩු නොවෙන ලෙස කුඩා ප්‍රමාණයන්ට බෙදීමටත් යළි නැවත ලොකු ප්‍රමාණයන්ට එකතු කිරීමටත් හැකියි. පුරාතන රෝමයේ මුදල් හැටියට මුලින්ම සරල තඹ කැට කුට්ටි භාවිතා වී තිබුන ද, ඒවා විචල්‍ය වූ නිසා භාවිතා කරන සෑම අවස්ථාවක දී ම ප්‍රමාණය කිරා මැන බලන්නට සිද්ධ වුණි. අවසානයේ දී ඒ ලෝහ වල අනගිත්වය හා සම්මත බර දක්වන ලෙසකින්, කැට කුට්ටි වලට අච්චු වලින් මුද්‍රා තැබීම සොයා ගැනීමත් සමඟ ලෝකයේ ප්‍රථම කාසි බිහි වූහ.

ඒත්, හුවමාරුව මුදල් මාර්ගයෙන් සිද්ධ වූවත් නැතත්, එකිනෙකට වෙනස් නිෂ්පාදන හුවමාරු කරගන්නේ කුමන අනුපාතිකයෙන් දැයි තීරණය වෙන්නේ කෙසේද? අගය යන වචනයෙහි අර්ථ දෙකකි. භාවිතයට ගැනීමේ දී පවතින අගය එකකි. අනෙක, හුවමාරුවේ දී පවතින අගයයි. වතුර ඉතාමත් ප්‍රයෝජනවත් දැයකි. ඒත් එහි හුවමාරු අගයක් නැති තරම් ය. දියමන්තියක් බොහෝ දුරට භාවිතයේ ප්‍රයෝජනවත්කමක් නැති දැයක් වුවත් එහි හුවමාරු අගය අතිමහත් ය.

හුවමාරු අගය තීන්දු කරන සිද්ධාන්ත, මේ මිල යන්නෙහි අංගෝපාංග, සහ එහි ඉහළ පහළ යෑම් ඇති කරන සාධක, පහදා දීම පහසු නැත.

*සැබැවින්ම එය පහසු කාර්යයක් නොවේ. ජාතීන්ගේ ධනය පොතේ පරිච්ඡේද ගණනාවක් ස්මිත් මේ සඳහා යොදාගෙන තිබේ. විශේෂයෙන්ම, I පොත, V-XI පරිච්ඡේද. අද අපට ආන්තික උපයෝගීතා න්‍යාය තුලින් දියමන්ති සහ වතුර ගැටළුව නිරාකරණය කරගන්නට හැකියාව ලැබී ඇතැයි කිව හැකියි. දියමන්ති දුර්ලභ නිසා එයින් තව එකක් තිබීම අගනා වස්තුවක් යැයි සැලකේ. ඒත් වතුර ඕනෑතරම් ඇති නිසා, තවත් පිරුණු කෝප්පයකින් අපිට ඇත්තේ සුළු ප්‍රයෝජනයකි. එහෙමත් නැත්නම් අපි ඉල්ලුම් විග්‍රහය භාවිතා කරමු. ඒත් ස්මිත්ගේ කාලයේ එවැනි මෙවලම් නොතිබිණ.*

සියළු හුවමාරු භාණ්ඩවල හුවමාරු අගය සත්‍යයෙන් මනින මිනුම වනුයේ එහි නිෂ්පාදනයට යොදවන ලද ශ්‍රමයයි.[10] අපි විකුණන භාණ්ඩය නිර්මාණය කරන්නට අපි වෑයමක් යොදවන හේතුව වනුයේ අපි මිල දී ගන්නට කැමති භාණ්ඩ අප විසින්ම නිර්මාණය කරගැනීමෙන් නිශ්චිතවම අයින් වී සිටීම පිණිසයි. අපි හුවමාරු කරගනිද්දී, අපි මිල දී ගන්නේ අනුන්ගේ ශ්‍රමයයි. අවසානයේ දී, ධනය යනු මුදල් නොවේ -එය අනිත් අයගේ ශ්‍රමයෙන් අපිට ලබාගත හැකි ප්‍රමාණයයි, එනම් අපි මිල දී ගන්නා ප්‍රමාණයයි. (ශ්‍රමය

---

[10]ජාතීන්ගේ ධනය, I පොත, V පරිච්ඡේදය.

වෙහෙසන සමහර ආකාර වැඩියෙන් දුෂ්කර විය හැකියාව සහ සමහර පුද්ගලයන් අනෙකුත් අයට වඩා දක්ෂයන් වීම අනිවාර්යයෙන් පවතින්නකි. නමුත් වෙළඳපොල තුල පවතින කේවල් ක්‍රමය මේ දේවල් සමතුලිත කරවයි.)

*බොහෝ විස්තර ප්‍රචාරකයන්ට මෙය නිෂ්පාදන වැය ගැන අවධානය යොමු කරමින් ඉල්ලුම නොසලකා හරින ලෙසින් වූ, රළු ආකාරයකින් දැක්වෙන අගය පිළිබඳ ශ්‍රම න්‍යායයක් හැටියට පෙනෙනු ඇත. එසේ දැකීම නිසා කාල් මාක්ස්ට ශ්‍රමය ගැන ඔහුගේ පිළිකුල් දෝෂ හදන්නට පාර කැපුනා යැයි සමහර අය තර්ක කරති. ශ්‍රමය පමණක් සම්පූර්ණ නිෂ්පාදන වැය වූ යුගයක් පමණක් සැලකිල්ලට ගෙන, එනම් ඉඩම් සහ ප්‍රාග්ධන අයිතියක් නොවූ යුගයක් ගැන කතා කිරීමෙන් සරල ඉදිරිපත් කිරීමක් ගෙනෙන්නට ස්මිත් උත්සාහ කළා යැයි අයෙකුට ස්මිත්ගේ නිර්දෝෂීත්වය පෙන්වත හැකියි. තාවකාලිකව එහි දී ස්මිත් ඉඩම් හා ප්‍රාග්ධනය යන සාධක මෙන්ම ඉල්ලුම ද නොසලකා හැර ඇත. ඒවා ගැන ඔහු ඊ ළඟට ලියයි. හොඳින් බැලුවොත්, ඔහුගේ මේ වචන පාඨකයාව නොමග යවයි. නරකින් බැලුවොත් ඒ වදන් වැරදියි. ඒත් එවක දී ඔහු එතෙක් නොවූ අලුත් දැයක් ඉදිරිපත් කරන්නට පටන් ගත්තෙකි.*

සාමාන්‍යයෙන් අපි හුවමාරුවේ අගය ඇස්තමේන්තු කරන්නේ මුදල් අනුව තමයි. මන්ද, ශ්‍රමයට වඩා පහසුවෙන් සහ නිශ්චිත ලෙසකින් මුදල් මනින්නට හැකි නිසයි. ඒත් එය පරිපූර්ණ මිනුමක් නොවේ. කාසි හදන්නට අපි යොදාගන්නා රන් රිදී වැනි ලෝහ, පතල් ඵලදායිත්වය සහ ප්‍රවාහන වියදම් යනාදිය අනුව, දීර්ඝ කාලයක් යද්දී අගය ඉහළ පහළ යාමට භාජනය වේ. මුදල් මිල ගණන් නාමික මිල ගණන් වෙද්දී ශ්‍රමය පමණක් සත්‍ය මිල ගණන් හැටියට පවතියි. අපිට වැඩි වෙහෙසෙන් හා කරදරයෙන් හදාගත යුතු දේවල් මිල දී ගන්නට අපිට වැඩි වැයක් යනු ඇත. අව්‍යාජ ධනය නම් අනෙකුත් අය හා හුවමාරුවෙන් ලබාගන්නා ඔවුන්ගේ ශ්‍රමයයි. ඔවුන්ගේ මුදල් නොවේ.

**ශ්‍රමය, ප්‍රාග්ධනය, සහ ඉඩම්**

ප්‍රාග්ධනය නොමැති සහ ඉඩම් නොමිලේ පවතින ප්‍රාථමික වූ දඩයම් සමාජයක, එකම නිෂ්පාදන සාධකය වනුයේ ශ්‍රමයයි. තමන්ට පහසුවෙන් හදාගත හැකි දෙයක් අනුන්ගෙන් මිල දී ගැනීම තේරුමක් නැති නිසා, මිල හැමවිටම දැක්විය යුත්තේ ඊට යොදාගත් ශ්‍රමයයි. මුවෙක් මරන්නට යන ශ්‍රමයට වඩා දෙගුණයක් ශ්‍රමය බීවර් සතා මරාගන්නට යනවා නම්, එවිට එක් බීවර් සතෙක්ව මුවන් දෙන්නෙක්[11] සඳහා හුවමාරු කරගත හැකියි (වෙළඳපොල මිල ගණන් තුලින් අසීරුකම සහ පහසුව පිළිබිඹු කරනු ඇත).[12]

*දඩයම් සමාජයක දී, ශ්‍රමයේ සම්පූර්ණ ඵලදාව ශ්‍රමිකයාට හිමිවේ. ඒත් මිනිසුන් ප්‍රාග්ධනය එකතුකර ගනිද්දී සහ සේවකයන් වැඩට යොදවා ගනිද්දී එය වෙනස් වේ. එවිට ඵලදාව -ශ්‍රමිකයන්ට වේතන සහ සේවාදායකයන්ට ලාබය යනාදී වශයෙන් ඔවුන් අතර බෙදාගත යුතුවේ. ලාබ යනු වේතන වලින් වෙනස් වූවකි: එයින් පෙන්නුම් කරන්නේ සේවායෝජකයාගේ වෙහෙස නොව නිෂ්පාදනයේ යොදාගත් ප්‍රාග්ධනයේ අගයයි.*

---

[11]ජාතීන්ගේ ධනය, I පොත, VI පරිච්ඡේදය, 65 පිටුව, 1 වගන්තිය.
[12]ජාතීන්ගේ ධනය, I පොත, V පරිච්ඡේදය, 49 පිටුව, 4 වගන්තිය.

*ජාතීන්ගේ ධනයේ මුල් පරිච්ඡේදයන් හි, ස්මිත් විසින් 'ප්‍රාග්ධනය' වෙනුවට 'කොටස්' යන වචනය භාවිත කර ඇත. පසුව ඔහු මේ 'කොටස්' යනු ස්ථිර සහ සංසරණ යන දෙවර්ගයෙන්ම හැදෙන ප්‍රාග්ධනය යැයි ද, එසේම කර්මාන්ත ක්‍රියාවලියට යොදාගන්නා අමුද්‍රව්‍ය, තවමත් විකුණා නැති නිමි නිෂ්පාදන, සහ පසුව පරිභෝජනයට ගැනීම පිණිස කල්තබා ගන්නා ලද භාණ්ඩ යනාදියත් වේයැයි පැහැදිලි කරයි. ඉන්පසුව ඔහු 'ප්‍රාග්ධනය' ගැන කතා කරන්නට පටන් ගනියි. අද සාමාන්‍යයෙන් 'ප්‍රාග්ධනය' කියද්දී අපි මේ සියල්ලම එලෙස සලකමු. එසේම ඕනෑම 'කොටස්' ඒකකයක් සඳහා නොනිමි, විකුණා නැති සහ පරිභෝජනය නොකළ භාණ්ඩ ද ඇතුලත් කරමු. එසේ මේ පදය භාවිතය පහසුයි.*

ඉඩම් පෞද්ගලික අයිතිය යටතට ගැනීමෙන් පසුව, තෙවැනි කණ්ඩායමක් ජාතික නිෂ්පාදිතයේ කොටස්කරුවන් වෙති. ඒ ඉඩම් හිමියන් ය. ආහාර, ඉන්ධන, සහ ඛනිජ ද්‍රව්‍ය දැන් තව දුරටත් ශ්‍රමයෙන් පමණක් ඒවා එකතු කරගන්නා අයට ලබාගන්නට නොහැකියි. ඉඩම් හිමියන් ඉල්ලා සිටින්නේ නිෂ්පාදනයෙන් කොටසක් දැන් ඔවුනට කුලී හැටියට ගෙවිය යුතු යැයි කියායි.

ඉතින් මේ අනුව නිෂ්පාදනයේ සාධක තුනකි. ඒවාට ගෙවීම් ලැබෙන්නේ වෙනස් සිද්ධාන්ත වලිනි. තිරිඟු මිල හැදෙන්නේ ඉඩම් හිමියාගේ කුලියෙන් කොටසක් ද, ශ්‍රමිකයාගේ වේතනයෙන් කොටසක් ද, ව්‍යාපාරය කරගෙන යන්නට මුදල් සහ උපකරණ යොදවන ගොවියාගේ ලාබයෙන් කොටසක් ද සමන්විත වීමෙනි. තිරිඟු පිටි මිල හැදෙන්නේ, පිටි මෝල්කරුවාගේ ලාබයෙන් කොටසක් සහ පිටිමෝලේ ශ්‍රමිකයන්ගේ වේතන වලින් කොටසක් ද අර කළින් කියූ වැයට එකතු වීමෙනි. ඉතින් පාන් මිල හැදෙන්නේ, එයාකාරයෙන්ම, බේකරිකරුවාගේ ලාබයෙන් කොටසක් ද, බේකරි සේවකයන්ගේ වේතන වලින් කොටසක් ද එකතු වීමෙනි. මේ නිෂ්පාදන ක්‍රියාවලියේ බොහෝ පිරිසක් නියැළෙති. වැය ගණන් හැම විටම මේ මූලිකාංගයන් තුනෙන් එකකට හෝ කිහිපයකට ඇතුල් වේ.[13]

ඉතින් ඔව්, සැබැවින්ම මේ ආදායම් මාර්ග වලින් දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකම පුද්ගලයාට හිමිවිය හැකියි. වතුවැවිලිකරුවාට එකවර ඉඩම් හිමියා සහ ගොවියා ද විය හැකියි. එසේම ගොවියෙක්ට එකවර ගොවි හා ශ්‍රමික භූමිකා දෙකේම සිටිය හැකියි. ඒ නිසා, කුලිය, ලාබය, සහ වේතන යනාදියෙන් හැදුන යම් මිශ්‍රණයක් එකම පුද්ගලයාට ලබාගත හැකියි.

නිෂ්පාදන වැය සහ වෙළඳපොල මිල ගණන්

ඕනෑම නිෂ්පාදන ක්‍රියාවලියක වේතන හා ලාබ සාමාන්‍ය මට්ටමකට එන හැඩියාව රඳන්නේ වෙළඳපොල මතයි. යම් හුවමාරු භාණ්ඩයක මිල එය නිෂ්පාදනයට යන වැය (කුලිය, ලාබය, වේතන) සහ වෙළඳපොලට ගෙන එන වැය සමඟ නිශ්චිතවම ගැලපෙද්දී අපි එය ස්වභාවික මිල[14] යැයි හඳුන්වමු. ඊට වඩා වැඩි මිලකටම එය අලෙවි වෙන්නේ නම් එවිට වෙළෙන්ඳා ලාබයක් සොයා ගනියි. එය ඊට වඩා අඩු මිලකට විකිණෙද්දී එවිට වෙළෙන්දාට පාඩු සිද්ධ වේ.

*භාෂාව යල්පැන ගිය ද, 'ස්වභාවික මිල' යන්නෙන් ස්මිත් අදහස් කරන්නේ තරඟය තුල 'සාමාන්‍ය' මට්ටමේ ලාබය ද ඇතුළුව ඇති නිෂ්පාදන වැයට වඩා වැඩි දෙයක් නොවේ. නිෂ්පාදනයක් සඳහා යන වැය අනුව*

[13]ජාතීන්ගේ ධනය, I පොත, VI පරිච්ඡේදය.
[14]ජාතීන්ගේ ධනය, I පොත, VII පරිච්ඡේදය.

*අගය තීරණ වීම සිද්ධ වේ යන ස්මිත්ගේ දැක්ම හා මෙය එකඟය. ඒත් අද අපි කතා කරන්නේ ඉල්ලුම සහ සැපයුම ගැනයි. ඒ නිසා 'ස්වභාවික මිල' යන පද වහර නූතන භාෂාවෙන් අර්ථ දැක්වීම දුෂ්කර වේ. නමුත් සරලව 'නිෂ්පාදනයේ වැය' කියා සැලකීම ප්‍රායෝගිකයි.*

නිෂ්පාදන ඇත්තෙන්ම විකිණෙන මිලට අපි කියන්නේ වෙළඳපොල මිල ගණන් කියායි. මෙය ඉල්ලුම සහ සැපයුම මත තීරණය වේ. එනම්, වෙළෙන්ඳන් කොතරම් ප්‍රමාණයකින් භාණ්ඩ වෙළඳපොලට ගෙනෙනවා ද යන්නත්, සහ මිල දී ගන්නා යැයි සැලකෙන අය විසින් කොතරම් ඉල්ලුමක් කරනවා ද යන්නත් මතයි.[15] ඉල්ලුමට වඩා සැපයුම අඩුවෙද්දී, එවිට මිල දී ගන්නා අය අතර තරඟයක් පවතී. ඉහළ මිලක් දෙන්නට සූදානම් අය නිසා මිල ඉහළ යයි. නිදසුන් වශයෙන්, යම්කිසි නගරයක් කෙනෙකුට ඇතුල්වීමට හෝ පිටවීමට නොහැකි සේ අවුරා දමා ඇති විටෙක, එහි තිබෙන අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල අධික ලෙසින් ඉහළ යයි. අනිත් පැත්තෙන්, බඩු වලින් වෙළඳපොල පිරී ඇත්නම්, විශේෂයෙන්ම පසු කාලයක දී ආපසු වෙළඳපොලට යළි ගෙනෙන්නට නොහැකි පළතුරු වැනි නරක් වෙන භාණ්ඩ වල දී, ඉල්ලුමට වඩා සැපයුම වැඩි නම්, වෙළෙන්ඳන්ට මිල පහත දමන්නට සිද්ධ වේ. ඉල්ලුම සහ සැපයුම නිශ්චිතවම ගැලපෙද්දී, ස්වභාවික සහ වෙළඳපොල මිල ගණන් සමාන වෙති. වෙළඳපොලේ බඩු විකිණී යයි.

ඉතින් ඒ නිසා වෙළඳපොල යනු ස්වයං නියාමනයකින් යුතු වූවකි. මිල ගණන් නිරන්තරයෙන් ඇදී යන්නේ තරඟයේ සිටින නිෂ්පාදනයේ වැය පැත්තටයි. නිෂ්පාදකයන් නිතර උත්සාහ කරන්නේ පාරිභෝගිකයන්ගේ ඉල්ලුමට නිශ්චිතවම ගැලපෙන ප්‍රමාණයට ඔවුන්ගේ නිෂ්පාදනය සපයන්නටයි.

*මෙය ස්මිත් වෙතින් මෙහි දී අපට ලැබෙන තවත් වැදගත් අන්තර්දෘෂ්ටියකි. වෙළඳපොල යනු සහමුලින්ම වැළැක්විය නොහැකි පද්ධතියකි. ලාබය සෙවීම ඔවුන්ගේ ස්වභාවික ලුහුබැඳ යාමක් නිසා වෙළෙන්ඳන් ඔවුන්ගේ සම්පත් ඉල්ලුම ඇති පැත්තට යොමු කරති. ඉල්ලුම වැඩි පැත්තේ මිල ගණන් ද ඉහළ වේ. වෙළෙන්ඳන් එසේ සිය සම්පත් ඒ පැත්තට යොමු කරද්දී ඉල්ලුම තෘප්තිමත් කරන්නට හැකියාව ලැබේ. කිසිත් මැදිහත්වීමකින් කෙරෙන මගපෙන්වීමක අවශ්‍යතාවයක් නැතිවම සම්පත් ඒවාට වැඩිම අගයක් දෙන පැත්තට ඇදී යයි.*

සුවිශේෂී මිල සාධක

වෙළඳපොල මිල ගණන් ඒත් සැබැවින්ම නිෂ්පාදන වැයෙන් ඉහළට සහ පහළට යමින් වෙනස් වෙමින් පවතියි. අස්වැන්න විචලා වූවක් නිසා, උදාහරණයක් හැටියට යම් වසරකට වඩා වැඩියෙන් වෙනත් වසරක දී, එකම ශ්‍රමිකයා විසින් තිරිඟු, වයින්, තෙල් හෝ බාර්ලි වැනි දැයක් නිපදවනු ඇත. එසේම වෙළඳපොල මිල ද ඒ අනුව ඉහළ හා පහළ යයි. කපු හා වූල් වැනි අනෙකුත් රෙදි සහ නිෂ්පාදන මෙයාකාරයෙන් මඳක් අඩු විචලායෙන් යුතුයි. ඒ නිසා ඒවායේ මිල ගණන් වඩා ස්ථානිකය. නමුත්, මහජනතාව එකමුතුව ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවක දී කළු රෙදි මිල ඉහළ යෑමත් එහි දී ආධුනික සන්නාලියන්ගේ වේතන ඉහළ යෑමත්, නිදසුනක් හැටියට පෙන්විය හැකියි.

---

[15]ස්මිත් විසින් මෙය උචිත ඉල්ලුම යැයි හඳුන්වයි. නිෂ්පාදනය ගන්නට කැමති සමහර පිරිසකට එහි මිල දරාගන්නට සැබැවින්ම නොහැකි බව ඔහු පෙන්වා දෙයි. අද මෙය අපි දන්නා කරුණකි. ඒ නිසා අපි සරලව ඉල්ලුම යැයි ඊට කියමු.

ඉල්ලුම ඉහළ යැමත් සහ හුවමාරු භාණ්ඩයක නිෂ්පාදන වැයට වැඩියෙන් වෙළඳපොල මිල ගණන් ඉහළ යැමත් සිද්ධ වෙද්දී, සැපයුම්කරුවන් තමන් අතිවිශාල ලාබ සොයන බව වසන් කරන්නට ස්වභාවයෙන්ම කටයුතු කරති. ඔවුන්ගේ තරඟකරුවන්ට ඒ ගැන දැනුම් දෙන්නට ඔවුන්ට අවශ්‍යතාවයක් නැත. ඒ නිසා මිල ගණන් ටික කලක් ඉහළ මට්ටමකින් පවතී. නමුත් මෙවැනි රහස් වැඩිකල් රකින්නට නොහැකියි.

කර්මාන්තකරුවන්ගේ රහස් ඊට වඩා වැඩි කලක් ආරක්ෂා කරගත හැකියි. උදාහරණයක් හැටියට, පාට ඩයි දමන්නෙක්, පවතින වැයට වඩා බාගයකින් අඩු වැයකින් යම් විශේෂ පාටක් නිෂ්පාදනයට ක්‍රමයක් හොයා ගනිද්දී, ඔහුගේ තරඟකරුවන් එයම සොයාගන්නට යන වසර ගණනාව ඇතුලත, ඔහු අති විශාල ලාබයක් සොයන්නට සමත් වේ. ඉතින් මෙහි දී වෙළඳපොල මිල ගණන් ස්වභාවික මිල ගණන් වලින් වෙනස් පැත්තක බොහෝ කාලයක් පවතිනු ඇත.

යම් විශේෂ අවස්ථාවක් නිසා එවැනිම ප්‍රතිඵලයක් ඇති විය හැකියි. ප්‍රංශයේ යම් විශේෂ මිදි යායක පිහිටීම සහ නිසි ගුණයෙන් යුතු පස් නිසා ඊට අසල්වැසි වතුයායන්ට වඩා හොඳින් කුලිය ඉහළ දමන්නට ඔවුනට හැකියාව ලැබේ. එසේම, යම් සැපයුම්කරුවෙකුට ඒකාධිකාරියක් පැවරීම නිසා ඔහුට සැපයුම සීමා කරමින්, මිල ගණන් ඉහළින් තබාගත හැකියි. එයාකාරයෙන්ම, ආධුනික පුහුණුව සීමා කරන නීති වලින්, නැත්නම් යම් වෙළඳ ක්ෂේත්‍රයකට පිවිසෙන ජන සංඛ්‍යාව සීමා කිරීමෙන් විශේෂ වෘත්තීන් වල නියුතු අයට ඔවුන්ගේ මිල ගණන් ඉහළින් තබා ගත හැකියි.

එවැනි අහඹු තත්වයන්, ස්වභාවික හේතු, සහ රෙගුලාසි වලින් නිෂ්පාදනයක වෙළඳපොල මිල ගණන් නිෂ්පාදන වැයට වඩා දිගු කාලයක් ඉහළින් තබාගත හැකියි. ඒත් වෙළඳපොලට වඩා අඩුවෙන් මිල ගණන් තබාගත නොහැකියි. එහෙම වුනොත්, දිගින් දිගටම පාඩු විඳින්නට සිද්ධ වුවහොත් ඔවුන් එයට නිදහස ඇත්නම් සැපයුම්කරුවන් හැටියට තව දුරටත් නොසිට එතැනින් අයින් වෙති. (එසේ කරන්නට නිදහස නොමැති අවස්ථා ඇත. නිදසුනක් වශයෙන් පුරාතන ඊජිප්තුවේ පිරිමි ළමුන්ට සිය පියා කළ වෙළඳාම තුලම යෙදෙන්නට සිද්ධ වූහ.)

ආර්ථික වර්ධනය මත වේතන රඳා පැවතීම

අපි දුටු පරිදි, ඉඩම් අයිතිකරුවන් නොසිටි යුගයක, සේවායෝජකයන් ප්‍රාග්ධනය එකතු කර නොගත් යුගයක, නිෂ්පාදනයේ සම්පූර්ණ ඵලදාව ශ්‍රමිකයාට හිමිවිය. නමුත් ඉඩම් අයිතිකරුවන් බිහි වූ සැනින්, ඔවුන්ගේ ඉඩම් භාවිතය සඳහා ඵලදාවෙන් කොටසක් ඉඩම් අයිතිකරුවන් ඉල්ලති. ප්‍රාග්ධනය එකතු කරන්නට ගත් සැනින් සේවායෝජකයන් ද එසේම ඉල්ලති.

ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය කොටස් ඔවුන් විසින්ම අයිති කරගත් ශ්‍රමිකයන් සුළු පිරිසක් සිටිති. ඒත් එය අසාමාන්‍යයි. සාමාන්‍යයෙන් ශ්‍රමිකයන් නිෂ්පාදන වත්කම් අයිතිය ඇති අනෙක් අය යටතේ සේවය කරති. නිෂ්පාදනය බෙදා ගැනෙන්නේ කෙසේද යන්න, එවිට සේවකයන් සහ සේවායෝජකයන් අතර ගිවිසුමකින් සිද්ධ වෙන්නකි. නමුත් එය සාමාන්‍යයෙන් සේවායෝජකයන්ට වාසිදායක තත්වයකි. ඔවුන්ගේ සංඛ්‍යාව අඩු නිසා, ඔවුන්ට ශ්‍රම වෙළඳපොලට ඇඟිලි ගසමින් වේතන අඩුවෙන් පවත්වා ගැනීමට

හැකියාව ඇත. වෙළඳ ආරාවුලක දී පැත්තකට වී සිටිය හැකි වැඩි සම්පත් ඔවුනට ඇත. ශ්‍රමිකයන් අතර දුස්සන්ධානය නීතියෙන් තහනම් වුවත්, සේවායෝජකයන් අතර දුස්සන්ධානය සෑම තැනකම පවතී.[16]

*එකල සාමාන්‍ය වැඩ කරන ජනතාව ගැන ස්මිත් සිය ලියැවිලි තුලින් දැඩි සංවේදීත්වයක් පෙන්වයි. තමන්ගේ වාසියට වෙළඳපොලට බලපෑම් කරන ලෙසකින් ඔහු දකින, එවක වෙළඳුන්ට සහ සේවායෝජකයන්ට ඔහුගේ අනුකම්පාව ලැබෙන්නේ අඩුවෙනි. වෙළඳපොල සහ නිදහස් වෙළඳාම ගැන විශ්වාසයක් තබාගත්තෙක් හැටියට ස්මිත් ගැන සිතා සිටි බොහෝ පිරිසක් මෙම කාරණාවෙන් විශ්මයට පත්වෙති. නිදහස් සහ තරඟකාරී වෙළඳපොල යනු ධනය බෙදාහරින්නට ඉතාමත්ම සුදුසු ක්‍රමය යැයි ද, එසේම විශේෂයෙන්, දුප්පතුන්ට එය බෙදා හැරීම ගැන ඔහුගේ අවධානය යොමු විණ. ඒ නිසා තරඟය හා නිදහස අඩු කරන දේශපාලනඥයන්ගේ සහ ව්‍යාපාරික ප්‍රජාවගේ උත්සාහ හැම විටම යටපත් කළ යුතු යැයි හේ විශ්වාස කළේය.*

ශ්‍රමයට ඇති ඉල්ලුම ඉහළ යද්දී, කෙසේ නමුදු, ශ්‍රමිකයන්ට වාසියක් ඇත. සේවායෝජකයන් අතර තරඟයෙන් වේතන ඉහළ යයි. නමුත් ශ්‍රමය සඳහා ඉල්ලුමක් වැඩි වෙන්නේ දළ ජාතික නිෂ්පාදනය ඉහළ යද්දී පමණකි. මන්ද, වේතන ගෙවිය හැකි වනුයේ ප්‍රාග්ධනයෙන් හෝ ආදායමෙන් පමණක් නිසයි. ධනවත් ඉඩම් හිමියන්ට පමණක් පරිභෝජනයට අවශ්‍ය නොවූ ආදායමක් ඇත. උදාහරණයක් හැටියට ඔවුන් එවිට තව වැඩියෙන් මෙහෙකරුවන් බඳවා ගනිති. රෙදි වියන්නන්ට සහ සපතේරුවන්ට අතිරික්ත කොටස් පවතින විට ඔවුන් තව වැඩියෙන් ආධුනිකයන් බඳවා ගනිති. ජාතික නිෂ්පාදිතය එක තැන ඇත්නම් හෝ පහළ වැටෙනවා නම් එවිට වේතන වලට ඉහළ යෑමට නොහැකියි.

චීනය ධනවත්, සාරවත්, කඩිසර සහ ජනගහණයෙන් පිරි රටක් හැටියට දීර්ඝ කාලයක් පැවතිණ. ඒත් මාර්කෝ පෝලෝ විසින් එයට වසර පන්සියයකට පෙර ගොඩ වැදුනාට පසුව මේ දක්වා එහි එතරම් දියුණුවක් දකින්නට නැත. ඉඩම් තවමත් නොසලකා හැර දමා නැතිව වගා කෙරෙයි. ඒත් චීනයේ ආර්ථික වර්ධනයක් නැත. ඒ නිසයි චීනයේ දුප්පත්ම ශ්‍රමිකයන්ගේ දරිද්‍රතාවය යුරෝපයේ දුප්පත්ම ජාතීන්ගේ දරිද්‍රතාවයට වඩා මහත් ලෙසකින් වැඩි වනුයේ.

බෙංගාලය සාරවත් රටකි. ඒත් දරිද්‍රතාවය කොතරම් පැතිර ඇත්දැයි කියතොත් එහි ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් සෑම වසරක දී ම කුසගින්නෙන් මිය යති. එහි ශ්‍රමික දුප්පතුන් නඩත්තු කරගන්නට අවශ්‍ය ජාතික නිෂ්පාදිතය පැහැදිලිවම ක්ෂය වෙමින් පවතියි (මේ ගැන අපිට ඊස්ට් ඉන්දියා කොම්පැණියේ පීඩකත්වයට දොස් කියත හැකියි).

වේතන මට්ටම් වලට බලපාන සාධක

මහා බ්‍රිතාන්‍යය වැනි නැඟී එන ආර්ථිකයන්හි වේතන වෙනස් වුවත් යැපුම් මට්ටමෙන් ඉහළින් පවතී. නිදසුන් වශයෙන් ගිම්හානයේ වේතන ඉහළ වෙති. මන්ද, වේතන අඩු සහ වියදම් වැඩි හේමන්තය වෙනුවෙන් ඉතිරි කරන්නට ශ්‍රමිකයන්ට උවමනාවක් තිබෙන බැවිනි. පළාතෙන් පළාතට ද වේතන වෙනස් වෙති. ලන්ඩනයේ සාමාන්‍ය වේතනයේ මිල දිනකට පැන්ස දහඅටක් පමණ වේ. එඩින්බරා හි එය පැන්ස දහයකි. ගම්බද ස්කොට්ලන්තයේ එය පැන්ස අටකි. එනමුත් ධාන්‍ය සලකා බලද්දී -සාමාන්‍ය වැසියන්ගේ

[16]ජාතීන්ගේ ධනය, I පොත, VIII පරිච්ඡේදය, 84 පිටුව, 13 වගන්තිය.

පොදු ආහාර- එය සරුවට වවන එංගලන්තයට වඩා ස්කොට්ලන්තයේ දී ගෙවන මිල අධික වේ. ස්කොට්ලන්තයේ වැසියන් අඩු ආදායම් වලින් මේ ඉහළ ධාන්‍ය මිල ගණන් ගෙවමින් තමන්ව නඩත්තු කරගනිති. එංගලන්තයේ වැඩ කරන ජනතාව යම් ඉසුරුමත් මට්ටමක ජීවත්වෙන බව එයින් පෙනී යයි.

මහා බ්‍රිතාන්‍යයේ වේතන වැඩිවෙන ආකාරය පෙනුන ද, විශේෂ ප්‍රාගුණ්‍යයෙන් එන ඵලදායිත්වය ඉහළ යෑමේ ප්‍රතිඵලයක් හැටියට මිල ගණන් සාමාන්‍ය වශයෙන් පහත වැටෙමින් පවතී. උදාහරණයක් හැටියට අර්තාපල්, ටර්නිප්, කැරට් සහා ගෝවා හි අද මිල, වසර හතළිකට පෙර තිබි මිලෙන් බාගයකින් අඩු වී ඇත. කපු හා වුලන් රෙදි මිල වගේම යකඩ වැඩ සහ ලී බඩු ද අද අඩුවට ගත හැකියි. දුප්පත් ශ්‍රමිකයන්ගේ ජීවිත යහපත් වී ඇති සාධකය අපි සාදරයෙන් පිළිගත යුත්තකි: වැඩිපුර ජනතාවක් දරිද්‍රතාවයෙන් ජීවත්වන රටක් ධනවත් සහ සතුටු දේශයක් යැයි කිව නොහැකියි. (සබන්, ලුණු, ඉටිපන්දම්, ගව හම් හා මත්පැන් මිල වැඩි වී ඇති බව සත්‍යයකි -ඒත් එය ප්‍රධාන වශයෙන් ඒවාට පැනවූ බදු නිසා හටගත් තත්වයකි. නමුත් මේවා සුඛෝපභෝගී භාණ්ඩ වෙන අතර බොහෝ වැඩකරන ජනතාවගේ අයවැය අතරේ නැත.)

> සාමාජිකයන් බහුතරය දුප්පත්කමෙන් සහ අසරණ භාවයෙන් පසුවෙද්දී කිසිම සමාජයක් සශ්‍රීකත්වය සහ සතුට කරා යෑම කිසිසේත්ම විය නොහැකියි.[17]

ශ්‍රමිකයන්ට සහ ඔවුන්ගේ පවුල් වල යහ-සාධනය සඳහා ඔබින වේතන ආවශ්‍යක වූවකි. නමුත් ඔබින වේතන ගෙවීම සේවායෝජකයන්ගේ යහපත පිණිස ද හේතු වේ. වේතන ඉහළ යද්දී, සේවකයන් වැඩියෙන් ආහාර ලබා ශක්තිමත් වෙති. එසේම ඔවුන් ද ඉතිරි කරන්නට හා ඔවුන්ගේ තත්වයන් දියුණු කරගන්නට හැකියාව ලබති. ඒ තුලින් ඔවුන් අනලස්ව වැඩ කරන්නට වැඩියෙන් නැඹුරු වෙති. ඉතින් සේවකයන්ට ප්‍රමාණවත් නිවාඩුවක් ලබාදෙන විට, ඔවුන් වැඩි නිරෝගී බවෙන් හා වැඩි ඵලදායිත්වයෙන් විය හැකියාව ද වැඩි වේ.

ප්‍රාග්ධනය සහ ලාබය

ශ්‍රමයට ලැබෙන වේතන වලටත් වඩා මැන බැලීමට දුෂ්කර වනුයේ සහ විචල්‍ය වනුයේ සේවායෝජකයන් විසින් ප්‍රාග්ධනයෙන් ලබාගන්නා ලාබයයි. එය රඳන්නේ වෙළඳපොල මිල ගණන් මතය. තරඟය සිද්ධ වෙන ආකාරය අනුව ය. නිෂ්පාදනය තුල හටගත හැකි අනේක ගැටළු, ප්‍රවාහනය සහ භාණ්ඩ කල් තබා ගැනීම ද ඊට බලපායි.[18] කෙසේ නමුදු, පොලී මට්ටම් ලාබය පිළිබඳ රළු දර්ශකයක් ඉදිරිපත් කරයි: මුදල් භාවිතයෙන් හොඳ ලාබයක් සොයන්නට ජනතාවට හැකියාව ඇත්නම්, ඔවුන් ණය සඳහා හොඳ ගෙවීමක් කරන්නට සූදානමින් සිටිති.

අපි දුටු අන්දමට, ප්‍රාග්ධනය වැඩිවීම බොහෝ ව්‍යාපාර බිහිවෙන්නට මග පාදන්නකි. ඒ නිසා එය වේතන ඉහළ යවන්නට ද සමත් වෙයි. නමුත් එය ලාබ අඩු කරන්නට ද සමත් වේ. ප්‍රාග්ධනය වැඩියෙන් සැපයෙද්දී, එහි අයිතිකරුවන් අතර තරඟය ද වැඩි වී, එයින් උත්පාදනය කරන ප්‍රතිලාබයේ මට්ටම අඩුවෙන් ඉල්ලන තැනට ඔවුන් පිවිස, එහි භාවිතයට ණය ගන්නා අය විසින් ගෙවන්නට ඉදිරිපත් වෙන පොලී මට්ටම් ද අඩු වී යයි.

---

[17] ජාතීන්ගේ ධනය, I පොත, VIII පරිච්ඡේදය, 96 පිටුව, 36 වගන්තිය.
[18] ජාතීන්ගේ ධනය, I පොත, IX පරිච්ඡේදය, 105 පිටුව, 3 වගන්තිය.

කෙසේ නමුදු, මෙහිද විශේෂ අවස්ථාවල දී දැකිය හැකි ව්‍යතිරේක ඇත. උදාහරණයක් හැටියට, උතුරු ඇමෙරිකාවේ සහ බටහිර කොදෙව් දූපත් වල, වේතන ඉහළ වෙති. එසේම පොලී මට්ටම් ද ඉහළ වෙති. එයින් කියා පාන්නේ ලාබය ද ඉහළ යැයි කියායි. හේතුව මේ දේශයන් හි බහුල වශයෙන් සාරවත් භූමි තිබුණ ද, ඒවා වගා කරන්නට තවමත් අවශ්‍ය පමණින් ජනතාව හෝ ප්‍රාග්ධනය හෝ නැතිවීමයි. ශ්‍රමිකයන් හා උපකරණ සඳහා දැඩි ඉල්ලුමක් ඇත. ඒ නිසා ඒවාට ඉහළ මිලක් ඉල්ලන්නට පුළුවනි. කොහොමටත් මීට දීර්ඝ කාලීන පැවැත්මක් නැත: යටත්විජිත වර්ධනය වෙද්දී, ඔවුන් තව තවත් වැවීමට දුෂ්කර වූ භූමිය ද නිෂ්පාදනය සඳහා යොදාගනු ලබයි, එවිට ලාබ ක්‍රමයෙන් පහළ බසියි.

තවත් විශේෂ අවස්ථාවක් විය හැක්කේ, රටක් එහි පස් හා තත්වයට නඩත්තු කරගත හැකි ප්‍රමාණයටම ධනවත් වී තව දුරටත් වර්ධනය විය නොහැකි නම් ය. සම්පූර්ණයෙන්ම ජනාවාස වී ඇති මෙහි දැඩි තරඟයක් පවතින්නට හැකි අතර වේතන අඩු විය හැකියි; ලාබ ද අඩු විය හැකියි. ඒත් කිසිම රටක් මේ මට්ටමේ ධනවත් බවකට තවම ළඟා වී නැත.

*වර්තමානයේ දී අපි ආර්ථික වර්ධනයේ සීමාවක් ඇතැයි නොදකිමු. අපේ ප්‍රාග්ධනය සහ තාක්ෂණය විවිධාකාර නව ව්‍යාපාර අංශයන්ට සහ සේවා නියුක්ති අවස්ථාවන්ට මාර්ගය පාදයි. එහෙත් ස්මිත් විසූ කාලයේ, ආර්ථිකයේ ප්‍රධාන වූයේ කෘෂිකර්මයයි. ඒ නිසා, භූමිය එහි සාරවත් බවට ඔබ්බෙන් යන ලෙසකට සරුසාර කිරීමට නොහැකියාව යැයි දකින නිසා එවිට ආර්ථික වර්ධනය සීමාවෙනවා යැයි ඔහු වැරදියට දකියි.*

වෙළඳපොල වේතන මට්ටම්

ඕනෑම තැනක දී, ශ්‍රමය හෝ ප්‍රාග්ධනය යොදා ගැනීම තුලින් එහි සියළු භාවිත වලින් ලැබෙන ශුද්ධ ප්‍රතිලාභ සම තත්වයකට පමුණුවයි. එය එසේ නොවේ නම්, ඉහළ වේතන තිබුනේ නම්, හෝ යම් විශේෂ ක්ෂේත්‍රයක වැඩි ලාබ ලබන්නට හැකියාව තිබුනේ නම්, එවිට සේවකයන් හා සේවායෝජකයන් එයට එක්රොක් වනු ලැබේ. එසේ එක්රොක් වීම නිසා වේතන සහ ලාබ නැවතත් සාමාන්‍යය කරා පහළ බහියි. නමුත්, සත්‍යයෙන්ම සිද්ධ වනුයේ, විවිධ ආකාරයෙන් යොදවන ශ්‍රමය හා විවිධ ක්ෂේත්‍ර අතර සාක්ෂාත් කරගත හැකි මුල්‍ය වාසි ඉතා පැහැදිලිවම එකිනෙකට වෙනස්ව පැවතීමයි. නමුත් සේවා නියුක්තියෙන් ලැබෙන වාසිය සම තත්වයකට පමුණුවනවා යැයි කියද්දී, සම්පූර්ණ මුල්‍යමය ප්‍රතිලාභ සමඟින් මුල්‍යමය-නොවන වැය සහ විවිධ කර්මාන්ත තුලින් ලැබෙන යහපත ගැන ද සලකා බැලිය යුතුයි. එයාකාර සාධක කිහිපයක් ඇත:

- පළමුවෙන්ම, සමහර වෘත්තීන් පහසු විය හැකියි, පිරිසිදු බැවින් යුතු විය හැකියි, අනෙක්වාට වඩා ගෞරවනීය විය හැකියි. රෙදි වියන්නෙක් ඇඳුම් මහන්නෙක්ට වඩා වැඩියෙන් උපයන්නේ ඔහු වැඩියෙන් වෙහෙසෙන නිසයි. යකඩ තලන්නා රෙදි වියන්නාට වැඩියෙන් මහන්සි වෙන අතර ඔහුගේ වැඩ අපිරිසිදු වාතාවරණයක දී සිද්ධ වේ. පතල්කරුවෙකු ඊටත් වඩා වැඩියෙන් ආදායමක් ලබන්නේ ඔහුගේ වෙහෙස අඳුරු, අපිරිසිදු සහ අවදානම් වෙන නිසයි. මස්කඩකාරයාට හොඳින් ගෙවනු ලබයි. ඒත් ඒ රස්සාව අතිශයින් දරුණු සහ අප්‍රසන්න වූවකි. අලුගෝසුවාගේ රස්සාව ද එයටත් වැඩියෙන් කර්කශ වූවකි.

- දෙවැනියට, සමහර වෘත්තීන් ඉගෙන ගැනීමට අධික වැයක් යන අතර දුෂ්කර ද වෙති. ඒවා ඉගෙන ගන්නට යන කාලය හා උත්සාහය පියවා ගන්නේ කරන වැඩ වලට ලබාගන්නා මිල ගණන් තුළිනි. ඒ අනුව, පුහුණු ශ්‍රමිකයෙකු නුපුහුණු ශ්‍රමිකයෙකුට වඩා හොඳ පඩියක් ලබයි.
- තෙවැනියට, සමහර රස්සා කාලානුචිත වෙති. ගොඩනැඟිලි හදන්නාට කටුක කාලගුණයේ දී හෝ පස් ගල් වී ඇති සීතල කාලයේ වැඩ කරන්නට නොහැකියි. අයහපත් කාලගුණයේ දී වැඩ අඩු බැවින් ඒ කාලයේ වියදම් සඳහා ද  හොඳ කාලගුණය පවතිද්දී ඇති පමණින් ආදායම් උපයා ගත යුතුවේ. සාමාන්‍ය බර කම්කරුවන් සතියකට සිලිම් හතරක් හෝ පහක් උපයා ගනිති. නමුත් මේ හේතුව නිසා, ගොඩනැඟිලි හදන අය වැඩ කරන්නට හැකි වාරිකයන් හි දී සතියකට සිලිම් හතක් අටක් උපයා ගනිති.
- හතරවැනියට, රන්කරුවන්, නීතීඥයන් සහ වෛද්‍යවරුන් වැනි විශාල වශයෙන් විශ්වාසනීය බවක් අවශ්‍ය වූ රැකියා සඳහා ලැබෙන ආදායම් ද වැඩියි. ඔවුන්ගේ අවංකත්වය සහ නිපුණත්වයට ඔවුන්ගේ පාරිභෝගිකයන් වෙතින්ම ඉහළම මිලක් ලැබේ.
- පස්වැනියට, ඕනෑම වෘත්තියක සාර්ථකත්වයට ළඟා වීමේ හැකියාව කොතරම්දැයි කියාත් එයට ලැබෙන ආදායමෙන් නිරූපනය වේ. නීතීඥයන්ට වැඩියෙන් ගෙවන්නේ නීතිය හදාරන්නට යන අයගෙන් බොහොම ස්වල්පයක් එහි සාර්ථකත්වයක් අත්පත් කරගන්නා නිසයි. ඔවුන්ගේ පාරිභෝගිකයන් ගෙවනුයේ එම වෘත්තියට සාර්ථක වූවන් මෙන්ම එයට උත්සාහ ගෙන අසාර්ථක වූවන්ගේ ද වැයයි. නළුවන්, ගායකයන්, රංගන ශිල්පීන් යනාදීන්ට ද ලැබෙන සීමාතික්‍රාන්ත ප්‍රතිලාභ මෙය පමණක් නොව, ඔවුන්ගේ කුසලතා කොතරම් දුර්ලභ හා සුන්දර දැයි යන්නත් - එමෙන්ම එවැනි රැකියාවන්ට ඔවුන් යොදවා ගැනීමේ දී අත්විඳින අපකීර්තියන් පවා, ඔවුන් ලබන ආදායමෙන් නිරූපනය වෙයි.

වෙනත් විශේෂ අවස්ථා තුළින් වේතන හා ලාබ මට්ටම් වල වෙනසක් සිදු කළ හැකියි. උදාහරණ හැටියට:

- පළමුවෙන්ම, ව්‍යාපාරය කොතරම් ස්ථාවරදැයි මත එය රඳා පවතියි. පවතින ව්‍යාපාර වලින් අලුත් ඒවාට සේවකයන් බඳවා ගන්නට නම් ව්‍යවසායකයන්ට වැඩියෙන් වේතන ගෙවන්නට සිද්ධ වේ. නව ව්‍යාපාරයක සේවය කිරීමේ දී ලැබෙන ආරක්ෂාව අඩු යැයි පෙනීමට ඉඩ ඇත. නැත්නම් එය නව රැල්ලක් මත පදනම් වූ අස්ථිර තත්වයකින් යුතු ලෙසට පෙනීමට ඉඩ ඇත.
- දෙවැනියට, ඉල්ලුම හා සැපයුමේ විශේෂ වෙනසක් සිද්ධ වෙන්නට පුළුවන. නිදසුන් වශයෙන්, යුද සමයක දී වෙළඳ නාවිකයන්ගේ සිලිම් විසිඑකක සිට විසිහතක් පමණ ඇති මාසික වේතනය සිලිම් හතළික සිට හැටක් දක්වා ඉහළ යයි. සමහර වර්ෂ වල දී ඉරිඟු, වයින්, බාර්ලි, සීනි, දුම්කොළ හා අනෙකුත් වගාවන්ගේ අස්වනු ඉතා දැඩි ලෙසින් අඩු වැඩි විය හැකියි. ඒවායේ ගණුදෙනුකරුවන්ගේ ලාබයන් ද ආවශ්‍යක ලෙසින්ම වෙනස් වෙති.
- තෙවැනියට, එක රස්සාවකට වඩා වැඩියෙන් තිබෙන විට ද වේතනය වෙනස් වීමට පුළුවන: ස්කොට්ලන්තයේ ගැමි නිවැසියන්ට ඔවුන් ඉඳහිට ගොවියාට සපයන සේවය සඳහා අක්කරයක් දෙකක භූමියක් සහ සතියකට ඕට්මීල් (බුසලෙන් හතරෙන් පංගුවක්) ද සාමාන්‍යයෙන් ලැබේ. මෙය ඔවුන් සිය වේතනය හැටියට සලකති. ඔවුන්ට ඉඩකඩ ඇති ආකාරය අනුව අනෙක් අයට ඉතා සුළු මුදලකට සේවය කරන්නට ද ඔවුන් කැමති වෙති.

වේතන හා දේශපාලනය

වේතන සහ ලාබ අතර වෙනස්කම් තිබීමට හේතුව විවිධ රැකියාවන්ගේ ආර්ථික ස්වභාවය පමණක්ම බලපාන්නේ නැත. දේශපාලන සාධක ද ඉතා දැඩි ලෙසින් බලපෑම් කරන්නට හැකියි.

පළමුව, සමහර වෘත්තීන්ට ප්‍රවේශ විය නොහැකි ලෙසින් සීමා කරන රෙගුලාසි පවතී. යම් වෘත්තියක යෙදෙන සංඛ්‍යාව අඩු කරන්නට හැකියාව ලැබෙද්දී ඔවුන්ගේ සේවයට අය කරන ගාස්තු ද වැඩි කරගන්නට හැකියි. තවත් වෘත්තීන් මෙයින් වාසි ලබාගෙන ඇත්තේ ආධුනික පුහුණුව ලැබීම නියාමන කරන විවිධ රීති ප්‍රවර්ධනයෙනි. ෂෙෆීල්ඩ් හි පිහි තනන ප්‍රවීණයන්ට එක් අවස්ථාවක දී එක් ආධුනික පුහුණුව ලබන තනතුරක පමණක් අයෙක් තබාගැනීමට හැකිවන සේ අතුරු-නීති වලින් තහනම් වැටී ඇති අතර නොර්ෆෝක් රෙදි වියන අයට, ඉංග්‍රීසි තොප්පි හදන අයට සහ ලන්ඩනයේ සිල්ක් රෙදි වියන අයට, එක අවස්ථාවක දී දෙන්නෙකුට වඩා සේවයේ තබාගත නොහැකියි. වෘත්තියට පිවිසීම සඳහා පුහුණුව ලබාදෙන මෙම ආධුනික සේවා කාලය ද ඉතා දීර්ඝ වේ. සාමාන්‍යයෙන් වසර හතකි.  බාල වැඩ වලින් මහජනතාව ආරක්ෂා කරගැනීම සඳහා යැයි කියැවුන ද ඒත් එවැන්නක් සිද්ධ නොවේ. එයින් කරනුයේ ආධුනික පුහුණුව ලබන අයගේ සංඛ්‍යාව සීමා කිරීමයි. එයින් ඒ වෘත්තීන් හි වේතන ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම සිද්ධ වේ. අවාසනාවට, නිෂ්පාදකයාගේ වාසියට මේ තත්වය හදාගෙන ඇත්තේ මහජනතාව ලවා වැඩියෙන් ගෙවාගන්නා බලාත්කාරය යෙදවීමෙනි. එසේම තමන්ගේ පාරිශුද්ධ ශ්‍රමයේ අයිතිය තමන් කැමති පරිද්දෙන් භාවිතයට අයිතියක් අනෙක් අයට නොදීමෙනි.

ශිල්ප ශ්‍රේණි වෘත්තීන් ඔවුන්ගේ වෙළඳපොල පුළුල් කරගනිමින් තරඟය සීමා කරගැනීමට උත්සාහ කිරීම සහ එමගින් පොදු මහජන කැමැත්තට වඩා ඔවුන්ගේ කැමැත්ත ප්‍රවර්ධනය කිරීම හැම අතින්ම ස්වභාවික වූවකි.  අවාසනාවට, මෙහි දී ඔවුන්ට සහාය වී ඇත්තේ නීතියයි. නීතියෙන් ඔවුන්ට විශේෂ වරප්‍රසාද හිමි වී තිබේ. උදාහරණයක් හැටියට වෘත්තීය සාමාජිකයන්ගේ මහජන ලැයිස්තුවක් පිහිටුවා ගැනීම යනාදියෙන් ඔවුනට (විශේෂයෙන්ම ඔවුන්ගේ මිල ගණන් ඉහළ දමා වෙළඳපොල තව දුරටත් සීමා කිරීම ගැන කතා කරන්නට) පහසුවෙන් හවුල් හදාගන්නට මාර්ගය පාදා ඇත. ඔවුන්ගේ සාමාජිකයන්ගේ යහපත වෙනුවෙන් අනිවාර්ය සුබසාධන අරමුදල් පිහිටුවා ගැනීමට නීතියෙන් ඉඩ ලැබී ඇති විට දී ඔවුන් එකතු වී හවුල් හදා ගැනීම අනවරතයෙන්ම සිද්ධ වේ. බහුතර චන්දයෙන් ප්‍රතිපත්ති තීරණ ගැනීමට වෘත්තීන්ට අවසර දීම තුලින්, වෙනත් ස්වේච්ඡාවෙන් සිද්ධ වෙන කිසිදු දුස්සන්ධානයකට වඩා වැඩි කාර්යක්ෂම ලෙසින් හා කල් පවතින ලෙසින්, තරඟය සීමා කරවයි.[19]

> එකම වෘත්තියක නියැළෙන ජනතාව එකිනෙකා හමුවීම, වෙනසක් හෝ සතුටුවීම සඳහා වුවත්, කලාතුරකින් සිද්ධ වෙන්නකි. එනමුත් එවැනි සෑම අවස්ථාවක දී ම, එය අවසන් වෙන්නේ යම් ආකාරයකින් මිල ඉහළ යවන්නට ගන්නා උප්පරවැට්ටියකින් යුතු මහජනයාට එරෙහි කුමන්ත්‍රණයකිනි.[20]

ව්‍යාපාරයක් සඳහා වූ එකම සත්‍යය කාර්යක්ෂම වූ ශික්ෂණය නම් පාරිභෝගිකයන් අහිමි වෙනවා යන බියයි.[21] පාරිභෝගිකයා ස්වෛරී වූ තරඟකාරී වෙළඳපොල යනු වෙනත් කිසිම නිල රීති සංඛ්‍යාවකට

[19]ජාතීන්ගේ ධනය, I පොත, X පරිච්ඡේදය, II ඛන්ඩය, 145 පිටුව, 30 වගන්තිය.
[20]ජාතීන්ගේ ධනය, I පොත, X පරිච්ඡේදය, II ඛන්ඩය, 145 පිටුව, 30 වගන්තිය
[21]ජාතීන්ගේ ධනය, I පොත, X පරිච්ඡේදය, II ඛන්ඩය, 146 පිටුව, 31 වගන්තිය.

වැඩියෙන් ඔවුන්ගේ හැදියාව නියාමනය කරන සහතික ක්‍රමයයි. නිල වශයෙන් ගෙනෙන රීති බොහෝ විට එය අරමුණු කරන ප්‍රතිඵලයේ විරුද්ධ පැත්තේ ඵල දරති.

දෙවනුව, ප්‍රවේශය සඳහා පමණට වඩා වැඩියෙන් දිරිගන්වන මහජන ප්‍රතිපත්තියක් නිසා සමහර විට වෘත්තියක ආදායම් පහතට යැවෙයි. රජයේ විශ්‍රාම වැටුප්, ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර යනාදිය මේ ඵලය පෙන්විය හැකියි.

තෙවනුව, වෘත්තියෙන් වෘත්තියට සහ පළාතෙන් පළාතට ශ්‍රමය සහ ප්‍රාග්ධනය සංසරණය වීම නීතියෙන් සීමා කරයි. උදාහරණයක් හැටියට, කපු රෙදි විවීම, සිල්ක් හා වූල් කලාවන් එතරම් වෙනස්කම් වලින් යුතු නැත. මෙම කර්මාන්ත වලින් එකක් දුෂ්කර කාලයකට මුහුණ දෙනවා නම්, එහි සාමාජිකයන් ඉතා ඉක්මණින් යළි පුහුණු වී අනෙකකට මාරු වෙති. නමුත් අනෙකුත් වෘත්තීන්, ආධුනික පුහුණු වැනි නීතිමය බලයෙන් මේ ශ්‍රමිකයන්ට ඉඩ නොදෙන්නට තමනට ආරක්ෂාව ලබාගෙන ඇත. එයාකාරයෙන්ම දුප්පත් නීති, ඔවුන්ගේම දුප්පතුන්ගේ වගකීම හා ආධාර සැපයීමට මීසම් පත්කර තිබීමෙන්, ඔවුන් අලුත් රස්සා සොයාගෙන යන්නට කැමති වුවත්, දුප්පතුන්ට වෙනත් පළාත් වලට මාරු වෙන්නට ඉඩ නොදෙන මීසම් බිහිකර ඇත.

ඉඩම් හා කුලිය

නිෂ්පාදනයේ තෙවැනි සාධකය ඉඩම් වෙති, ජාතික නිෂ්පාදිතයට එයින් ලැබෙන සහභාගීත්වය වෙනුවෙන් ගෙවන්නේ කුලියයි.[22] කුලිය, වේතන සහ ප්‍රාග්ධනයෙන් වෙනස්. වේතන වලට වෙහෙසිය යුතුයි. ප්‍රාග්ධනයට ලැබෙන ලාබය ප්‍රවේසමෙන් එකතු කරගන්නට සහ පරිපාලනයට ද වෙහෙසිය යුතුයි. ඉඩම් කුලිය ලැබෙන්නේ හුදු අයිතිය ඇති පමණින්. ඉඩම් හිමියා එය බලාකියාගන්නා උත්සාහයට නෙමේ. සැබැවින්ම, දියුණු නොකරන ලද භූමියකට වුවද කුලියක් අය කෙරේ. කෙල්ප් මුහුදු ජලජ පැලෑටි ස්වභාවයෙන්ම ගොඩට වැදෙන මුහුදු වෙරළබඩ ඉඩම් අයිති ස්කොට්ලන්ත ඉඩම් හිමියින් ඒ ප්‍රයෝජනවත් කෙල්ප් අස්වනු නෙළා ගන්නා අයගෙන් කුලී අය කරති. ඔවුන් එසේ කරන්නේ ඔවුන්ගේ තිරිඟු වගාබිම් වලට කුලියක් අයකරන ආකාරයෙන්මයි.

*ඉඩම් හිමියන් ගැන ඔහුගේ සංවාදයේ, ස්මිත් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ ස්කොට්ලන්තයේ විශාල භූමි කොටස්වල ආධිපත්‍යය පවත්වාගෙන ගිය ගෝත්‍රික නායකයන් සහ රදළයන් ගැනයි. ඒවා බොහොමයට වැටවල් බැඳී තිබුණි. එසේම රජයට පවරාගත් ජැකෝබියන් වතුයායන් අලුත් අයිතිකරුවන්ට බෙදා දෙන ලදී. සමහර විට ස්මිත් ඉඩම් හිමියන්ව “ඔවුන් වගා නොකළ අස්වැන්නක් නෙළා ගන්නට ඇල්ම ඇති” ධනලෝභී පංතියක් හැටියට අවඥාවෙන් දක්වන්නේ මේ නිසා විය හැකියි.*

ඉඩම් හිමියන් තමනට හැකි පමණින් කුලිය අරගනිති; වේතන හෝ ලාබ ඉහළ නම්, කුලිය ද අනිවාර්යෙන්ම ඉහළ යයි. ඔවුන්ගේ වාසනාවට, ඒවායේ සේවය කරන අයගේ ප්‍රයෝජනයට වඩා වැඩියෙන් ආහාර නිෂ්පාදනය කරන්නට ඕනෑම භූමියකට හැකියි. නෝර්වේ සහ ස්කොට්ලන්තයේ පිහිටන පාළු මහදෙණි පවා ගවයන්ට තණබිම් වෙති. ඒවායේ වැඩ කරන්නට අවශ්‍ය සුළු පිරිසකගේ උවමනාවටත් වඩා ප්‍රමාණයකින් කිරි හා මස් සපයනු ලබයි. වෙනත් විදියකින් කියතොත්, ඉඩම් හැම විටම යම් අතිරික්තයක්

[22]ජාතීන්ගේ ධනය, XI පරිච්ඡේදය.

නිෂ්පාදනය කරමින් ඉඩම් හිමියාට කුලියක් ලබා දෙයි. ඉතා සරු ඉඩම්, නැත්නම් (උදාහරණ හැටියට නගරයකට සහ එහි වෙළඳපොලට ආසන්න) නිසි පිහිටීමෙන් යුතු ඉඩම්, ඊටත් වඩා ඉහළ කුලියක් ලබා දෙයි.

ආහාර මෙන්ම, වස්ත්‍ර සහ ජීවත්වීම සඳහා ඉඩකඩ ද ඉඩම් වලින් සැපයේ. නැවත වතාවක්, ඉඩම් වලින් සැමවිටම වස්ත්‍ර අතිරික්තයක් සැපයේ. නිදසුන් වශයෙන් සත්ව හම් පෙන්වා දිය හැකියි. උතුරු ඇමෙරිකාවේ ස්වදේශීන්ට සමහර විට සත්ව හම් වලින් නිමකළ ඇතිරිලි කිසිත් අගයක් නැතැයි කියා විසිකරන්නට තරම් පමණින් තිබෙන්නට ඇත. ඒ යුරෝපීයයන් එහි යන්නට පෙර. බ්ලැන්කෙට්ටු, තුවක්කු සහ බ්‍රැන්ඩි වලට දැඩි කැමැත්තෙන් හුවමාරු කරන්නට පෙර.

වඩා හොඳ ප්‍රමිතියකින් තිබිය හැකි වුව ද, ධනවත් පවුලක් දුප්පත් පවුලකට වඩා වැඩියෙන් ආහාර පරිභෝජනය නොකරයි. ඒත්, කුලියට ඉන්නා අයගෙන් කුලී වශයෙන් ගැනීමෙන් හෝ තමන්ම වගා කරගැනීමෙන්, ඉඩම් හිමියන් තමන් අනුභව කරන ආහාර වලට වඩා ආහාර තම අණසක යටතේ පවත්වා ගනිති. එසේම ඔවුන්ට වස්ත්‍ර, නිවාස සහ පිටතට පෙන්වන උපකරණ සඳහා ද නොනිමෙන ආශාවක් ඇත. වැරහිලි ඇඳගත් දුප්පතුන්ගේ අගුපිල් සමඟ මේ විසල් ඇඳුම් කට්ටල් ඇති සුවිසල් මන්දිර සසඳා බලන්න.

මෙයාකාර සුඛෝපභෝගීත්වයේ අතිරික්තය හුවමාරු කරගන්නට ධනවතුන් සෑම විටම කැමැත්තෙන් ඉදිරිපත් වෙති. තමන්ගේ මූලික අවශ්‍යතා ලබාගැනීම සඳහා ඔවුන්ගේ ඉල්ලුම හුවමාරුවෙන් සපයන්නට දුප්පතුන් එයාකාරයෙන්ම කැමැත්තෙන් ඉදිරිපත් වෙති. දුප්පතුන් විශේෂ ප්‍රාගුණ්‍යයේ සහ තරඟයේ යෙදෙනුයේ ධනවතුන්ට සපයන්නටයි. එයින් නිෂ්පාදනය කාර්යක්ෂම වීමටත්, අදායම් ඉහළ යාමටත් තල්ලුවක් ලැබේ. ගොඩනැගිලි, වස්ත්‍ර, ගෘහ භාණ්ඩ, ඉන්ධන, ලෝහ, මුතු මැණික් යනාදී -ඉඩම් වලට නිෂ්පාදනය කළ හැකි සියළු පහසුකම් නිර්මාණයට ඇති ඉල්ලුම එහි දී වැඩිවී යයි. නමුත් තව දුරටත් ඉඩම් හිමියන් ඔවුන්ගේ කොටස අරගනිති. මන්ද, ඒ සියළු ගොවිපොළවල්, කැලෑ සහ පතල් ඔවුන්ට කුලියක් නිෂ්පාදනය කරන නිසයි.

*ඔහුගේ සිද්ධාන්තයට අනුව දේශයක සෑම නිෂ්පාදන අංශයක් තුලින්ම කුලිය, වේතන සහ ලාබය නිරූපනය වේ. ස්මිත් පෙන්වනුයේ ආර්ථිකයක මේ විවිධ වූ ක්‍රියාකරුවන් සියල්ලන්ම -ඉඩම් හිමියන්, ශ්‍රමිකයන් සහ සේවායෝජකයන්- අනිවාර්යෙන්ම එකිනෙකා මත රඳා පවතින්නන් බවයි. සැබැවින්ම, ඔවුන්ගේ අන්‍යෝන්‍ය පැවැත්ම නිෂ්පාදනය ඉක්මවා යන්නකි: භාණ්ඩ නිපැදවෙන්නේ හුවමාරුව සඳහා බැවින්, එම නිෂ්පාදනයේ අගය කිරීම සහ බෙදාහැරීම සඳහා ඔවුන් වැදගත් ලෙසින් නියැළී සිටිති. තවත් විදියකින් කිවහොත්, භාණ්ඩ නිර්මාණය වන, අගැයුමට ලක්වෙන, හුවමාරු වෙන, භාවිතා වෙන සහ නැවත අලුත් කරන අඛණ්ඩව ගලායන ක්‍රියාවලියක ඔවුන් කොටස්කාරයන් වෙති. ක්‍රියාකාරී ආර්ථික ක්‍රමයක ඒ සියල්ල සිද්ධ වෙන්නේ ඕපපාතිකව ය. අද අපි වෙළඳපොල ආර්ථිකය යනුවෙන් නූතන අවබෝධයෙන් යුතු වනුයේ ප්‍රධාන වශයෙන් මේ වැටහීමටයි. එය අවබෝධය එවක දී දැවැන්ත වූ න්‍යායවාදී නවෝත්පාදනයකි.*

*කෙසේ වෙතත්, සමහර ආර්ථික නියෝජිතයන් අනිකුත් අයව තම වාසියට හරවා ගැනීමට උත්සාහ කිරීම මේ අන්‍යෝන්‍ය රඳා පැවැත්ම විසින් වළක්වන්නේ නැත. ස්මිත් එය පහදා දෙන්නට මෙහි දී පටන් ගනියි.*

විවිධ සාධකයන්ගේ ස්වාර්ථකාමය

අපි දුටු අන්දමට විශේෂ පිරිසකගේ අයිතීන් ප්‍රවර්ධනය කරන්නට මෙන්ම ඒවාට හානි පමුණුවන්නට ද නීති සහ රෙගුලාසි වලට හැකියි. එසේම සැබැවින්ම මහජනතාට ද එසේ හානි ගෙනෙන්නට ඒවාට හැකියි. එහි දී වැඩියෙන්ම වාසි ලබන්නේ ප්‍රාග්ධනය යොදාගන්නා උදවියයි. එවැනි මෙහෙයුම්වල ඵලවිපාක අවබෝධ කරගැනීමට ඉඩම් හිමියන් අසමත් වෙති: ශාරීරික හෝ මානසික උත්සාහය යෙදවීම වෙනුවට අයිතිය පමණින් ආදායම් උපයාගන්නට හැකිවෙද්දී, අලස ලෙසින් දිවිගෙවන්නට හුරුවෙන ඔවුන් එවැනි දේවල් ගැන හිතා නොබලන මුග්ධතාවයෙන් යුතු වෙති.

වේතන වලින් ජීවිතය ගෙවන අය ගැන සලකද්දී, සමාජයේ පොදු සුභ සිද්ධිය ඉතා වැදගත්ය. ව්‍යාපාර පිරිහෙද්දී ඉතාමත් කටුක ලෙසින් දුක්විඳින්නේ ශ්‍රමිකයන් ය. සමාජයක් සමෘද්ධිමත් වෙද්දී ඔවුන්ගේ ජීවිත ද යහපත් වෙති. නමුත් දුර්වල අධ්‍යාපනයේ ප්‍රතිඵලයක් ලෙසින් සහ ඔවුන්ට තොරතුරු ලබාගැනීමට හැකියාවක් නැති නිසා, සමාජයේ යහපත කුමන ආකාරයෙන් බලපාන්නේ දැයි කියා වටහා ගැනීමේ හැකියාවක් ඔවුන්ට නැත. ජීවිතය ගැට ගසා ගන්නට වෙහෙසෙන ඔවුන්ට මහජන ප්‍රතිපත්ති ගැන හිතන්නට කාලයක් හෝ ජවයක් ඉතිරි නැත. එසේම සාමාන්‍ය ජනතාවගේ හඬ මහජන විවාද තුලින් හැම අත පැතිර යන්නේ ද නැත.

කෙසේ නමුදු, ප්‍රාග්ධනයෙන් ආදයම් උපයන අය, ඊට පැහැදිලිවම වෙනස් අයයි. ඔවුන්ගේ යහපත වෙනත් ජනතාවගේ යහපත සමඟ සම්පාත නොවේ. මන්ද, ඔවුන්ගේ ලාබ උකහා ගැනෙන්නේ ආර්ථිකයක් සරුසාර වෙද්දී ය. ඔවුන්ගේ යහපත වෙළඳපොල පුළුල් කිරීමත් සහ තරඟය පටු කිරීමත් මත රඳා පවතින්නකි. මේ ඉලක්කය වෙත යන්නට ඔවුන් කුසලතාවය දක්වති. සැලසුම් කිරීම සහ පරිපාලනය ඔවුන්ගේ ව්‍යාපාර සඳහා මූලික වශයෙන් බලපාන බැවින්, ඔවුන්ට ඒ දැනුම සමඟ, සම්බන්ධතා පැවැත්වීම ගැනත් සහ ඔවුන්ට වාසිවෙන කරුණු මොනවාදැයි දැන ඒවා ප්‍රවර්ධනය කරන මානසික ඉසියුම් බව ද පිහිටයි.

නමුත් මේ පෞද්ගලික යහපත එන්නේ මහජනයා පරදුවට තබමිනි. වෙළඳපොල විකෘති කිරීමෙන් සහ තරඟය අඩු කිරීමෙන් දුක්විඳින්නේ මහජනතාවයි. ඒ නිසා, ප්‍රාග්ධන අයිතිකරුවන් නව රෙගුලාසියක් යෝජනා කරද්දී, ඒ ගැන දැඩි පිරික්සා බැලීමක් සිදු කළ යුතුයි. එය එන්නේ මහජනයාගේ යහපත හා සම්පාත නොවන පිරිසකගෙනි, එසේම මහජනතාව රවටා වාසි ලබාගන්නට හැකි පිරිසකගෙනි.

> මේ අයගෙන් එන නව වානිජ නීති සහ රෙගුලාසි යෝජනා වලට හැම විටම ඉතා සූපරීක්ෂාකාරී ලෙසින් ඇහුම්කන් දිය යුතුයි. සියුම් කරුණු කෙරෙහි දක්වන දැඩි විමසිල්ලෙන් පමණක් නොව වැඩි සැකයකින් යුතු අවධානයක් දෙමින් ද, දීර්ඝ වශයෙන් සහ ප්‍රවේසම් සහිතව විභාග කර බලන්නේ නැතිව ඒවා පිළිගැනීම කිසිවිටෙක කළ නොයුතුයි. එය එන්නේ මිනිසුන් කොට්ඨාශයක් වෙතින්, මහජනතාව හා එකසේ සම්පාත නොවූ ආශාවන් ඇති අය වෙතින්. එමෙන්ම ඔවුන් බොහෝ අවස්ථාවල දී, මහජනතාව රවටා සහ ඔවුන්ව පීඩනයට පත් කරන ලද්දවුන් ය.[23]

[23]ජාතීන්ගේ ධනය, I පොත, XI පරිච්ඡේදය, පරිච්ඡේදයේ සමාප්තිය, 267 පිටුව, 10 වගන්තිය.

## II පොත: ප්‍රාග්ධන සමුච්චය

ප්‍රගත ආර්ථිකයක, අපේ අවශ්‍යතාවයන් බහුතරය පිරිමැහෙන්නේ අපි විසින්ම හදා ගන්නා දැයින් නොවේ. අප විසින් ස්වේච්ඡාවෙන් අනෙකුත් අය කරන හුවමාරු වලිනි. නමුත් මෙයින් අදහස් කරන්නේ අපිට නිෂ්පාදනය කරන්නට සිද්ධ වෙන බවයි, එසේම අපට අවශ්‍ය භාණ්ඩ ලබාගැනීම සඳහා අපේ අතිරික්තය අපිට විකුණන්නට සිද්ධ වෙන බවයි. නිදසුන් වශයෙන්, ඔවුන්ගේ රෙදි වියන රාමු මිල දී ගැනීමට හෝ කුලියට ගැනීමට රෙදි වියන්නන්ට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් අවශ්‍ය වේ. අනතුරුව රෙදි වියා අවසන් වෙනතුරු, එය වෙළඳපොලට ප්‍රවාහනය කර එහි දී විකිණෙන තුරු, ජීවත්වෙන්නට මුදලක් ද තිබිය යුතුයි.

ප්‍රාග්ධනය එකතු කර තිබිය යුතුයි. වෙනත් වචන වලින් කියනවා නම්, විශේෂ ප්‍රාගුණ්‍යයෙන් යුතු වෙළඳාම් වලට පිවිසෙන්නට කලින් ජනතාව ඵලදායිත්වයෙන් ලැබෙන විශාල වාසි අත්පත් කරගෙන තිබිය යුතුයි. ආර්ථිකයක විශේෂ ප්‍රාගුණ්‍යය වැඩියෙන් පවතිද්දී, එය පවත්වාගෙන යෑමට වැඩි ප්‍රාග්ධනයක් ද අවශ්‍ය වේ. මෙයාකාරයෙන් ප්‍රාග්ධනය එකතු කිරීම ආර්ථික වර්ධනයට පොහොර සපයයි. එය සද්ගුණවත් චක්‍රයකි: ප්‍රාග්ධනයේ වර්ධනය විශේෂ ප්‍රාගුණ්‍යය ප්‍රවර්ධනය කරයි, එයින් වැඩි වැඩියෙන් විශාල අතිරික්ත නිර්මාණය කරයි, ඒවා අනතුරුව නව උපකරණ වලට යළි ආයෝජනය කරමින් තව දුරටත් වැඩිවෙන විශේෂ ප්‍රාගුණ්‍යයට සහ දියුණුවට යන හැකියාව ලැබේ.[24]

ප්‍රාග්ධනයේ අංග

ප්‍රාග්ධනයේ අංග දෙකකි. එක අංගයකින් බලාපොරොත්තු වනුයේ අනාගත ආදායම නිෂ්පාදනයයි. මෙය අයිතිකරුවා සතුව පවතින ස්ථාවර ප්‍රාග්ධනය විය හැකියි, නැත්නම් අයිතිකරුවා සතුව නැති සංසරණ ප්‍රාග්ධනය විය හැකියි. අනෙක් අංගය කරනුයේ අනන්තර පරිභෝජනය සැපයීමයි: මීට අඩංගු වනුයේ පරිභෝජනය සඳහා වෙන් කරන ලද භාණ්ඩ තොග, ඕනෑම ආකාරයකින් ලැබෙන අය භාරය, සහ එතෙක් සම්පූර්ණයෙන් පරිභෝජනය නොකරන ලද වස්ත්‍ර හෝ ගෘහ භාණ්ඩ වැනි භාණ්ඩ තොග වෙති.

*'කොටස්' යන්න 'ප්‍රාග්ධනය' සහ අනෙකුත් 'කොටස්' යනුවෙන් බෙදී ඇති බවයි ස්මිත් පැහැදිලිවම කියන්නේ. එහි නූතන පද වහර ගෙනහැර පෑම පහසු නැත; 'ප්‍රාග්ධනය' යන්න ඊට සුදුසුම වූ සාමාන්‍ය වචනය යැයි පෙනේ. එසේම, ස්මිත්ගේ නිර්වචනයට අය භාරය ද ඇතුළු වේ. එය නූතන අර්ථ ශාස්ත්‍රඥයන් නොකරන්නකි. එනමුත්, අතේ ඇති සල්ලි මුදල්, සිදුවෙමින් පවතින කාර්යයන්, සහ ස්ථාවර සහ චංචල වත්කම් අද ප්‍රාග්ධනය හැටියට සැලකේ.*

මුදල්

පුද්ගලයෙකුගේ ආදායම අපි පොදුවේ මුදල් වලින් ප්‍රකාශ කළ ද, රන් හෝ රිදී කාසි කිසියම් ප්‍රමාණයක් සඳහන් කරමින් පෙන්නුම් කළ ද, මුදල් යනු නෛසර්ගික අගයක් නැති වූවකි.[25] මුදල් යනු හුවමාරුවේ මෙවලමක් පමණි. එය, ජාතියක නිෂ්පාදන වෙළඳපොලට යවාගන්නට උදව්කරන අධිවේගයක් පමණි. එය

---

[24] ජාතීන්ගේ ධනය, II පොත, හැඳින්වීම, 276-7 පිටු, 2-4 වගන්තිය.

[25] ජාතීන්ගේ ධනය, II පොත, II පරිච්ඡේදය.

තුලින් කිසිවක් නිෂ්පාදනය නොවේ. සැබෑ ධනය රඳන්නේ මුදල් දී භාණ්ඩ මිල දී ගත හැකියාව හෙවත් ක්‍රය ශක්තිය තුලයි. ගණුදෙනු කරන කාසි තුල නොවේ.

සැබැවින්ම, ධනය හා මුදල් යනු එකිනෙකින් පරිබාහිරව පවතින දෙකක් යැයි ඉතා පහසුවෙන් පෙන්වා දිය හැකියි. එක ගිනියක් ආදායම හැටියට අද ලබාගන්නා පුද්ගලයෙක්, එම ගිනිය හෙට වියදම් කරනවා විය හැකියි. එයින් දෙවැන්නෙකුට ආදායමක් ලැබෙයි; ඒ පුද්ගලයා එම ගිනිය ඊ ළඟ දිනයේ වියදම් කරනු ඇත, එයින් තෙවැන්නෙකුට ආදායමක් ලැබෙයි. ඉතින් සංසරණයේ පවතින මුදල් ප්‍රමාණය ජාතියේ සම්පූර්ණ ආදායමට වඩා පැහැදිලිවම අඩුවෙන් පවතින්නකි. ජාතික ආදායම යනු මිල දී ගන්නා සහ විකුණන භාණ්ඩ ප්‍රමාණය මිසෙක නිෂ්පාදන හුවමාරුව පිණිස යොදාගන්නා ලෝහ කැලි නොවේ.

*මෙහි දී ස්මිත් නැවතත් පහර දෙන්නේ මුදල් පමණක් ධනය ලෙස සැලකූ ආර්ථික න්‍යායවාදීන්ට හෙවත් මර්කන්ටයිල් අදහස් දැරූ අයටයි. ඔහු උත්සාහ කරන්නේ මුදල් යනු ධනය යැයි අල්ලාගත් මිථ්‍යාව තුරන් කරන්නටයි. වෙළඳාම ජවයෙන් කෙරෙද්දී හා නිදහස් වෙද්දී ජාතීන්ගේ ධනය ඇත්තෙන්ම වැඩි වෙතත්, වෙළඳාම මර්ධනයෙන් මුදල් පිටතට යෑම සීමා කරන ජාතීන් අතින් වැරදි ප්‍රතිපත්ති හැදෙන හේතුව මේ මිථ්‍යාව පිළිගැනීම නිසා යැයි ඔහු විශ්වාස කළේය.*

එසේ වුවද, මුදල් තුලින් යම් වැදගත් ඵලවිපාක ලැබේ. එයින් ප්‍රාග්ධනය ක්‍රියාකාරී සහ ඵලදායී කරවයි. ඉදහිට අවශ්‍ය වෙද්දී ගැනීමට සල්ලි මුදල් පැත්තකට කර තැබීමට ගණුදෙනු කරන අයට සිද්ධ වෙද්දී, එය නිශ්චල ප්‍රාග්ධනයක් වේ. එයින් කිසිවක් උත්පාදනය නොවේ. නමුත් කාර්යක්ෂම බැංකු ක්‍රමයෙන් එය ඉක්මණින් සහ දැඩි උනන්දුවකින් වැඩකරන්නට ඉඩ පාදා ගත හැකියි. රන් සහ රිදී වෙනුවට කඩදාසි බැංකු නෝට්ටු යොදා ගනිද්දී බැංකු වලට මේ නිශ්චල ප්‍රාග්ධනයට යළි පණක් ලබා දී කලින් තිබුණාට වඩා පහසුවෙන් භාවිතයට ගත හැකියි. එයින් වානිජ්‍ය අධිවේගයේ ගමන් වේගය වැඩි කරමින් රටේ කර්මාන්ත ඵලදායිත්වය වැඩිකරත හැකියි.

ඔවුන් සතු රන් රිදී සංචිත වලට වඩා වැඩියෙන් එහාට යමින් නෝට්ටු පමණට වැඩියෙන් නිකුත් කරන ප්‍රලෝභයක් බැංකු අතර තිබෙන්නට හැකියි. කුඩා ඒකක නෝට්ටු නිකුත් කරන්නට අවසර නොදීමෙන් මේ අවදානම අඩු කරගන්නට පුළුවන. එයින් හැම අත පැතිරෙන හානියක් ඇති කරන බැංකු වකිතයක් හටගැනීම සීමා කරගන්නට හැකියාව ලැබේ. එයින් පාරිභෝගික අවශ්‍යතා ගැන අවධානය යොමු කරමින් ඔවුන් වෙන බැංකු වලට යෑමෙන් වළක්වා ගත හැකියි.

*ස්මිත් මෙසේ ලියන්නේ ෆියාට් මුදල් පවතින යුගයට බොහෝ ඈත කාලයක දී ය. ෆියාට් මුදල් යනු රජය විසින් නීතිමය හුවමාරු සඳහා වලංගු නෝට්ටු හා කාසි හැටියට ආණ්ඩු ප්‍රකාශ කිරීම නිසා පමණින් (කෙසේ හෝ) එයට ජනතාවගේ පිළිගැනීම ද ලබාගන්නට සමත් වූ බැවින් අපට ලැබී තිබෙන්නකි. ස්මිත්ගේ කාලයේ දී, ගිණුම් ඇති අයගේ රත්තරන් සඳහා බැංකුවට රිසිට් පත් හැටියට නෝට්ටු නිකුත් කළ හැකියාව තිබිණ. සත්‍ය ලෝහ එහා මෙහා රැගෙන යනවාට වඩා ඒ නෝට්ටු ගණුදෙනු සඳහා යොදා ගැනීම ඉතා කාර්යක්ෂම විය. ඔවුන්ගේ ආරක්ෂිත ගබඩා තුල තැන්පත් වූ රන් වලට වඩා වැඩියෙන් නෝට්ටු නිකුත් කරන්නට ද බැංකු වලට හැකියාව තිබිණ. සියළු රන් තැන්පතු එකවර එළියට ගන්නට නෝට්ටු අතැති අය එකවර ඉල්ලා නොසිටිවී යැයි සම්භාවිතාව මත බලාපොරොත්තු තබා ගනිමින් ඔවුන් එසේ කළහ. බැංකුවක් මේ සුවපහසු මට්ටම ඉක්මවා යමින් නෝට්ටු වැඩියෙන් නිකුත් කළේ ද, එවිට සියළු නෝට්ටු අතැති අය රන් එකවර ඉල්ලමින් එද්දී අතිරේක මදි වී බැංකු වකිතයක් හටගන්නට ද ඉඩ ඇත. ස්මිත් මෙය*

*ලියද්දී, ස්කොට්ලන්තයේ මෙයාකාර දැඩි බැංකු අර්බුදයක් ඇති වී වැඩිකල් ඉකුත් වී නොතිබුණි. ඒ නිසා අපට මේ ගැන ඔහුගේ සංවේදීත්වය දැකිය හැකියි. තරඟය තුලින් බැංකු විචක්ෂණශීලීත්වයෙන් තබාගත හැකි යැයි ඔහු විශ්වාස කළේය. ඒත් මහජනතාවගේ ආරක්ෂාවට රෙගුලාසිකරණය ද අවශ්‍ය යැයි හේ කීය. මහජන හිතසුව පිණිස පොදු රෙගුලාසිකරණයක් ගැන ඔහුට කිසිත් ගැටළුවක් නැත. ඔහු විරෝධය දක්වන්නේ විශේෂ පිරිසකට පාක්ෂික වූ රෙගුලාසිකරණය ගැන පමණකි.*

ඵලදායී සහ ඵලදායී නොවන ශ්‍රමය

යම් කටයුත්තක නියැලෙද්දී ඊට යම් අගය එකතු කරන ශ්‍රමයක් ඇත. නිදසුන් වශයෙන් කර්මාන්තකරුවෙකුගේ ශ්‍රමය යම් දෙයකට අගයක් එකතු කරන්නේ අනතුරුව එය ලාබයක් තියාගෙන විකුණා ගන්නටයි. මෙය ඵලදායී ශ්‍රමය හැටියට අපිට හැඳින්විය හැකියි. එහි දී යම් කාලයක් තබාගත හැකි, වෙළඳපොලේ අලෙවි කළ හැකි වූවක්, නිෂ්පාදනය කරයි. අනෙක් ශ්‍රමය -වාල් වැඩ කරන මෙහෙකරුවෙකුගේ වැනි ශ්‍රමය කිසිත් අගයක් එකතු නොකරයි. එය ක්ෂණිකව පරිභෝජනය වෙයි. විකුණාගත හැකි කිසිවක් ඉතිරි නොකරයි. මෙය අපිට ඵලදායී නොවන ශ්‍රමය හැටියට හැඳින්විය හැකියි.

> මිනිසෙක් ධනවත් වෙන්නේ කර්මාන්තකරුවන් බොහොමයක් වෙතින් සේවය ලබාගැනීමෙනි: වාල් වැඩ කරන මෙහෙකරුවන් බොහොමයක් නඩත්තුවෙන් ඔහු දුප්පත් වෙයි.[26]

මෙයාකාර ශ්‍රමයේ තව දුරටත් පවතින අගයක් ඇත. එයට අනුව ප්‍රතිලාභ ලැබේ. උදාහරණ හැටියට, යුද හමුදාව සහ අධිකරණය මහජනතාවට සේවය කරති. ඔවුන්ගේ වෘත්තීන් ගෞරවනීය වෙති. නමුත් ඔවුන්ගේ අද ශ්‍රමයෙන් හෙට දවසේ දී කිසිවක් මිල දී ගැනෙන්නේ නැත. මේ වසරේ දී, සමහර සතුරු පළාත් වලට ආරක්ෂාව සපයන්නට සමත් වූවත්, ඒත් ඊ ළඟ වසරේ දී ද ඔවුන් ඒ කාර්යයට එහි දී නියැළී සිටිය යුතුයි. මෙම ඵලදායී නොවන ශ්‍රමික ප්‍රවර්ගයටම අයිති වනුයේ ආගමික සේවකයන්, නීතිඥයන්, වෛද්‍යවරුන්, රංගන ශිල්පීන්, විකට ශිල්පීන්, සංගීතඥයන් සහ රඟුම් දක්වන්නන්ය. ඔවුන් කරන දැය ඔවුන් එය කර අවසන් වූ සැණින් නිමාවට පත් වේ. විකුණන්නට හැකි යමක් ඉතිරි නොකරයි. ඵලදායී නොවන ශ්‍රමය පවත්වා ගැනෙන්නේ වැඩිපුරම ඉඩම් වලින් ලැබෙන කුලියෙන් සහ ප්‍රාග්ධනයෙන් ලැබෙන ලාබ වලිනි. සාමාන්‍ය රස්සා කරන අයට ලැබෙන්නේ අඩු පඩියකි. එය වියදම් කරන්නට ඔවුනට ලැබෙන්නේ ද අඩු කාලයකි.

*කර්මාන්තකරුවෙකුට හා කෘෂිකාර්මික නිෂ්පාදන වලට සේ ම, සේවා තුල අගයක් ඇතැයි අවබෝධය, ස්මිත්ගේ තවත් නවෝත්පාදනයකි. සේවා කර්මාන්ත ඉතා වැදගත් ලෙසින් ප්‍රපුලව වර්ධනය වී ඇති වර්තමානයේ එය අපි පිළිගන්නකි. නමුත් එයට අගයක් එකතු වෙනවා යැයි කියන කාරණාව නිසා එය "ඵලදායිත්වය නැති" යැයි හැඳින්වීම නොමඟ යවන්නකි. ධනවත් ඉඩම් හිමියාගේ වාල් සේවයේ යෙදෙන මෙහෙකරුවන් පරිපූර්ණ ලෙසින් පරිභෝජනයක් විය හැකි වූවත්, ගුරුවරු, ලේඛකයන්, නිර්මාපකයන්, වෛද්‍යවරු, සහ නීතිඥයන් පවා ඔවුන්ගේ කාර්යය ඉටු කර අනතුරුව ද යම් කාලයක් තුල පවතින හා භුක්ති විඳිය හැකි සේවයක් ඉදිරිපත් කරන්නට සමත් විය හැකියි. ඔවුන් නිෂ්පාදනය කරන දැනුම, අදහස්, සංගීතය, සෞඛ්‍ය සහ නීති අස්පෘශ්‍ය වූව ද, සහ විකිණීමට නොහැකි වූව ද, අද අපි ඒවා 'ඵලදායී නොවන' ලෙසකින්*

---

[26]ජාතීන්ගේ ධනය, II පොත, III පරිච්ඡේදය, 330 පිටුව, 1 වගන්තිය.

*සලකන්නේ නැත. ස්මිත් විසින් මෙහි දී අලුත් ප්‍රවේශයක් ඉදිරිපත් කරයි. ඒ නිසා මෙ සංකල්ප නියමාකාරයෙන් පැහැදිලි කරන්නට ඔහු දැඩි වෑයමක යෙදෙන බව අපිට හිතාගත හැකියි.*

මෙවැනි සේවාවන් වැඩි වැඩියෙන් පරිභෝජනය කරද්දී, අනාගත ආයෝජන සඳහා අපි ළඟ ඉතුරු වෙන්නේ අඩු ආදයම් හා ප්‍රාග්ධනයයි. ඉතින් ඒ නිසා, ඊ ළඟ වසරේ ජාතික නිෂ්පාදිතය තවත් අඩුවිය හැකියි. අනාගත ආදායම රඳා පවතින්නේ අපේ ප්‍රාග්ධන ප්‍රමාණය මතයි. ප්‍රාග්ධනය එකතු කරගන්නට හැකි එකම ක්‍රමය ඉතිරි කිරීමයි. සැබැවින්ම, ප්‍රාග්ධනය නඩත්තු කරගැනීම සඳහා පමණක් අපි ඉතිරි කළ යුතුයි. මන්ද, අමුද්‍රව්‍ය අලුත් සැපයුමක් ලබාගැනීමට සහ උපකරණ අලුත්වැඩියා කරගන්නට හැම විටම සිද්ධ වෙන නිසයි. ඉතිරි කිරීම වෙනුවට, ඵලදායී නොවන අයවළුන් දෙන දේවල් අපි අපේ ජංගම අය භාරයෙන් පරිභෝජනය කරද්දී, එවිට අපි කරන්නේ අපේ වර්තමාන පරිභෝජනය සඳහා අපේ ප්‍රාග්ධනය ගිල දැමීමයි. මෙය නාස්තිකාර හැදියාවයි. එහි දිගින් දිගටම නියැළුනොත්, විනාශයට පත්වේ.

වියදම් සියල්ල සිද්ධ වෙන්නේ සිය දේශයේම නම්, දේශීය ආර්ථිකයේ ම නම්, එවිට රන් රිදී කිසිවක් පිටරටට යැවෙන්නේ නැතැයි ද, එවිට මෙවැනි ඉතිරි-නොකිරීම් වලින් කමක් නැත කීම මර්කන්ටයිල්වාදී දැක්මයි. රටක මුදල් ප්‍රමාණය පහළ වැටී නැත්නම්, ඔවුන් කියන්නේ, කිසිදු ධනයක් විනාශ වී නැති බවයි. නමුත් සැබැවින්ම, රටක මුදල් ප්‍රමාණය වෙනස් නොවුණ ද, ඇත්ත හානිය සිද්ධ වී හමාරය. ප්‍රාග්ධනය නඩත්තු වෙනවා වෙනුවට එය පරිභෝජනය වී ඇත. අනාගත ආදායම් වර්ධනය රඳා පවතින්නේ ප්‍රාග්ධනය එක්කාසුව මත හෙයින්, අනාගත ආදායම් ද අනවරතයෙන්ම අඩු වෙති.

දුබල ආයෝජන තීරණ වලින් ප්‍රාග්ධනය නාස්ති වී යා හැකියි. නැවතත්, මේ නිසා ජාතියේ රන් රිදී සංචිත වලට බලපෑමක් සිද්ධ නොවේ. නමුත් එය පැහැදිලිවම අනාගත නිෂ්පාදන ශක්නුතාවය අඩු කරයි. කෘෂිකර්මයේ, පතල් කර්මාන්තයේ, ධීවර කටයුතු, වෙළඳාම හා කර්මාන්ත නිෂ්පාදනයේ සෑම අසාර්ථක ව්‍යාපෘතියක්ම රටේ ඵලදායී අරමුදල් යම් ප්‍රමාණයක් භාවිතා කර ඉවර කරනු ලබයි.

කෙසේ වෙතත්, ඒකීයපුද්ගලයන්ගේ නාස්තිකාර හැදියාව නිසා හෝ අනුවණ ආයෝජන නිසා ජාතීන් විනාශයට නොයති: එසේ වනුයේ මහජන ආයතන නිසා පමණි.[27] තමන්ගේ තත්වය දියුණු කරගන්නට නම් සහ අනාගත අදායම් වැඩිකර ගන්නට නම් ඉතිරි කළ යුතුයි සහ ආයෝජනය කළ යුතුයි කියා සාමාන්‍ය ජනතාව දනිති. නමුත් බොහෝ ආණ්ඩුවල ආදායම වියදම් කෙරෙන්නේ ඵලදායී නොවන අයව නඩත්තු කරන්නටයි. විවිධ හා ප්‍රශස්ත උසාවි, ආගමික ස්ථාන, විශාල නාවුක හමුදා සහ යුද හමුදා යනාදී සියල්ලම බදුගෙවන්නාගේ ශ්‍රමයෙන් යැපෙති. රජයක් විසින් තමන් වෙනුවෙන් කියා ඉතිරි කළ යුතු හෝ ආයෝජනය කළ යුතු හේතුවක් නොදකිති. අවාසනාවට, මෙවැනි මහජන වියදම් සඳහා ගෙවීමේ දී එය බදු ගෙවන්නාට දරා ගත නොහැකි තරම් විශාල වශයෙන් ඔහුගේ ප්‍රාග්ධනය ගිල ගනිද්දී, එවිට අනාගත ආදායම් අනවරතයෙන්ම හීන වී යයි.

එසේ වුවත්, නිදහස් ආර්ථිකයක් විශිෂ්ට ලෙසින් සවිමත් වූවකි. තමන්ගේ වැඩි දියුණුව සාක්ෂාත් කරගන්නට ජනතාව නිදහසේ නිති වෑයමක යෙදීම, ප්‍රගතියේ ප්‍රධාන උල්පතයි. ආණ්ඩුවේ නාස්තිකාර වියදම් සහ වැරදි තිබුණ ද, මෙය පමණක් ආර්ථිකයක් වර්ධනයට ප්‍රමාණවත්ය.[28]

---

[27] ජාතීන්ගේ ධනය, II පොත, III පරිච්ඡේදය, 342 පිටුව, 30 වගන්තිය.
[28] ජාතීන්ගේ ධනය, II පොත, III පරිච්ඡේදය, 343 පිටුව, 31 වගන්තිය.

රජවරුන්ගේ සහ ඇමතිවරුන්ගේ ද  හික්මීමක් නැති සහ ගරුසරුවක් නැති ස්වභාවයේ දැඩි වර්ධනය නිසා, පුද්ගලික ජනතාවගේ ආර්ථික ගැන ඔවුන්ට තැකීමක් ඇතැයි බොරුවට මවා පෑම නිසා  ඒ හැමෝම එකා මෙන් ව්‍යතිරේකයක් නැතිව, සමාජයේ වැඩියෙන්ම නාස්තිකාරයන් වනුයේ ඔවුන්මයි  ඔවුන්ගේ දැඩි වියදම්කාරී හැදියාව රටක් විනාශයට ගෙන නොයන්නේ නම්, එහෙනම් ඔවුන්ගේ යටත්වැසියන් ද කිසිවිටෙක තමන්ගේ ජීවිත විනාශයට ගෙන නොයනු ඇත.[29]

සමස්ත ජාතික නිෂ්පාදිතයක් වර්ධනය වෙන්නේ ඵලදායී ශ්‍රමික සංඛ්‍යාවේ වර්ධනය තුලින් පමණි. එසේ නැත්නම් ඔවුන්ගේ ඵලදායිත්වයේ ඉහළ යෑම නිසා පමණි. ඵලදායිත්වය වැඩි කළ හැකියාව ලැබෙන්නේ ශ්‍රමය සහ ප්‍රාග්ධන සම්පත්, වඩා හොඳින් පරිපාලනය කිරීමෙනි. නැතහොත් වැඩිපුර හෝ පවතිනවාට වඩා හොඳ යන්ත්‍ර හා උපකරණ භාවිතයෙනි. මේ සියල්ලම කරන්නට සාමාන්‍යයෙන් නව ප්‍රාග්ධන ආයෝජනයක් අවශ්‍ය වේ. වැඩි නිෂ්පාදනයක් ලැබීම, ඒ නිසා, සාමාන්‍යයෙන් දක්වන්නේ ප්‍රාග්ධනය විශාල ප්‍රමාණයකින් ආයෝජනය වී ඇතැයි කියායි. රටක ඉඩම් වඩා හොඳින් වගා කර ඇතැයි, එහි කර්මාන්තකරුවන් වැඩි වී ඇතැයි, එහි වෙළඳාම වැඩි වී ඇතැයි, යනාදිය අපිට දකින්නට ලැබීම නිසා එහි ප්‍රාග්ධනය වැඩි වී ඇතැයි කියා අපිට සහතික විය හැකියි. ඒ වැඩි වූ ප්‍රාග්ධන ගොඩගැසීම ඇති වූයේ ඒකීයපුද්ගලයන්ගේ පුද්ගලික ඉතුරුම් හා ආයෝජන නිසා යැයි ද, ඒවා හොරකම් කර ගනීවි යැයි බියකින් තොරව ඔවුන්ට තම ප්‍රාග්ධනය එකතු කරගන්නට නීතිමය ආරක්ෂාව ලැබීමත් නිසා  යැයි ද, සහ ඉතුරු කරන, අයෝජන කරන, තම තත්වය පවතිනවාට වඩා යහපත් කරගන්නට දිරිගැන්වීමක් ලැබෙන නිදහස ද ලැබුණු නිසා යැයි ද, යැයි කිව හැකියි.

පොලිය

තාවකාලික ණයක් ලබාගන්නා ගැණුම්කරුවෙකුට ජනතාව ප්‍රාග්ධනය දෙන්නේ, එයින් ලබාගත් ප්‍රයෝජනය වෙනුවට කුලියක් වැනි යමක් සමඟ යම් කාලයකින් පසු තමනට එය ආපසු ගෙවනු ඇතැයි බලාපොරොත්තුවෙනි. මේ ප්‍රාග්ධන ප්‍රමාණයත්, ඒ සඳහා පොලියත් දෙකම ගෙවිය හැකියාවටත් වැඩියෙන් හොඳ ලාබයක් උපයා ගත හැකි යැයි ණය ගැණුම්කරුවන් අපේක්ෂා කරති. නැවතත් ඉතින් අපි මතක තබාගත යුත්තේ ණය ගැණුම්කරුවාගේ අවශ්‍යතාවය මුදල් නොව, මුදල් වලින් මිල දී ගත හැකි ක්‍රය ශක්තිය බවයි. වෙනත් විදියකින් කියතොත්, ප්‍රතිදේයය (ණය) නියෝජනය කරන්නේ ජාතික නිෂ්පාදිතයේ යම් සුළු කොටසක් ණය දෙන්නා විසින් ණය ගැණුම්කරුවාට පවරා ඇති බවයි.[30]

ඕනෑම රටක ප්‍රාග්ධනය වැඩියෙන් පවතින්නේ ද, එහි හිමිකරුවන් අතර වැඩියෙන් තරඟයක් ද පවතී. එම නිසා ණය ගැණුම්කරුවන්ට ඒ සඳහා අඩු මිලක් ඉදිරිපත් කරන හැකියාව ද ලැබේ. වෙනත් විදියකට කිව්වොත්, ප්‍රාග්ධනය වැඩි වෙද්දී, ඒ සඳහා අය කෙරෙන පොලී අනුපාතිකය ද අඩුවේ. ප්‍රාග්ධනයේ වර්ධනය සහ එහි අඩු වියදම නිසා ඵලදායී කර්මාන්තවලට තල්ලුවක් ලැබේ. වැඩියෙන් ශ්‍රමය කුලියට ගැනේ. වේතන ඉහළ යයි. තමන්ගේ ලාබ මට්ටම් ද ක්ෂය වීම දැක්කත්, සේවායෝජකයන් විසින් ඔවුන් ණයට ගන්නා ප්‍රාග්ධනයට අඩුවෙන් ගෙවති.

---

[29]ජාතීන්ගේ ධනය, II පොත, III පරිච්ඡේදය, 346 පිටුව, 36 වගන්තිය.
[30]ජාතීන්ගේ ධනය, II පොත, IV පරිච්ඡේදය.

පොලී අනුපාත අඩුකරන ලද්දේ ස්පාඤ්ඤයට අයිති බටහිර කොදෙව් දූපත් හි පතල් වලින් රන් හා රිදී වැඩි ප්‍රමාණයක් ලබාගැනීමට සමත්වීම නිසා යැයි සමහර අය තර්ක කරති. නමුත් මෙය සත්‍යය විය නොහැකියි. අනෙක් සියල්ල එසේම තිබිය දී, රිදී ප්‍රමාණය ඉහළ දැමීම තුලින් ඒ ලෝහයේ අගය අඩුවෙනවා හැරෙන්නට වෙනත් ඵලවිපාකයක් ඇතිවන්නේ නැත. මෙය බහුල වශයෙන් සැපයුමක් ඇති අනෙක් ඕනෑම හුවමාරු භාණ්ඩයක් වැනිය. මෙහි ප්‍රතිඵලය මුදල් මිල ගණන් ඉහළ යනවා මෙන් පෙනීම පමණි. නමුත් මේ ඉහළ යන මිල ගණන් සත්‍යයය නොව හුදු නාමික වූවක් පමණකි. මිල ගණන් ඉහළ ගිය ද, කිසිම තත්වයක්, පොලී අනුපාතික ද ඇතුළුව, සත්‍යයෙන්ම වෙනස් වී නැත.

*මෙහි දී ස්මිත් විසින් කරනුයේ මර්කන්ටයිල්වාදී දැක්මට ප්‍රතිවිරෝධ තර්කය වූ මුදල් හි ප්‍රමාණික න්‍යාය ගෙනහැර දැක්වීමයි. එනම්, සංසරණයේ ඇති මුදල් වැඩිවෙද්දී, එහි අගය අඩු වන හැටියි. වෙනත් විදියකට කියතොත්, උද්ධමනයයි. ඔහුගේ ප්‍රතිභාවීය දැක්ම වනුයේ සියළු මිල ගණන් බලපෑමට හසුවෙන නිසා සත්‍යය වෙනසක් සැබෑවටම සිදු නොවන බවයි. ආර්ථිකයක යම් විශේෂ තැන්වලට අලුත් මුදල් ඇතුල්වීම නිසා, මිල ගණන් ඉහළ යෑම එතැනින් පටන් ගෙන, වෙන් කිරීම් හා ප්‍රතිපාදන වැරදි තැන්වලට සැබෑවටම බෙදීයාම සිද්ධ වීමෙන්, සමහර විකෘති බලපෑම් ඇතිවීම උද්ධමනය නිසා සිදුවන බව අද අපි හඳුනාගනිමු.*

පොලී ලැබෙන මුදල් ණයට දීම නීති විරෝධී කරන්නට සමහර රටවල් උත්සාහ කර ඇත. ඒත් ඒ නිසා, එය වළක්වනවා වෙනුවට ගිනිපොලියට ණය දීමේ දුෂ්ටත්වය වැඩි වීම පමණක් සිද්ධ වී ඇත. ණයට මුදල් ගැනීම ජනතාවට තව දුරටත් අවශ්‍ය වූවකි. නමුත් දැන් පොලිය පමණක් නොව ඔවුන්ට නීතිවිරෝධී ලෙස ණය සපයන ණය දෙන්නා ගන්නා අවදානමේ ආධික්‍යය ද ගෙවන්නට සිද්ධ වී ඇත. වෙළඳපොල මිල ගණන් වලට පහතින් පොලී අනුපාතිකය ඇණහිටුවන්නට රජය උත්සාහ කිරීමේ දී ද මේ ඵලවිපාකයම අත්විඳින්නට සිද්ධ වේ. ණය දෙන්නා ඔවුන්ගේ මුදල් එය භාවිතයේ වටිනාකමට වඩා අඩු මිලකට ණය හැටියට දෙන්නේ නැත. ඒ නිසා ණය ගැණුම්කරුවන්ට එහි සම්පූර්ණ අගයෙන් ලබාගැනීම සඳහා ඇති අවදානමේ අධික්‍යය ද සමඟින් ණය දෙන්නන්ට ගෙවන්නට සිද්ධ වේ.

*මෙය මිල පාලනය නිසා කළුකඩකාරය හටගන්නා ආකාරය පහදන පැහැදිලි උදාහරණයකි. වෙළඳපොල මට්ටම් වලට අඩුවෙන් කෘතීමව මිල ගණන් පහළින් තියාගනිද්දී, සැපයුම්කරුවන් වැඩියෙන් මුදල් උපයාගත හැකි වෙනත් වෙළඳපොලවල් සොයා යති. එහි දී බඩු හිඟය ඇති කරයි. එසේ නැත්නම් ඔවුන් එය නීති විරෝධීව කරගෙන යනු ඇත: එහෙත් එසේ කරද්දී, වෙළඳුන් ගන්නා අවදානමට සරිලෙන ලෙසකින් පාරිභෝගිකයන්ට වෙළඳපොල මිල ගණන් වලටත් වඩා ඉහළ මිලක් ගෙවන්නට සිද්ධ වේ. කුලී පාලන, වේතන පාලන, සහ අනෙකුත් මිල පාලන සඳහාත් මේ තර්කයම බලපායි.*

ප්‍රාග්ධනය පිළිබඳ තවත් ප්‍රත්‍යාවේක්ෂණ

ප්‍රාග්ධනය හතර ආකාරයකින් භාවිතයට ගත හැකියි.[31] ගොවිතැන් සහ ධීවර කර්මාන්තය වැනි සමහර වත්කම් ක්ෂණික පරිභෝජනය සඳහා හෝ එයින් වෙන යමක් තැනීම පිණිස අමු නිෂ්පාදනයක් අස්වැන්න හැටියට ලබාදෙයි. යන්ත්‍ර සහ උපකරණ වැනි සමහර වත්කම් භාවිතා වෙන්නේ අමු (අමිශ්‍ර/නොනිමි) ද්‍රව්‍ය පරිභෝජනය සඳහා පිළියෙල කරනු පිණිස ය. කරත්ත සහ නැව් වැනි සමහර වත්කම් භාවිතා වෙන්නේ නිමි හෝ නොනිමි භාණ්ඩ වෙළඳපොලට ප්‍රවාහනය කරනු පිණිසයි.

---

[31]ජාතීන්ගේ ධනය, II පොත, V පරිච්ඡේදය.

අන්තිමට එන්නේ, සිල්ලර වෙළඳාම සඳහා ප්‍රාග්ධනය යොදා ගැනීමයි. එනම් නිමි හෝ නොනිමි භාණ්ඩ පාරිභෝගික අවශ්‍යතාවය සඳහා කුඩා ප්‍රමාණ වලින් හැදෙන භාණ්ඩ නිර්මාණයටයි. උදාහරණයක් හැටියට මස්කඩකාරයන් නැතිනම්, එවිට එකවර සම්පූර්ණ ගවයෙක් හෝ බැටළුවෙක් මිල දී ගන්නට සිද්ධ වේ. එය ධනවතුන්ට කරදරයක් වන අතර දුප්පතුන්ට කිසිත් සේ කළ නොහැකි වූවක් බවට පත්වේ.

*සිල්ලර වෙළෙන්දා කිසිත් අගයක් එකතු නොකරන්නෙක් යැයි ද, නිර්දය නිසා තරඟයට රෙගුලාසි අවශ්‍ය යැයි ද, පාරිභෝගිකයා ඒ නිර්දය තරඟය නිසා තමනට අවශ්‍ය නැති භාණ්ඩ ගන්නට තල්ලු වෙද්දී සමහර වෙළෙන්දන් අසාර්ථක වේ යැයි ද, යනාදී ඔහුගේ යුගයේ වූ පොදු දැක්ම ස්මිත් මෙහි දී සාකච්ඡාවට බඳුන් කරයි.*

සිල්ලර වෙළෙන්දන් ගැන, වර්තමානයේ දකින්නට ඇති දේශපාලන ප්‍රාග්නිශ්චය ද ඒ නිසා වැරදි තැනක පවතී. ඔවුන් අගයක් එකතු කරති. ඔවුන් ජනතාවට සේවයක් සපයති. ඔවුන් අතර තරඟය තුලින් සමහර අයට ව්‍යාපාරයෙන් අයින් වෙන්නට සිද්ධ වනු ඇත. නමුත් එයින් කිසිම විටෙක පාරිභෝගිකයාට හානියක් සිද්ධ නොවේ. තරඟය බලපෑම් ගෙනෙන්නේ ඔවුන්ගේ මිල ගණන් අඩුවෙන් තබාගැනීමටයි. මේ බලපෑම ඒකාධිකාරයන් අත්විඳින්නේ නැති වූවකි. රෙගුලාසිකරණය නැති වුවහොත්, තමන්ට අවශ්‍ය නැති භාණ්ඩ මිල දී ගන්නට පාරිභෝගිකයාව රවටන්නට සිල්ලර වෙළෙන්දන්ට හැකියාව ඇතැයි කීම ඒ නිසා නොමඟ යවන හැකියාවෙන් යුතු සිත් ඇදගන්නට සමත් කියමනක් පමණි. උදාහරණයක් හැටියට, මිනිසුන් පමණ ඉක්මවා බොන්නේ හැම තැනම සුලබව පැතිර ඇති බියර් වෙළඳසැල් නිසා නොවේ. මිනිසුන්ගේ බොන්න කැමති හැදියාව නිසයි බියර් වෙළඳසැල් වලට රැකියාවේ නියැළෙන්නට අවස්ථාව පැදෙන්නේ. අනෙකුත් අය මෙන්ම සිල්ලර වෙළෙන්දන් ද ඉල්ලුම පසුපස යන අය වෙති.[32]

කෘෂිකර්මය සඳහා යොදවා ඇති ප්‍රාග්ධනය වැඩියෙන්ම ඵලදායී වූව බව පෙනී යයි. ඒ, ස්වභාව ධර්මය මිනිස් ශ්‍රමය සමඟින් එක්ව කටයුතු කරමින් ඵලදාව පිරිපුන් කරවන නිසයි. යටත්විජිත ඇමෙරිකා දේශයන් ඉතා වේගයෙන් වර්ධනය වූයේ ඔවුන්ගේ ප්‍රාග්ධනය මේ ඉතා ඵලදායී වූ අංශයට යොදවන ලද නිසයි. අඩු ලාබයෙන් යුතු වෙළඳ සහ කර්මාන්ත අංශයන්ට අවශ්‍ය ප්‍රාග්ධනය යොදවන්නට ඔවුන් අනුන්ට පැවරූහ. ඇමෙරිකාව නිෂ්පාදන බොහොමයක් සහමුලින්ම ආනයන කරනු ලැබේ. මහා බ්‍රිතාන්‍යයේ වෙළෙන්දන්ගේ ප්‍රාග්ධනයෙන් මෙම වෙළඳාමට මුල්‍ය සැපයී ඇත. අත්ලාන්තිකය හරහා සිද්ධ වෙන වෙළඳාමේ වර්ජිනියා හා මෙරිලන්ඩ් හි පිහිටි කඩ සහ තොග ගබඩා සැල් බ්‍රිතාන්‍යයන්ගේ අයිතියෙන් යුතුයි. වර්තමානයේ පවතින මතභේද හේතුවෙන් ඇමෙරිකන් අය මේ වෙළඳාමට තිත තබා ඔවුන්ගේ ප්‍රාග්ධනය දේශීය කර්මාන්ත අංශයකට හරවා යැව්වොත්, ඔවුන්ගේ දේශීය නිෂ්පාදකයන්ට කාර්යක්ෂම ඒකාධිකාරයක් එවිට හදා දෙනු ඇත. එයින් ඔවුන්ගේ වැය ඉහළ යෑම නිසා ඔවුන්ගේ තත්වයන් පවතිනවාට වඩා පහළට බහිනු ඇත.

ආර්ථික ප්‍රගතියක් ලැබෙන්නේ අනිකුත් අය සමඟ ගණුදෙනු කරත හැකි අතිරික්තයක් නිපදවන රටවලට පමණි. තමන් ස්වයං පෝෂිත වන්නට උත්සාහ නොකර, අනෙකුත් රටවල් වලට දමා ඇති වෙළඳ බාධාවන් ඉවත් කරන්නේ නම් රටවල් වඩා යහපත් තත්වයකට පත්වෙති.

[32]ජාතීන්ගේ ධනය, II පොත, V පරිච්ඡේදය, 360 පිටුව, 7 වගන්තිය.

## III පොත: ආර්ථික වර්ධනයේ ප්‍රගතිය

දියුණු සමාජයක ප්‍රධාන වානිජ කටයුතු පැවතෙන්නේ ගම හා එහි නගර අතර ය. එක අර්ථයකින් දක්වද්දී, ගම්වල සම්පූර්ණ ධනය නගර විසින් ලබාගනියි. නමුත් එයින් අදහස් වනුයේ ගම පරදුවට තබමින් ඒවායේ ධනය ලබාගන්නවා කියා නොවේ. දෙපැත්තම වාසි අත්විඳිති. ගෘහ භාණ්ඩ සහ ගොවි උපකරණ හදා ගැනීම පිණිස ගොවියන්ට නගරයේ සිටින පුහුණු කාර්මික ශිල්පීන්ගේ සේවය අවශ්‍යයය. නගරවල පිහිටන වෙළඳපොලට ඔවුන්ගේ ගොවි නිෂ්පාදන අවශ්‍යයය. නගරයක ධනය හා ජනගහණය වැඩිවෙද්දී, වෙළඳපොල ද විශාල වේ. එයින් ගම වැඩිපුර යහපතක් ලබා ගනියි.

කෘෂිකර්මයට මුල් තැන

පහසුකම් සහ සුඛෝපභෝගීත්වයට පෙර ජීවිකාව තිබිය යුතු නිසා, ගමේ වගා කටයුතු සහ දියුණුව නගර සංවර්ධනයට පෙර සිද්ධ වී තිබිය යුතුයි. ගමකට අතිරික්ත නිපදවන හැකියාවේ ප්‍රමාණය අනුව නගර වර්ධනය ද සිද්ධ වේ.

ලාබ එක හා සමාන වූයේ නම්, විදේශ වෙළඳාමට සහ කම්හල් නිෂ්පාදනයේ නියැළීමට වඩා මිනිසුන් සාමාන්‍යයෙන් කැමැත්ත දක්වන්නේ ඉඩම් වලින් ජීවිකාව සොයා ගන්නටයි. කර්මාන්ත අංශයේ හෝ වෙළඳාම් අංශයේ ඇති අනේක හදිසි අනතුරු සහ අවිනිශ්චිත තත්වයන්ට වැඩියෙන් ඉඩම් සහ කුලිය සුරක්ෂිත යැයි ඔවුන්ට පෙනී යයි. ඉඩම් හිමියන් ගමේ සුන්දරත්වය හා නිස්කලංක බව රස විඳිති. ඒත් ගොවියන්ට ද යකඩ වැඩ, වඩුවැඩ, කරත්ත රෝද හදන, නඟුල් හදන, මේසන් සහ ගඩොල් වැඩ, හම් භාණ්ඩ, සපතේරුවන් හා සන්නාලියන් අවශ්‍ය වැනි කුසලතා නිපුණත්වයෙන් යුතු අයව අවශ්‍යයයි. මේ අයට අනික් පැත්තෙන් ආහාර සහ අමු ද්‍රව්‍ය අවශ්‍යයයි. නගරයේ හා ගමේ වාසීන් එකිනෙකා මත අන්‍යෝන්‍ය වූ රඳා පැවැත්මකින් යුතු වෙති. එනමුදු, නගරයට වර්ධනය විය හැකි වනුයේ ගමෙන් ඇති ඉල්ලුම සහ එහි පවතින සමෘද්ධියට සමානුපාතිකව පමණි.

මිනිසුන් තම ප්‍රාග්ධනය ඒ ඒ දැයට වෙන් කරද්දී, ඒ නිසා, ඔවුන් වැඩියෙන් කැමති වනුයේ එය මුලින්ම ඉඩම් වලට යොදවන්නටයි. ඊ ළඟට කර්මාන්ත වලින් කෙරෙන නිෂ්පාදනයටයි, ඊටත් අනතුරුව තමයි ඔවුන් විදේශ වෙළඳාමට, එහි බහුලව ඇති අවදානම් අතරට, පිවිසෙන්නේ. උතුරු ඇමෙරිකන් යටත්විජිත මෙන් ඉඩම් සරු ලෙසින් පැතිර පවතිද්දී, ප්‍රාග්ධනය මූලික වශයෙන් යන්නේ කෘෂිකාර්මික දියුණුව සඳහා ය. ඉඩම් පරිපූර්ණ ලෙසින් දියුණු කරන ලද රටවල, ප්‍රාග්ධනය වැඩියෙන් හැරෙවෙන්නේ කර්මාන්ත අංශයටයි. ඒ කොයි පැත්තේ වුවත්, සාමාන්‍යයෙන් ආනයන-අපනයන ව්‍යාපාරවල යෙදීම, කර්මාන්ත අංශයේ දියුණුව ලබා ඇති, වෙනත් රටවල් වලට ඉඩ හැරී පවතී. උතුරු ඇමෙරිකාව ඉතා වේගවත් දියුණුවක් ලබාගත්තේ, ඔවුන්ගේ වෙළඳාම බ්‍රිතාන්‍ය වෙළෙන්ඳන් අතින් මූල්‍යකරණය වෙද්දී, ඔවුන්ගේ ප්‍රාග්ධනය විශේෂයෙන්ම කෘෂිකර්මයට ගිය නිසයි. පුරාතන ඊජිප්තුවේ, චීනයේ සහ හින්දුස්ථානයේ ධනය පෙන්නුම් කරන්නේ, ඔවුන්ගේ වෙළඳාම බොහෝ දුරකට විදේශිකයන්ගේ මූල්‍යයෙන් සිද්ධ වෙද්දී ජාතීන්ට සමෘද්ධිමත් විය හැකි බවයි.

නගරයේ නැඟීම

නගරය, ගම මත රඳා පැවතිය හැකියි. නමුත් ඔවුන් ද ඊට දියුණු වෙන්නට උදව් කරති. මුලින්ම, ගමේ නිෂ්පාදන සඳහා විශාල වෙළඳපොලක් ඔවුන් සපයයි. දෙවනුව, නගරයේ ධනවත් අය ගමේ ඉඩම් මිල දී ගෙන වැඩි දියුණු කරති. ධනවත් වෙළෙන්දන් -ඔවුන් කෘෂිකර්මය ව්‍යාපාරික අන්දමකින් දියුණු කරන අය වුවත්- තමන් ගමේ සත්පුරුෂයෙක් යැයි හඳුන්වාගන්නට රුචියාව දක්වති. තෙවනුව, නගරයේ වානිජ කටයුතු වලින් නීතිය පිළිපදින සහ යහපත් පාලනයකින් යුතු රජයක්, එම සිද්ධාන්ත ගමට ද පැතිර යන සේ, ප්‍රවර්ධනය කරයි.

ගම්වැසියන්ට කලින් සිය ස්වාධීනත්වය සහ නිදහස සාක්ෂාත් කරගන්නට නගරවැසියන් සමත් වූහ. වරප්‍රසාද සහ ස්ව-පාලනය ඔවුන් ක්‍රම ක්‍රමයෙන් දිනා ගත්තේ යම් තරමකට, ධනවත් රදළ ප්‍රභූවරුන්ට එරෙහිව තම පැත්තට නගරවාසීන් නම්වා ගන්නට රිසි වූ දුර්වල රජවරුන්ගේ සහාය ලැබීම නිසයි. ධනවත් රදළ ප්‍රභූවරු, රජුන් හා වෙළෙන්දන් යන දෙකොට්ඨාශයම පිළිකුල් කළහ. නීතිය සහ පාලනය, ආරක්ෂාව සහ නිදහස ඒ අනුව නගර තුල පටන් ගැනිණ. කර්මාන්ත අංශ හා වෙළඳාම පුළුල් වී පැතිර ගියේය.[33]

කෙසේ වෙතත්, කර්මාන්ත අංශයක් උපත ලබන්නට පෙර යුගයේ, මහා විශාල ඉඩම් හිමියන්ට ඔවුන්ගේ අතිරික්තය වෙනුවෙන් හුවමාරු කරගන්නට දැයක් නොවීය. ඔවුන්ට කළ හැකි වූ එකම දෙය නම්, ඔවුන්ගේ ධනය යොදවමින් විශාල සංඛ්‍යාවක ප්‍රවේණි දාසයන් සහ ඔවුන් යටතේ යැපෙන අනුගාමිකයන්ව තබා ගැනීමයි. මෙයින් ඔවුනට විසාල බලඅධිකාරියක් ලැබිණ. ඈතක සිටින රජ කෙනෙක් නොව, ළඟ සිටින ඔවුන්ට මේ නිසා ස්වභාවයෙන්ම ඉඩ පැදුනේ ප්‍රධාන නීතිකාරකයා සහ පරිපාලකයා වීමට හැකි බලයයි. එහෙත් එවැනි බලය හිතුමතයට අනුව යොදා ගත හැකියාවෙන් ද යුතුයි. ඒ නිසා රජුගේ සිට ඉතාමත් කුඩා ප්‍රමාණයක් සතු වූ ඉඩම්හිමිකරුවා දක්වා විහිද ගිය වැඩවසම් නීති ක්‍රමය -අයිතීන් සහ වගකීම් පද්ධතිය, ඒ බලය මැඩලීමට ගත් උත්සාහයකි.

මහා රදළයන් සතු වූ හිතුමතයේ කටයුතු කරන බලය මැඩලන්නට මේ වැඩවසම් නීති වලට ද නොහැකි විය. නමුත් එය සිද්ධ වූයේ නැඟී ආ කර්මාන්ත අංශයෙන් සහ වානිජ්‍යයෙනි.[34] කම්හල් නිෂ්පාදන වෙළඳපොලේ පැතිර යද්දී, එතෙක් තම අතිරික්ත සඳහා හුවමාරු කරගන්නට යමක් නොතිබුණු රදළයන්ට ඒ සඳහා හුවමාරු කරගන්නට යමක් ලැබිණ. දහස් ගණනින් ප්‍රවේණි දාසයන් නඩත්තු කරනවා වෙනුවට ඔවුන් තමන්ගේ සුවපහසුකම් සහ අනුන්ට පෙන්වන සුඛෝපභෝගීත්වය සඳහා සිය ධනය වියදම් කරන්නට පටන් ගත්හ.

එහි ප්‍රතිඵලයක් හැටියට ඒ මහා රදළයන් තමන්ගේ සම්පූර්ණ බලය හා අධිකාරියේ ප්‍රභවය අහිමි කරගත්හ. ප්‍රවේණි දාසයන් සිය රදළ ප්‍රභූවරුන් මත යැපෙන ආකාරයෙන් වෙළෙන්දන් සිය පාරිභෝගිකයන් මත යැපෙන්නේ නැත. ඔවුන්ට වෙනත් පාරිභෝගිකයන් ද සිටිති: පාරිභෝගිකයන්ගේ පක්ෂපාතීත්වය වැඩිපුර පිරිසක් අතර බෙදී පවතින්නකි.

---

[33]ජාතීන්ගේ ධනය, III පොත, III පරිච්ඡේදය.
[34]ජාතීන්ගේ ධනය, III පොත, IV පරිච්ඡේදය.

දියමන්තියෙන් හැදූ ගාංචු යුගලක් සඳහා, නැත්නම් සමහර විට ඒ හා සමාන වූ නිශ්ඵල විච්චූර්ණයක් සඳහා, ජනතාවගේ නඩත්තුව, නැත්නම් එයින් අදහස් වූව, එනම් දහසක් මිනිසුන් වසරකට නඩත්තු කළ හැකි මිල, සහ ඒ හැකියාව නිසාම ඔවුන්ට ලැබෙන ඒ සම්පූර්ණ බලය සහ අධිකාරිය, ඔවුන් හුවමාරු කරගත්හ.[35]

ප්‍රවේණි දාසකම් කරන සංඛ්‍යාව අඩු වී යද්දී, ගොවිතැන් කළ ඉඩම් විශාල වෙන්නටත්, ඒවා වඩා කාර්යක්ෂම සහ ඵලදායී වෙන්නටත් පටන් ගැනුණි. ඉඩම් හිමියන්ට සිය කුලී ඉහළ යැවීමට හැකියාව පැදුණි. ඒත් ඒ ඉහළ කුලී ගෙවූ අඳගොවියන් වැඩි ආරක්ෂාව ඉල්ලන්නට ද පටන් ගත්හ. අඳ ගොවීන් තවත් ස්වාධීන වූහ. ඉඩම් හිමියන්ට හිතුමතයේ වැඩ කරත හැකි බලය අහිමි විය. යුක්ති සහගත පද්ධතියක් දියුණු විය. ගම්වල වතු වගා සහ දියුණුවට හේතු පාදක වූයේ නගරයේ වූ වානිජ්‍යය හා කර්මාන්ත අංශයයි.

*මේ ඉතිහාසය අනුමානය කරන ලද්දකි. එහෙත් ස්කොට්ලන්ත ප්‍රභූවරුන්ගේ සම්ප්‍රදායික වැඩවසම් බලය බිඳවැටීම ගැන ස්මිත්ට ඔහුගේ කාලයේ දී සැබෑ උදාහරණ ලැබෙන්නට ඇති.*

අඳගොවි නීති සහ කෘෂිකාර්මික කාර්යක්ෂමතාව

එංගලන්තයේ අඳගොවියන්ට ලැබුණු සැලකිය යුතු මට්ටමක ආරක්ෂාව ජාතියේ කෘෂිකාර්මික සාර්ථකත්වය සහ ශ්‍රී විභූතියට දායක විය. යුරෝපයේ වෙනත් පැතිවල, ඉඩම් අඳය කෙටි කාලීන වීම නිසා එය දියුණුවක් දිරිගන්වන තරමට ප්‍රමාණවත් නොවීය. එසේ නැතහොත් අඳ ගොවියන් විසින් ඉඩම්හිමියාට ලබාදිය යුතු අනියම් සේවා ද අඳයට ඇතුලත් විය. නැතහොත්, අඳ ඉඩමේ උපයන දැය සඳහා බදු ගෙවන්නට සිද්ධ විය. අතිරික්තයක් නිෂ්පාදනය කළ ප්‍රංශ ගොවියන්ගේ ඒ අතිරික්තය හැම විටම බද්දක් හැටියට සම්පූර්ණයෙන්ම රජුට හෝ රදළයන් වෙතට පවරා ගනු ලැබීය.

කුඩා ඉඩම් හිමියන්ට තම ඉඩකඩම් කළමනාකාරණය සඳහා විශාල ඉඩම් හිමියන්ට වඩා ඍජු උවමනාවක් පවතී. ඒ නිසා ඔවුන් සාර්ථක මෙන්ම ඵලදායිත්වයෙන් ද යුතුය. නමුත් යුරෝපයේ, මහා වතුයායන් බෙදා වෙන් කිරීම තවමත් වැළක්වී ඇත්තේ කුළුදුල් දරුවන්ට අයිතිවාසිකම පැවරෙන ස්වාමි පුරස්කාරය දිගටම පවතින නිසයි. ආදායම් උපයන හා භුක්ති විඳින ප්‍රභවයක් පමණක් නොව ඉඩම් යනු බලය, අනුග්‍රහය, සහ ආරක්ෂාව සපයන්නක් ලෙසින් ද සැලකේ. ඉතින් රෝමය කඩාවැටී අනතුරුව දකින්නට ලැබුණු අවදානම් යුගයේ දී, ඉඩම් යනු බෙදා වෙන් නොකර තබාගත යුතු දෙයක් හැටියට විශ්වාස කෙරිණ.[36] මේ සම්ප්‍රදාය තවමත් පවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉඩම් වෙළඳපොලට එන්නේ කලාතුරකිනි. සමහර විට ස්කොට්ලන්ත භූමියේ තුනෙන් එකක් මේ ක්‍රමය යටතේ තවමත් පැවතේ. ඉතින් ඉඩම් වෙළඳපොලට එන යම් අවස්ථාවක් වේ ද, එවිට එය ඉහළ වූ ඒකාධිකාර මිලකට පමණක් විකිණේ. මේ ක්‍රමය නිසා ඉඩම් භාවිතය අකාර්යක්ෂම වේ: වෙනත් ව්‍යාපාර වල දී මෙන්ම ඉඩම් දියුණු කරන වැය-කාර්යක්ෂම වූ පිළිවෙත් වල දී ද, සෑම ලොකු කුඩා කරුණු ගැන සහ ලාබය ගැන මනා අවධානයක් යොමු කළ යුතුයි. ඒත්, විශාල වතුයායන්හි ප්‍රභූ ඉඩම්හිමියන් ඒවාට දක්වන්නේ, තමන්ටම අයිති වූ කුඩා ඉඩම් ප්‍රමාණයන්හි වගා කටයුතු කරන අයට වඩා අඩු උත්සුක බවකි. යුරෝපයේ ඇති මෙම ක්‍රමයේ මෙම ආකාර්යක්ෂම බව නිසා එහි ජනගහණය දෙගුණයකින් වැඩිවෙන්නට වසර පන්සියයක් ගත විය.

---

[35]ජාතීන්ගේ ධනය, III පොත, IV පරිච්ඡේදය, 418-9 පිටුව, 10 වගන්තිය.
[36]ජාතීන්ගේ ධනය, III පොත, II පරිච්ඡේදය.

ස්වාමි පුරස්කාරය නැති උතුරු ඇමෙරිකාවේ ජනගහණය සෑම වසර විසිපහක දී ම දෙගුණයකින් වැඩිවේ. ඉඩම් සඳහා විවෘත වෙළඳපොලක් පවතී. වතුයායක් අරඹන්නට පවුම් පනහක් හෝ හැටක් ප්‍රමාණවත්ය. යුරෝපීය ඉඩම් හිමිකම අයිතිකරුවාගේ මරණයෙන් පසුව ඔහුගේ දරුවන් අතර එක හා සමාන ලෙසින් බෙදා දුන්නොත්, දේපොළ සාමාන්‍යයෙන් විකිණී යනු ඇත. තව ඉඩකඩම් එවිට වෙළඳපොලට එයි. මිල ගණන් මධ්‍යස්ථ වී භූමියේ ඵලදායිත්වය ඉහළ යනු ඇත.

කෘෂිකාර්මික කාර්යක්ෂමතාවය සීමා කරන තවත් සාධකයක් වනුයේ වහල් ක්‍රමයයි. රුසියාවේ, පෝලන්තයේ, හංගේරියාවේ, බොහීමියාවේ, මොරේවියා සහ ජර්මනියේ වෙනත් පළාත් වල, දාසයන් ඉඩම් හා බැඳී සිටිති. ඉඩම් සමඟ ඔවුන්ව ද මිල දී ගැනීමට හා විකුණා දැමීමට හැකියි. පුද්ගලික දේපලක් එකතු කරගන්නට නොහැකි දාසයෙක් හෝ වහලෙක් යනු පුළුවන් තරම් අඩුවෙන් වෙහෙස යොදවා, සහ හැකි තරම් කෑම හැරෙන්නට වෙනත් උවමනාවකින් නොයුතු වූවෙකි. ඵලදායී වැඩක් ඔවුන්ගෙන් ගන්නට නම් බලාත්කාරය යොදාගන්නට සිද්ධ වේ. වහල් ශ්‍රමය ලාබ යැයි පෙනුන ද, එය ඒ නිසා අඩුම වැය-කාර්යක්ෂමතාවයෙන් යුතු ශ්‍රමයයි. බ්‍රිතාන්‍ය යටත් විජිතයන්හි සීනි සහ දුම්කොළ වතුයායන්හි වහල් ක්‍රමය පැවතීම සාමාන්‍යයකි. වහල් සේවයේ වියදම් දරාගත හැකියාව ලැබෙන්නේ භූමියේ සාරවත් බව හා භූමිය බහුලව පැතිර පැවතීම නිසා පමණකි.

## IV පොත: ආර්ථික න්‍යාය සහ ප්‍රතිපත්තිය

අර්ථ ශාස්ත්‍රය යනු ජනතාවට ආදායමක් උත්පාදනය කරන්නේ කෙසේද යන්නත් රටට ආදායමක් සපයන්නේ කෙසේද යන්නත් ගැන වූවකි. වර්තමානයේ මේ ගැන ප්‍රධාන න්‍යාය දෙකක් පවතී, මර්කන්ටයිල් ක්‍රමය සහ කෘෂිකාර්මික ක්‍රමය.

මර්කන්ටයිල් ක්‍රමය

මර්කන්ටයිල් ක්‍රමය විශ්වාස කරන්නේ ධනය පවතින්නේ මුදල් -රන් සහ රිදී, තුල කියායි. ධනවත් පුද්ගලයෙක්ට, නැත්නම් ධනවත් රටකට, බහුල වශයෙන් මුදල් සතුව ඇත. මේ දැක්ම අනුව, ඒ නිසා, ප්‍රතිපත්ති අවධානය යොමු කළ යුත්තේ විශාල ප්‍රමාණ වලින් මුදල් ගොඩ ගසන්නටයි. එය යටත්විජිත වලින් සොයාගෙන රටට ගෙන්වා ගැනීමටයි. නමුත් එය රටින් පිට වී යාම වළක්වා ගැනීමයි.[37]

මෙයාකාර දැක්මේ නිරූපනයක් හැටියට, ස්පාඤ්ඤයන් විසින් ඇමෙරිකාව සොයා ගනිද්දී, ඔවුන්ගේ පළමු ප්‍රශ්නය වූයේ රන් හෝ රිදී එහි දී සොයාගත හැකිවේවි ද යන්නයි. මේ ලෝහ වල වැදගත්කම ගැන ඔවුන් සිතාගෙන හිටියේ මේ දැක්මට අනුකූලවය. එම හේතුව නිසාම, ස්පාඤ්ඤය සහ පෘතුගාලය රන් සහ රිදී නිර්යාතයට දැඩි බදු සහ දැඩි තහනම් පනවා ඇත. සමහර පැරණි ස්කොට්ලන්ත නීති ද රන් හා රිදී නිර්යාත වළක්වා තිබේ.

---

[37] ජාතීන්ගේ ධනය, IV පොත, I පරිච්ඡේදය.

මේ බාධක තමනට දැඩි අපහසුකම් ගෙනෙන බව වෙළෙන්දන්ට පැහැදිලි වුණි. රන් හා රිදී දීමෙන් සමහර ආනයන ගෙන්වා ගන්නට ඔවුන්ට අවසර දුන්නොත්, ඒ ආනයන කළ දේවල් වලින් වෙන රටවලට අපනයනය කළ හැකි දේවල් නිම කර යවා, තමනට වැඩියෙන් මුදල් උපයන්නටත්, රටට වැඩියෙන් මුදල් -රන් රිදී ගෙනෙන්නටත්, හැකියාව ඇතැයි වෙළෙන්දන් තර්ක කළහ. මෙයින් රීති ටිකක් ලිහිල් කිරීම සිද්ධ විය. එංගලන්තය සහ ප්‍රංශය රන් හා රිදී අපනයනයේ දී කැට කුට්ටි වලට තිබූ තහනම අයින් කර කාසි වලට පමණක් සීමා කළහ. ඕලන්දය කාසිවලට තිබූ තහනම ද අයින් කළහ.

එවිට අවධානය යොමු වූයේ වෙළඳ ශේෂය වෙතටයි. මායිම් හරහා නිදහස්ව වෙළඳාම වෙද්දී රන් සහ රිදී කොතරම් ශුද්ධ ප්‍රමාණ වලින් පිටරටට යනවාදැයි හා රට තුලට එනවා දැයි විපරම් කිරීමයි. අනෙක් පැත්තෙන් දේශීය වෙළඳාම -ඊට වඩා කොතෙකුත් වැඩියෙන් වැදගත් වුවත්- නොසලකා හැරිණ. රටට කිසිත් මුදලක් එන්නේ නැතැයි ද, රටෙන් පිටවෙන්නේ නැතැයි ද, ඒ නිසා දේශීය වෙළඳාමෙන් රටක් ධනවත් වෙන්නේ හෝ දුප්පත් වෙන්නේ නැතැයි ද සැලකීම, එය නොසලකා හැරීමට දැක්වූ හේතුව විය. නමුත් සැබැවින්ම, ජාත්‍යන්තර වෙළඳාම ගැන වැඩි සැලකිල්ලකින් යුතු වීම නුසුදුසු වූවකි. රන් හා රිදී ආනයනය අපනයනය සිද්ධ වෙන විදේශ වෙළඳාම යනු රටක වෙළඳාමේ ඉතා සුළු කොටසක් පමණකි: බොහෝ ධනය නිර්මාණය වනුයේ සහ පරිභෝජනය වනුයේ දේශීය වශයෙනි. රටවල් අතර සිද්ධ වෙන රන් හා රිදී සංචලනය යනු ශ්‍රේෂ්ඨ රටක් විනාශයට ගෙනියන්නට තරම් හැකියාවක් නැති වූවකි.

ධනවස්තු පවතින්නේ මුදල් තුල යැයි සිතීම ඒ නිසා වැරදි දැක්මකි. මුදල් යනු හුවමාරු මාධ්‍යයක් පමණි. එය ප්‍රයෝජනවත් වනුයේ හැමෝම එය බාරගන්නා නිසයි. ඒත් එය බාරගනිද්දී මිනිස්සුන්ට අවශ්‍ය වනුයේ මුදල් නොවේ, මුදල් වලින් මිල දී ගත හැකි දේවල් වෙති. පැහැදිලිවම, අනෙක් හුවමාරු භාණ්ඩ වලට වැඩියෙන්, රන් හා රිදී කල්තබා ගත හැකියාවෙන් වැඩි නිසා එය ගුණාංගයකින් යුතුය. කල්තබා ගත හැකියාවේ අගය ද ඒ නිසා ඒවායේ ප්‍රයෝජනවත් බවට එකතු වේ. නමුත් කල්තබාගැනීම පමණක් ප්‍රමාණවත් නැත: අපි ප්‍රංශයෙන් වයින් ආනයනය කරමින් ඔවුනට ලෝහ භාණ්ඩ යවන්නට ඉතා කැමති වෙමු. එසේ නමුදු, ප්‍රංශ වැසියන් ඔවුන්ගේ ආහාර උයාගන්නට අවශ්‍ය පමණින් මිසෙක, ඒවා කල්තබාගත හැකි වූ නිසා පමණින් වැඩිපුර හට්ටි මුට්ටි එකතු කර නොගනිති. එසේ කිරීම සම්පත් සම්පූර්ණයෙන් නාස්ති කර දැමීමකි. එම තර්කයෙන්ම, අපි වගේම, වෙන කිසිම රටක් ද, වෙළඳාම පහසු කරන අවශ්‍යතාවයට වඩා රන් රිදී එකතු කරගැනීමට සිතිය යුතු නැත. එය ද නාස්තියකි. ආහාර, වස්ත්‍ර, සහ අපේ ජනතාව නඩත්තුවට හා රැකියාවෙන් පවත්වා ගන්නට අවශ්‍ය සම්පත් එවිට නිශ්චල ප්‍රාග්ධනයක් බිහි කරයි. මුදල් යනු හට්ටි මුට්ටි ලෙසින්ම වූ මෙවලමකි.

*මුදල් යනු ධනය යැයි සිතන මර්කන්ටයිල් විශ්වාසයේ වැරදි පෙන්වා දීමෙන් පසුව ස්මිත් පිවිසෙන්නේ, මුදල් පිටරටට ගලා යෑම වළක්වන්නට කියමින්, මර්කන්ටයිල්වාදීන් පිහිටුවා ගත් වෙළඳ බාධක වලට පහර දෙන්නටයි.*

වෙළඳාමට බාධක

මර්කන්ටයිල් මත දැරූ අයගේ මුදල් ගැන තිබූ වික්ෂිප්තයෙන් ප්‍රේරණය වී ආනයන සඳහා ඉහළ තීරු බදු පැනවීම හෝ තහනම් පැනවීම යනු රටේ දේශීය නිෂ්පාදකයන්ට දේශීය වෙළඳපොල තුල කාර්යක්ෂම වූ ඒකාධිකාරයක් හදා දීමයි. උදාහරණයක් හැටියට පණ ඇති ගවයන් ආනයනය තහනම් කිරීම නිසා දේශීය ගවයන් ඇතිදැඩි කරන අයට මස් සැපයුම සඳහා ඒකාධිකාරයක් ලැබේ. වූල් ආනයනයට තහනමක්

පැනවීමෙන් වුල් කර්මාන්තයේ යෙදී සිටින අයට ඒකාධිකාරයක් ලැබේ. සිල්ක් කර්මාන්තයේ යෙදෙන අයටත් එවැනිම වූ වාසියක් ලැබේ. වෙනත් වෙළඳාම් වලට ද එය එසේම බලපායි.[38]

නමුත්, කලින් පැහැදිලි කළ ආකාරයෙන්, සංවර්ධිත රටක රැකියාවේ යොදවාගත හැකි මිනිසුන් සංඛ්‍යාව එහි සවලව පවත්වාගත හැකි ප්‍රාග්ධනයට සමානුපාතික වේ. පවතින ප්‍රාග්ධනයෙන් නඩත්තු කරත හැකි ප්‍රමාණය ඉක්මවා යමින් මෙවැනි රෙගුලාසි වලින් රැකියා වැඩි කිරීම කිසි සේත් කළ නොහැකියි. එක රැකියා ක්ෂේත්‍රයකින් තවත් ක්ෂේත්‍රයකට මාරු කර හැරීම පමණක් එහි දී සිද්ධ වේ. ව්‍යාපාරික ප්‍රජාව ස්වභාවයෙන්ම නැඹුරු වෙන්නේ සිය ප්‍රාග්ධනය වැඩියෙන්ම අගයක් උත්පාදනය කරන්නෙහි ආයෝජනය කිරීමටයි. දුර බැහැරක ඉන්නා නීති සම්පාදකයෙක්ට වඩා හොඳින් පරිස්ථානීය දැනුම වැඩියෙන් ඇති ඔවුන් මේ ගැන නිවැරදි විනිශ්චයන් ගන්නට සැබැවින්ම හපනුන් වෙති. එසේම එවැනි දැවැන්ත ආර්ථික බලයක් නීති සම්පාදකයන්ට දීම එහිම පවතින අවදානමකි.[39]

*ඉහත කාරණය දැක්වීමේ දී පමණක් ජාතීන්ගේ ධනය පොතේ අදිසි හස්තය ගැන සඳහන දකින්නට හැකියි. කෙසේවුවත්, ඇඩම් ස්මිත් ලියන්නට පෙර ද අදිසි හස්තය -ඒකීයපුද්ගලයන් ස්වාර්ථයෙන් යුතු පුද්ගලික ක්‍රියා තුලින් ක්‍රියාකරන සමාජ ක්‍රමයක් නිෂ්පාදනය කරනවා- යන අදහස දකින්නට තිබිය ද, මෙහි දී කරන මේ විශේෂ සඳහන තරමක අණ්ඩාකාර බවකින් යුතුයි.*

දේශීය නිෂ්පාදන වලට වඩා අඩු මිලකින් විදේශ නිෂ්පාදන ලැබෙන්නේ නැත්නම්, එවිට දේශීය නිෂ්පාදකයන්ට දේශීය වෙළඳපොලක ඒකාධිකාරය හදා දීම ප්‍රත්‍යක්ෂයෙන්ම තේරුමක් රහිත ය. අනෙක් පැත්තෙන්, විදේශ භාණ්ඩ සැබැවින්ම අඩු මිලකින් ලැබෙන්නේ නම්, එවිට රෙගුලාසි දැමීම හානිකර ය. වෙනතකින් අඩුවට ගත හැකි වූව ගෙදර දී හදාගන්නට යාම නාස්තිකාර හැදියාවකි. සන්නාලියා ගෙදර දී තමන්ගේ සපත්තු හදාගන්නට නොයයි. එසේම සපතේරුවා ඔහුගේ ඇඳුම් මහගන්නට නොයයි. රටවල් ද කළ යුත්තේ තමනට අඩුවෙන් හදාගත හැකි දේවල් හදාගැනීම සහ නිෂ්පාදනයට වැඩි මිලක් යන දේවල් මිල දී ගැනීමයි.

> වීදුරු, රස්නයෙන් යුතු පාත්ති සහ රස්නයෙන් යුතු ළිං හැදීමෙන් ස්කොට්ලන්තයේ දී ඉතා හොඳ මිදි වවා ගත හැකියි. එසේම ඒවායෙන් ඉතා හොඳ වයින් ද පෙරාගත හැකියි. හැබැයි එහි දී එවැනිම හා සමාන වූ ප්‍රමිතියෙන් යුතු විදේශ රටකින් ගත හැකි වූවට වඩා තිස් ගුණයකින් වියදම් වැඩි වේ. ස්කොට්ලන්තයේ දී ක්ලැරෙට් හා බර්ගන්ඩි සෑදීම දිරිගැන්වීම පිණිස පමණක්, එහි දී ආනයනය කරන සියළු විදේශීය වයින් තහනම් කිරීම සාධාරණ නීතියක් ද?[40]

වෙළඳ සීමාවන් මෙවලමක් හැටියට භාවිතා කරන්නේ වෙළඳ ශේෂය අහිතකර තත්වයකට පත්වීම වළක්වා ගැනීම පිණිස යැයි ඊට පාක්ෂික වූවන් කියති. ඒත් අපි දුටු අන්දමට, විදේශ වෙළඳාම යනු එතරම් වැදගත්කමකින් යුතු වූවක් නොවේ. රටක් එය පරිභෝජනය කරනවාට වඩා වැඩියෙන් නිෂ්පාදනයේ යෙදෙන්නේ නම්, එවිට එය ඉතිරි කරමින් එහි ප්‍රාග්ධනය වැඩි කරයි. එවැනි රටකට අපනයන කරනවාට

---

[38]ජාතීන්ගේ ධනය, IV පොත, II පරිච්ඡේදය.

[39]ජාතීන්ගේ ධනය, IV පොත, II පරිච්ඡේදය, 456 පිටුව, 10 වගන්තිය.

[40]ජාතීන්ගේ ධනය, IV පොත, II පරිච්ඡේදය, 458 පිටුව, 15 වගන්තිය.

වැඩි ප්‍රමාණයක් ආනයනය කරන්නට හැකියි. මෙය වෙළඳ ශේෂයක් හැටියට අහිතකර වුවත්, එයින් අතිරික්ත වැඩි කරමින් ධනවත් බව වැඩි කරයි.

යුක්ති සහගත සහ අයුක්ති සහගත වෙළඳ බාධක

වෙළඳ බාධක යනු මුළු රටේ සියල්ලන් සඳහාම බදු පැනවීමයි. ඒත් බොහෝ විට ඒවා වෙනුවෙන් පාක්ෂික වනුයේ, 'විශේෂ අවස්ථා' සඳහා ඩීල් ගැසීම අත්‍යාවශ්‍ය යැයි කීමෙනි. නිදසුන් වශයෙන් විදේශ වයින් හා බියර් සඳහා බ්‍රිතාන්‍ය තීරු බදු යුක්ති සහගත කරනුයේ එයින් සුරාසොඬ බව අඩු කළ හැකි යැයි කියමිනි. එය අපූරු ප්‍රකාශනයකි. ප්‍රංශය, ඉතාලිය සහ ස්පාඤ්ඤය වැනි වයින් නිෂ්පාදනයේ යෙදෙන රටවල් යුරෝපයේ බීමතින් අඩුම පුද්ගලයන් වාසය කරන රටවල් වෙති. සැබැවින්ම, සමහර අවස්ථාවල දී මත්පැන් අනිසි ලෙසින් භාවිතය සිද්ධ විය හැකියි. ඒත් අනෙක් දේවල් සියල්ල මෙන්ම, එය ද අපි තනිවම හදා ගන්නවාට වඩා අඩු මිලකින් අපිට මිල දී ගන්නට හැකිනම් වැඩියෙන් හොඳයි. කාරණය කුමක් වුවත්, බ්‍රිතාන්‍ය වෙළෙන්දන් තමන්ගේ නිමි භාණ්ඩ වලට වැඩි හොඳ පාරිභෝගිකයන් ඉන්නේ පෘතුගාලයේ යැයි කියා ඔවුනට වාසි වෙන ආකාරයෙන් තීරු බදු පනවා තිබීම නම්, මෙය සාධාරණීය කරන්නට ගොතන ලද බොරුවකි. මෙය ශ්‍රේෂ්ඨ රටක විශේෂ වරප්‍රසාද ලත් පිරිසක් විසින් ප්‍රතිපත්ති විකෘති කරන ලද අවස්ථාවක් දක්වන උදාහරණයකි..[41]

ඉතින් කුමන අවස්ථාවක දී වුවත්, අපේ අසල්වැසියන් දුප්පත් කරන උත්සාහයෙන් අපිට සමෘද්ධිමත් විය නොහැකියි. ජාතියක් ධනයෙන් වර්ධනය වෙන්නේ ඔවුන් සමඟ ගණුදෙනු කරන අසල්වැසියන් ද ධනවත්, කාර්යශූර, වෙළඳාමේ නියැළෙන ජාතියක් වෙද්දී මිසෙක ඔවුන් දුප්පතුන් වෙද්දී නොවේ.

*ඕනෑම හුවමාරුවක දී ජයග්‍රහණය කරන්නෙක් සහ පරාජය වන්නෙක් සිටිය යුතු යැයි පවතින පොදු අභ්‍යුපගමනයට මෙහි දී ස්මිත් පහර දෙයි. ජාත්‍යන්තර වෙළඳ ප්‍රතිපත්තිය හමුවේ, මෙයින් හටගත් අදහස නම්, රටක් ධනවත් වෙන්නේ අනෙක් රටවල් දුප්පත් කරමින් ඔවුන්ගේ මුදල් ගැනීමෙන් පමණක් කියායි. ස්මිත් විසින් පෙනී සිටින්නේ නූතන දැක්ම වෙනුවෙනි. එනම්, ස්වේච්ඡාවෙන් යෙදෙන ගණුදෙනුවක දී දෙපැත්තම යහපත අත්පත් කරගන්නවා යන්නටයි. ඉතින් පෙර පැවති අභ්‍යුපගමනය වැරදි වුවකි. ඒ නිසා, එම ප්‍රතිපත්තිය ප්‍රතිඵලයට විරුද්ධ වූ ප්‍රතිඵලය ගෙනෙයි. එහෙත්, විදේශ වෙළඳාමට යම් තාවකාලික බාධා පැනවිය හැකි සීමිත අවස්ථා කිහිපයක් යුක්ති සහගත බව ස්මිත් පිළිගනියි. ඒවා ගැන ඔහු මෙසේ පැහැදිලි කරයි.*

යම් විශේෂ ක්ෂේත්‍රයක් රටේ ආරක්ෂාවට ඉතා වැදගත් වෙද්දී, පැහැදිලිවම එවිට තීරු බදු වෙනුවෙන් පාක්ෂික විය හැකියි. ඕලන්දයේ නාවුක බලය අඩු කිරීම පිණිස ගෙනෙන ලද නාවුක පනත උදාහරණයක් හැටියට දක්වන්නට පුළුවන. ඒත් එහි වැයක් තිබුණි. අපේ වෙළඳපොලේ බඩු විකුණන්නට විදේශිකයන්ට අවහිර ගෙනෙද්දී, ඔවුන් මිල දී ගන්නට ද එන්නේ නැත. වෙළඳ සම්බාධකය නිසා ඔවුන් ධනවත් බැවින් අඩු විය හැකියි. නැත්නම් ඒ වෙනුවට ඔවුන් වෙනත් ජාතීන් සමඟ වෙළඳ හවුල් හදා ගෙන අපෙන් වෙනුවට ඔවුන්ගේ වෙළඳපොලෙන් මිල දී ගනු ඇත.

---

[41]ජාතීන්ගේ ධනය, IV පොත, III පරිච්ඡේදය, 493 පිටුව, c8 වගන්තිය.

සබන්, ලුණු, හම් සහ ඉටිපන්දම් වැනි දේශීය වශයෙන් යම් හේතුවක් නිසා බදු පැනවී තිබෙන දේවල් ම, විශේෂයෙන් එද්දී ඒවාට ද බද්දක් පැනවිය යුතු යැයි කීමට හැකියාවක් තිබෙන්නට ද පුළුවන. එයින් දේශීය සහ විදේශීය නිෂ්පාදකයන් අතර තරඟය එකම තලයකට ගෙනෙනු ලබයි. කෙසේ වෙතත්, මේ ප්‍රතිපත්තිය, දේශීය නිෂ්පාදකයන් කැමැත්ත දක්වන තරමට, ඔවුන්ගේ දේශීය නිෂ්පාදන හා තරඟයේ යෙදෙන සියළු විදේශීය අපනයන සඳහා බදු පැනවීම ඉඩ දිය යුත්තක් නොවේ. බදු වලින් මිල ගණන් ඉහළ යයි. එයින් බරක් පැටවෙන්නේ පාරිභෝගිකයාටයි. අවශ්‍යතාවයන් සඳහා පැනවෙන බදු විශේෂයෙන් දුෂ්ට වෙති.

අනිත් රටවල් අප වෙත දමන ලද වෙළඳ සීමා අයින් කරවනු වස්, ප්‍රතිප්‍රහාර හැටියට අපනයන තීරු බදු හෝ තහනම් පැනවීම ද කළ යුතු යැයි කීමට ද හැකියාවක් තිබෙන්නට පුළුවන. එවැනි ප්‍රතිපත්තියකින් ඵලක් වේදැයි සාකච්ඡා පවත්වා තීරණ ගැනීම දේශපාලනඥයන් නමැති කපටි කෛරාටික සත්වයන්ට බාර වූවකි. නමුත් එවැන්නක් ඵලදායී වන්නට කිසිත් හැකියාවක් නැත්නම් ඇයි අපි තීරු බදු පනවා ගනිමින් තවත් අපිටම හානි පමුණුවා ගන්නේ?

වෙළඳාම ඇණහිටුවන ලද්දේ තහනම් හා තීරු බදු වලින් නම්, හදිසියේම ඒවා ඉවත් කර නිදහස් වෙළඳාම ප්‍රතිෂ්ඨාපනය කළොත් පවතින තත්වය කඩාකප්පල් වේයැයි කියා ඒවාට හිමිහිට යළි ඉඩදිය යුතු යැයි සමහරු තර්ක කරති. ඒත් සැබැවින්ම, විදේශීය වෙළඳාම යනු රටේ කර්මාන්ත අතරේ ඉතා කුඩා අංශයකි. එනිසා ඇතිවන යම් කඩාකප්පල්වීමක් ද කුඩා වූවකි. එයට භාජනය වන බොහෝ අයට වෙනත් රස්සාවල් පහසුවෙන් සොයාගත හැකිවේ. විශේෂයෙන්ම ශ්‍රම වෙළඳපොලේ බාධක ඉවත් කරන්නේ නම්. අනතුරුව ඒ ක්‍රියාවලියෙන් මුළු රටම වාසි ලබනු ඇත.

අවාසි, දීමනා, මිල පාලන සහ වෙළඳ අනුග්‍රහ

අවාසි -අපනයනකරුවාට දේශීය වශයෙන් ගෙවූ බද්ද ආපහු ලබාගැනීමට හැකිවෙද්දී, හෝ ආනයන ගාස්තු යළි-අපනයන කරද්දී ආපහු ලබාගන්නට හැකිවෙද්දී- කර්මාන්තයක් එහි ස්වභාවික මට්ටමෙන් එහාට යා හැකි උත්තේජනයක් නොලබයි. ප්‍රතිපත්තිමය වශයෙන්, බද්දක් නැතිවෙද්දී තිබි ක්‍රියාකාරී තත්වයටම එහි දී නැවත පිවිසීම පමණක් සිදුවේ. කෙසේනමුත්, මේ බදු සහන ගැන වූ විශේෂ රීති කොතරම් සංකීර්ණ දැයි කිවහොත්, ඒවා කඩාකප්පල්කාරී තත්වයන් ඇති කර, බොහෝ විට ප්‍රෝඩාව ද කැඳවා ගනියි.[42]

දීමනා -අපනයන සහනාධාර- සකස් වී ඇත්තේ ඒවා නැතිව ලාබයක් උපයන්නට නොහැකි භාණ්ඩ අපනයනය කිරීමේ යෙදෙන අපේ විදේශ වෙළඳාම දිරිගන්වන්නටයි. නමුත් නැවතත්, මේ දීමනා වෙළෙන්දන්ට ලැබෙන්නේ නැත්නම්, ඔවුන්ගේ ප්‍රාග්ධනය ඔවුන් වෙනත් වඩා ලාබදායක වූ ක්ෂේත්‍ර වලට යොදවනු ඇත. රටේ වෙළඳාම වෙනස් වූ, වාසි අඩු පැත්තකට බලාත්කාරයෙන් යොමු කරවීම ඕනෑම ආකාරයක සහනාධාර වලින් සිදුවේ. එය මහජනතාව වෙත දෙවරක් අය බදු පැටවීමකි: මහජනයා විසින් සහනාධාරයට මුල්‍ය සපයන්නට බදු ගෙවන්නට සිද්ධ වේ, ඊ ළඟට ඔවුන්ට වෙනත් තැනකින් ලාබෙට ගන්න හැකි භාණ්ඩයට දැන් වැඩියෙන් ගෙවන්නට සිද්ධ වේ.[43]

---

[42]ජාතීන්ගේ ධනය, IV පොත, IV පරිච්ඡේදය.
[43]ජාතීන්ගේ ධනය, IV පොත, IV පරිච්ඡේදය සහ V පරිච්ඡේදය.

සහනාධාර ප්‍රෝඩාවන්ට ද විවෘත වූවකි. උදාහරණයක් හැටියට සුදු හෙරින් මාළු කර්මාන්තයට ලැබෙන සහනාධාර නියම වෙන්නේ නැවේ බර ටොන් ගණන අනුවයි. නැතිව ධීවරයන් මසුන් අල්ලන කඩිසර බව හෝ සාර්ථකත්වය අනුව නොවේ. අල්ලන මාළු ප්‍රමාණය වැඩි කරගැනීම සඳහා කටයුතු කිරීම වෙනුවට සහනාධාර වැඩියෙන් ලබාගන්නට නැව් බර වැඩි කරගන්නට කටයුතු කිරීම ගැන ඒ නිසා පුදුම විය යුතු නැත. මේ ක්‍රියාවලියේ දී, සහනාධාරය නිසා පරිස්ථානීය වෙරළබඩ ධීවර කර්මාන්තයට හානි සිද්ධ විය. අත්‍යාවශ්‍ය උපකරණ වල මිල ගණන් ඉහළ යවන්නට සමත් විය. උදාහරණයක් හැටියට, බැරල් මිල සිලිම් තුනක සිට හය දක්වා දෙගුණයකින් ඉහළ ගිහින් තිබේ.

> සුදු හෙරින් මාළු කර්මාන්තයට ලැබෙන දීමනාව ටොන් ප්‍රමාණය ගැන වූ දීමනාවකි; මසුන් ඇල්ලීමේ කඩිසරකම හෝ සාර්ථකත්වය නිසා නොව එය නැවේ බඩුවල බරේ ප්‍රමාණයට සමානුපාතිකව ගෙවන්නකි; ඒ නිසා එයින් නැව් හැඩගැස්වෙන්නේ අල්ලා ගන්නා පරම චේතනාව පෙරදැරි කරගෙනය, ඒ මසුන් අල්ලන්නට නොවේ, දීමනාව අල්ලා ගන්නට යැයි මම කණගාටුවෙන් කියමි.[44]

තවත් මැදිහත්වීම් ආකාරයක් නම් මිල පාලනයයි. ධාන්‍ය නිෂ්පාදන කර්මාන්තය තවත් එවැනි පාලන සඳහා භාජනය වෙන්නකි. අස්වනු අඩු වෙද්දී, මිල ගණන් ඉහළ යයි. නමුත් එවිට රජය විසින් පාරිභෝගිකයාගේ උදව්වට එමින් මිලට සීමා පනවද්දී, එයින් ධාන්‍ය වෙළඳපොලට ගෙනෙන නිෂ්පාදකයන්ව අධෛර්ය කරවයි. නැත්නම් පාරිභෝගිකයන්ව හනිකව එය මිල දී ගන්නට පොළඹවයි. ඒ අස්වනු කාලය සහතිකයෙන්ම හිඟයෙන් සහ සාගතයෙන් අවසන් වෙයි. අස්වනු නරක් වීම වැළැක්විය නොහැකි වූවකි: ඒත් සමනය කරගත හැකි හොඳම ක්‍රමය වනුයේ ගොවියාට සහ වෙළෙන්දාට සීමා හා පාලන නොමැති නිදහසක් ලබා දීමයි.

අනෙක් වෙළඳපොල මැදිහත්වීම සිද්ධ වෙනුයේ ආනයන මනාප වලින්. යම් විශේෂ භාණ්ඩ රටට ගෙන එන්නට පූර්ණ අයිතිය සමහර රටවල් වලට පමණක් ලබා දේ. එසේ නැත්නම් අනෙක් අයට පැනවූ තීරු බදු වලට වඩා අඩු මට්ටමකින් ගෙනෙන අයිතිය ලබා දේ. උදාහරණයක් හැටියට එංගලන්තයට යවන වයින් සඳහා සාමාන්‍ය තීරු බදු වලින් තුනෙන් දෙකක් පමණක් ගෙවන අවසරය පෘතුගාලයට ගිවිසුමකින් ලැබිණ. අපනයන මනාප නිසා අපනයන කරන රටේ වෙළෙන්දන්ට හා නිෂ්පාදකයන්ට පැහැදිලිවම වාසි සැලසෙනවා යැයි පෙනුන ද, ඒවා ලබාගන්නා රටේ අයට එය අවාසියකි. මන්ද එයින් ලෝක තරඟයට ඇති ඉඩකඩ අහිමි වෙයි. එහි දී ඒකාධිකර ආනයනය සඳහා වැඩියෙන් ගෙවන්නට සිද්ධ වේ.

යටත්විජිත වෙළඳ සීමා

රටවල් තමන්ගේම යටත්විජිත වලට ද වෙළඳ සීමාවන් පනවති. මර්කන්ටයිල් දැක්ම අනුව යමින්, යටත් විජිත සොයා ගැනීමේ සාමාන්‍ය ප්‍රේරණය වූයේ රන් සහ රිදී සොයාගැනීමට හැකියාව තිබීමයි. කොලම්බස් පටන්, ස්වදේශී ජනතාව ක්‍රිස්තියානි ආගමට හැරවීමේ භක්තිමත් අරමුණ මේ ව්‍යාපෘතිය සුද්ද කරන්නට යොදාගැනෙන්නට ඇත. ඒත් ඔවුන්ගේ සැබෑ බලාපොරොත්තුව වූයේ නිදන් සොයා ගැනීමයි. ඔජෙඩා, නිකුසා, සහ වස්කෝ නුන්‍යයෙස් ඩ බල්බෝවා සිට ඩැරියෙන් දක්වා, කෝර්ටෙස් සිට මෙක්සිකෝ දක්වා, සහ ඇල්මාග්‍රෝ සහ පිසාරෝ සිට චිලේ සහ පෙරු දක්වා සිද්ධ වූයේ එයයි. ඒත් නිදන් සොයා ගැනීම

---

[44]ජාතීන්ගේ ධනය, IV පොත, V පරිච්ඡේදය, 520 පිටුව, 32 වගන්තිය.

අවිනිශ්චිත මෙන්ම අනර්ථකර වැයමකි. බ්‍රසීලයේ රන් රිදී හෝ දියමන්ති නිධි සොයා ගන්නට සමත් වෙන්නේ එහි මුල් පදිංචිය පටන්ගෙන වසර සියයක් ගෙවී ගියාට පසුවයි.[45]

නමුත් හානි පූරණයන් ද තිබිණ. පාළු බිම් හෝ යාන්තමට ජනාවාස වූ භූමිවල ඉදි වූ යටත්විජිත අනෙක් සමාජවලට වඩා වඩාත් ඉක්මණින් ධනයෙන් හා ශ්‍රේෂ්ඨත්වයෙන් ඉහළට යන්නට සමත් වූහ. යටත්විජිත වාසීන් කෘෂිකර්මය සහ වෙනත් ප්‍රයෝජනවත් කුසලතා ද රැගෙන ආහ. නිත්‍ය රජයක හැදියාවත්, එහි පරිපාලනයට සහ නීති පද්ධතියට අවශ්‍ය සහාය දීමේ හැකියාවත් ඔවුන් සතුව තිබිණ. ඔවුනට කුලී ගෙවන්නට සිද්ධ නොවීය. බදු අවම වූහ. නමුත් භූමිය ඕනෑතරම් තිබුනේ, වැඩට ගත හැකි සියළු දෙනාවම යොදාගත්ත ද, කිසිම අයිතිකරුවෙකුට එම භූමියට නිෂ්පාදනය කළ හැකි ප්‍රමාණයෙන් දහයෙන් එකක්වත් නිෂ්පාදනයට නොහැකි තරමටයි. අයිතිකරුවන් ඒ නිසා ඉතා උනන්දු වූයේ වැඩි වැඩියෙන් තව ශ්‍රමිකයන් එකතු කරගන්නටයි. ඔවුන්ගේ මෙහෙය සඳහා හොඳින් පඩි ගෙවන්නටයි. ඒත් මේ ඉහළ වේතන, ලාබ ඉඩම් හා එකතු වෙද්දී, ඒවායේ වෙහෙස වූ ශ්‍රමිකයන්ට ඒවායේ ඉඩම් හිමියන් වෙන්නට අවස්ථාව ඉතා ඉක්මණින් ලැබුණි. අනතුරුව ඔවුන් ද, කලින් සේ ම හොඳ වේතන ගෙවමින් තමන්ට වැඩ කරන ශ්‍රමිකයන් සොයාගන්නට වෙහෙසුණහ.  චක්‍රය තවමත් එසේම පවතියි.

නව යටත්විජිතයකට සමෘද්ධිය ලබන්නට නම්, ප්‍රධාන වූයේ නොමඳ ලෙස හොඳ භූමියක් තිබීම සහ ඔවුන්ගේ කටයුතු පරිපාලනය කරගන්නට නිදහසකි. අනෙක් සියල්ලටම වඩා වේගයෙන් වර්ධනය වූයේ උතුරු ඇමෙරිකාවේ ඉංග්‍රීසි ජනපද වූහ. ඉඩම් ලාබ වූහ. ශ්‍රමය මිල අධික විය. ඔවුන්ට අවශ්‍ය නිෂ්පාදන සියල්ලම බ්‍රිතාන්‍යයෙන් ගෙන්වා ගන්නට හැකියාව තිබිණ. මේ කාරණා හේතුවෙන්, බ්‍රිතාන්‍යයේ ඒකාධිකාරය ආරක්ෂා කරගැනීම පිණිස සමහර කර්මාන්ත වල යෙදෙන අවසරය ඔවුනට තහනම් කිරීම නිසා, ප්‍රායෝගික වශයෙන් වූයේ සුළු හානියකි. ඒත් ඔවුන්ගේ ආර්ථිකය වර්ධනය වීමත් සමඟ, එවැනි තහනම් සැබෑ පීඩනයක් වන්නට ඒවා දිගින් දිගටම පවත්වාගෙන යන්නටත් නොහැකි වනු ඇත.

ඔවුන්ගේ මාතෘ භූමි සමඟ පමණක් වෙළඳාමේ යෙදෙන්නට බලාත්කාරකම් කරන උතුරු ඇමෙරිකන් යටත්විජිත ප්‍රතිපත්තිය බ්‍රිතාන්‍යයට ද අනතුරුදායක ය. එයින් බ්‍රිතාන්‍යයේ ප්‍රාග්ධනය වෙනත් වෙළඳපොලවල් වලින් අයින් කර යටත්විජිත වෙළඳාමේ හිරවේ. මේ පමණට වඩා විශාල වූ වෙළඳපොලේ එවිට බ්‍රිතාන්‍ය කර්මාන්ත වල අස්වාභාවික වූ වැඩි සමානුපාතිකයක් අවදානමට ලක්වේ. වෙළඳාම කඩාකප්පල් වේ යන තර්ජනය ඉදිරියේ, ස්පාඤ්ඤ ආමඩාව හෝ ප්‍රංශ ආක්‍රමණ වල දී පවා නොදැනුණු දැඩි භීතියක් බ්‍රිතාන්‍යයේ ජනතාව වෙළාගෙන සිටියි.

බ්‍රිතාන්‍යයට සිය යටත්විජිත සමඟ වෙළඳාමට ඒකාධිකරයක් ලබාදෙන නීතිය ලිහිල් කිරීමෙන් අනෙක් රටවල් වලටත් ඔවුන් සමඟ වෙළඳාමට ඉඩ පැදීම, මෙයට ඇති එකම විසඳුමයි. ඒකාධිකාරය විසින් හාමතයට ලක්කර ඇති ප්‍රාග්ධනය වෙනත් බොහෝ ප්‍රයෝජන සඳහා එවිට නැවත පිවිසෙනු ඇත. දීර්ඝ කාලීන හානියක් ගෙන ඒම වළක්වා ගන්නට, මේ වෙළඳ නිදහස ක්‍රමයෙන් කළ යුත්තකි. උදාහරණයක් හැටියට යටත්විජිතයෙන් දුම්කොළ පීප්ප 82,000 ක් පටවාගත් නැව් ගෙන්වාගෙන ඒවායෙන් වෙනත් රටවලට යළි අපනයනය කරන වෙළඳාම බ්‍රිතාන්‍යයට හිටිහැටියේ නැතිවුනොත් එය මහා ආර්ථික කම්පනයක් වනු ඇත.

---

[45]ජාතීන්ගේ ධනය, IV පොත, VII පරිච්ඡේදය.

නමුත් මර්කන්ටයිල් ක්‍රමයේ ආකාරය එයයි: එය විශාල වියවුල් ඇති කරයි. එවිට ඒවාට පිළිසරණ යෙදීම ඉතා දුෂ්කරයි. යටත්විජිත ඒකාධිකාර වෙළඳාම නිසා කර්මාන්ත වලට දිරිගැන්වීමක් ලැබී නැත. නිතර හා ළඟපාතකින් ලබාගන්නවා වෙනුවට, ප්‍රතිලාභ සෙමෙන් සහ ඈතක සිට ලැබෙන වෙළඳපොලකට කර්මාන්ත හරවා යැවීම නිසා සැබැවින්ම සිද්ධ වී ඇත්තේ, බ්‍රිතාන්‍යයේ ප්‍රාග්ධනයෙන් අඩු ඵලදායිත්වයක් ලැබීමත් සහ ආදායම් සත්‍යයෙන්ම අඩුවීමත්ය.

ප්‍රාග්ධනය හැදෙන්නේ ආදායමෙන් හෝ ඉතිරි කිරීමෙන් පමණක් නිසා, බ්‍රිතාන්‍යයේ ප්‍රාග්ධනය ද ඉතා සෙමෙන් එකතුවෙන බව මෙයින් පෙනී යයි. එසේම අනාගතයේ වැඩිවෙන්නට තිබූ ආදායම් ද මේ නිසා අඩු වී යයි. ඒකාධිකාරය නිසා කුලිය ද යටපත් කරයි, කර්මාන්ත ලාබ ඉහළ යවද්දී එයින් ඉඩම් වැඩි දියුණු කිරීමට යෙදවෙන ප්‍රාග්ධනය අධෛර්යමත් කරවන නිසයි. එයින් ප්‍රාග්ධනය එකතුවීමත් අධෛර්ය කෙරෙන නිසා, දීර්ඝ කාලීනව, ලාබ හැටියට උපයන ආදායම ද සුළු ප්‍රමාණයක් වෙයි. වෙනත් විදියකින් කිවහොත්, කර්මාන්තකරුවන් කිහිප දෙනෙකුගේ යහපත පිණිස ගෙනෙන ලද ඒකාධිකාරයක් නිසා වේතන, කුලිය සහ ලාබ යන සියල්ලටම හානි පැමිණේ.

අස්වාභාවික වූ ඉහළ ලාබ මට්ටම්, ඒකාධිකාරයකින් ලැබෙන වැනි ලාබ මට්ටම් නිසා වෙළෙන්දාගේ ස්වභාවික අරපිරිමැස්ම විනාශ කර දමන සේයාවක් පෙනී යයි. ඉතිරි කිරීමට සහ යළි ආයෝජනයට යොදවනවා වෙනුවට, ඔවුන් එවිට අධික වැයෙන් යුතු සුඛෝපභෝගීත්වයට වියදම් කරනු ඇත. එවිට රටක අගනගරයක් එකතුකරනවා වෙනුවට පරිභෝජනයට පාත්‍ර වේ. නිදසුන් හැටියට කාඩිස් හෝ ලිස්බන් හි වෙළෙන්දන්ගේ සීමාතික්‍රාන්ත ලාබ නිසා ස්පාඤ්ඤයේ හෝ පෘතුගාලයේ අගනුවරවල් වර්ධනය වී නැත. එසේම ඒ හිඟන රටවල් දෙකේ දරිද්‍රතාවයට සහනයක් ගෙනෙන්නට හෝ කර්මාන්ත ප්‍රවර්ධනයට ද සමත් වී නැත. ලන්ඩනයේ වෙළෙන්දන් ලබන්නේ අඩු මට්ටම්වල ලාබ වෙති. නමුත් ඔවුන්ගේ තත්වය වඩා හොඳයි. ඇම්ස්ටර්ඩෑම් හි ලාබ මට්ටම් ඊටත් අඩුයි. නමුත් එහි සිටින සාවධාන සහ මසුරු බර්ගර්වරුන් ලන්ඩනයේ අයටත් වඩා ධනවත් වෙති.

*යටත්විජිත ප්‍රතිපත්ති ගැන ස්මිත් දක්වන අවධානය හුදු ශාස්ත්‍රීය නැඹුරුවක් පමණක්ම නොවන්නකි. ඔහු මේ ලියන්නේ ඇමෙරිකන් යටත් විජිතවාසීන් බ්‍රිතාන්‍යයෙන් සිය ස්වාධීනත්වය ප්‍රකාශ කරන්නට ඉතා ළංව සිටිය දී. අර්බුදය මඟ හරවා ගන්නට නම් කළ යුත්තේ වැඩියෙන් වෙළඳ නිදහසක් ද වැඩියෙන් දේශපාලන නියෝජිත සමානුපාතිකයක් ද දීමෙන් යැයි බ්‍රිතාන්‍ය පාලකයන්ට අවවාද කරන්නට ඔහුට අවශ්‍ය විය. ඒත් අවාසනාවට ඔහුගේ අවවාදය ප්‍රමාද විය.*

පුරාතන රෝමය ආරක්ෂාව සඳහා වැය දැරූ මිත්‍ර රාජ්‍යයන්ට පුරවැසිභාවයේ වරප්‍රසාදය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප විය. දැන්, බ්‍රිතාන්‍ය විසින් එහි ඇමෙරිකන් යටත්විජිත වාසීන්ට බද්දක් ගෙවන්නට යැයි තරයේ කියති. එහෙත් ඔවුනට පාර්ලිමේන්තු නියෝජනය ප්‍රතික්ෂේප කරයි. මෙයින් ඔවුන් අතර නොසතුට වැඩි වර්ධනය වී, සාමකාමී වෙළඳාමේ යෙදි ඇමෙරිකන් අයව මිලිටරි දේශපාලනඥයන් බවට හරවා ඇත. බ්‍රිතාන්‍යයට ඇති එකම විසඳුම යටත්විජිත වලට, ඔවුන් මහජන මුල්‍ය සඳහා ගෙවන ප්‍රමාණයට සාමානුපාතිකව තමන්ව නියෝජනය කරගන්නට අවසර ලබා දීමයි.

යටත්විජිතයන් ශක්තිමත්ව වර්ධනය වෙද්දී, මාතෘ ජාතීන්ට ඔවුන් හා කරන සම්පූර්ණ වෙළඳාමෙන් අර යුක්ති සහගත නොවන සහනාධාර වෙළඳාම මුලිනුපුටා දමන්නට තවත් අසීරු වෙයි. ඔවුන්ට ඉතිරි වෙන්නේ තම අධිකාරි බලය පවත්වා ගැනීමේ වැය දැරීම පමණකි. මර්කන්ටයිල් ක්‍රමයේ දී,

නිෂ්පාදකයාගේ වාසිය ප්‍රධානත්වයක් ගනියි. ඒත් නිෂ්පාදනයේ මූලික අරමුණ සැබැවින්ම පරිභෝජනයයි. ඒ නිසා නියාමාකරයෙන් සිද්ධ විය යුත්තේ පාරිභෝගිකයාගේ වාසිය ප්‍රධානත්වය ගැනීමයි.

> නිෂ්පාදනයේ අරමුණ සහ එකම අන්තය වනුයේ පරිභෝජනයයි; නිෂ්පාදකයාගේ වාසියට යම් අවධානයක් දිය යුතුයි, ඒත් එය දිය යුත්තේ පාරිභෝගිකයාගේ වාසිය ප්‍රවර්ධනය කරන්නට අවශ්‍ය තරමින් පමණකි..[46]

කෘෂිකාර්මික ක්‍රමය

ජාතියක ධනයේ සහ ආදායමේ එකම ප්‍රභවය වනුයේ ඉඩම් යන නිෂ්පාදනය යැයි අර්ථ ශාස්ත්‍රයේ දෙවැනි න්‍යාය ක්‍රමය ඉදිරිපත් කරයි. එයින් සමාජයක් කොටස් තුනකට බෙදයි: පළමුව, ඉඩම් අයිතිකරුවන්; දෙවනුව, ගොවියන් හා ගොවි ශ්‍රමිකයන්; තෙවනුව, ශිල්ප ශ්‍රේණී වෘත්තීන්, කර්මාන්තකරුවන් සහ වෙළෙන්දන් -ඵලදායී නොවන පංතිය හැටියට ඔවුන් දකිති.

අයිතිකරුවන් -ගොඩනැඟිලි, වතුර බැස යන මාර්ග, සහ ආවරණ වැනි දෑ ඉදිකරමින් ඉඩම් දියුණු කරන්නට වැය කිරීමෙන් ජාතික ආදායමට සහාය වෙනවා යැයි ඔවුන් තර්ක කරති. සත්ව පාලනයෙන්, ධාන්‍ය, ගවපට්ටි සහ ගොවි ශ්‍රමිකයන් නඩත්තුවෙන් ගොවියන් ද ජාතික ආදායමට දායකත්වයක් සපයති. නමුත් මේ ක්‍රමය තුල, කර්මාන්තකරුවන්ගේ සමස්ත දායකත්වය බිංදුවකි. ඔවුන්ගේ ශ්‍රමයෙන් ලැබෙන ප්‍රතිලාභය ඔවුන්ගේ වේතන, අමුද්‍රව්‍ය සහ උපකරණ වලින් හරියටම හරියන ලෙසින් කැපී යයි. ඉඩම් හිමියන් සහ ගොවියන් නිෂ්පාදනයට යොදාගන්නා අංගෝපාංගයන්ට අගයක් එකතු වීමෙන් මෙය සැබැවින්ම ප්‍රයෝජනවත් විය හැකියි. නමුත් ඔවුන් එම ප්‍රමාණයම වෙනත් තැනකින් පරිභෝජනයට ගනිති. උදාහරණයක් හැටියට තිරිඟු වගාවට හෝ ගවයන් ඇති කරන්නට අවශ්‍ය උපකරණ ඔවුන් සපයනු ලබයි. ඒත් ඔවුන් ගවයන් හා තිරිඟු අනුභවය ද කරනු ලබයි.

ඵලදායී නොවූවත්, එක අතකින් බලද්දී ඔවුන් කරනුයේ ධනය නැවත හැඩගැස්වීම පමණකි. මේ පංතිය ඒත්, වෙළඳපොල, උපකරණ සහ නිමි භාණ්ඩ සපයමින් නිෂ්පාදකයන්ට ඉතා ප්‍රයෝජනවත් අයයි. නිෂ්පාදකයන්ට ඔවුන්ව යටපත් කරන්නට කිසිත් හේතුවක් නැත: සැබැවින්ම වෙන්නේ එහි අනිත් පැත්තයි. ඔවුන් වැඩියෙන් නිදහසක් භුක්ති විඳින විට, ඔවුන් අතර තරඟය ද වැඩිවේ. එවිට ඔවුන් සපයන්නෙහි මිල ද අඩු වේ. එයාකාරයෙන්ම, අනෙක් පංති දෙක විසින් වඩියෙන් නිදහස භුක්ති විඳිද්දී, ඔවුන්ගේ ඉඩම් නිෂ්පාදනය කරන අතිරික්තයන් වැඩිවේ. එයින් ඵලදායී නොවන පංතියට ගන්නට හැකි දේ ද වැඩියෙන් පවතී. ඉතින් ඒ නිසා මේ ක්‍රමයට අනුව සමෘද්ධිය ප්‍රවර්ධනය කළ යුතු හොඳම ප්‍රතිපත්තිය නම් පූර්ණ නිදහසට ඉඩ දීමයි.

නිදහස පරිපූර්ණ විය යුතු අවශ්‍යතාවය ගැන මේ දැක්ම පමණට වැඩියෙන් කියා තිබෙනවා විය හැකියි. විවලා වූ ද සහ සමහර අවස්ථාවල දී නුදුසුසු වූ ද ආහාර පිළිවෙතක් අනුගමනය කළ ද, මිනිස් සිරුරකට පූර්ණ නිරෝගී තත්වයකින් සිටිය හැකි යැයි මෙයට සාදෘශ්‍යයක් හැටියට කියත හැකියි. ඒ හා සමානව, නිදහස් මහජන ප්‍රතිපත්ති නැතිව ද, ආර්ථිකයකට නොනැසී පවතින හැකියාව ඇතැයි පෙනී යයි. එහි වේගය අඩු වෙන්නට පුළුවනි. ඒත් එය නවත්වන්නට නොහැකියි.

---

[46]ජාතීන්ගේ ධනය, IV පොත, VIII පරිච්ඡේදය. , 660 පිටුව, 49 වගන්තිය.

*මේ දැක්ම වෙනුවෙන් ප්‍රධාන වශයෙන් පෙනී සිටින්නා වූ ටියුර්ගෝ, පුරෝගාමී අර්ථ ශාස්ත්‍රඥයෙක් පමණක් නොව මාරී ඇන්ටොනෙට්ගේ වෛද්‍යවරයා ද විය. අර්ථ ශාස්ත්‍ර ක්‍රමය හා මිනිස් සිරුරක් සංසන්දනය කිරීමෙන් ස්මිත් එහි දී ටියුර්ගෝගේ දර්ශනය උපමර්දනය ඔහුට අවබෝධ කරගන්නට හැකි ආකාරයකින් ඉදිරිපත් කරයි.*

කෙසේවුවද, කෘෂිකාර්මික ක්‍රමයේ ප්‍රධාන දෝෂය නම් ශිල්ප ශ්‍රේණී වෘත්තීන්, කර්මාන්තකරුවන් හා වෙළෙන්ඳන් වඳ හෝ ඵලදායී නොවන පංතියක් හැටියට දැකීමයි. පළමුව, මේ පංතිය ඔවුන්ගේ වැය පියවා ගන්නේ යැයි මේ න්‍යාය පිළිගනියි. දෙවනුව, පසු කාලයක දී විකුණා ගත හැකි, කල්පවතින දේවල් වලට අගයක් ඔවුන් සැබැවින්ම එකතු කරති: මෙය පැහැදිලිවම ඵලදායී ශ්‍රමයයි.

මේ අඩුපාඩු තිබිය ද, මෙම න්‍යායවාදී ක්‍රමය පවතින අනෙක් ක්‍රම අතරින් හොඳ එකකි. ධනය පවතින්නේ මුදල් තුල නොවේ, එය ඇත්තේ රටේ නිෂ්පාදනය තුල යැයි ද, එය වැඩි කරනු සඳහා ඇති හොඳම ක්‍රමය පූර්ණ නිදහස යැයි ද කියා එය හඳුනාගෙන ඇත. වෙළඳ සීමා සහ මනාප නැතිවෙද්දී, ජනතාවට තමන්ගේ වාසිය සොයා යන්නට නිදහස ලැබේ. එසේම ඔවුන්ගේ ප්‍රාග්ධනය සහ ශ්‍රමය අනෙකුත් අය සමඟ තරඟයට ගෙනෙන්නට අවස්ථාව පැදේ. ඔවුන් යටත් වෙන්නේ යුක්තියේ රීති වලට පමණි. ප්‍රාග්ධනය සහ ශ්‍රමය ඒවායෙන් වැඩිම වාසියක් ලැබෙන ප්‍රයෝජන වෙත ගලා යයි. ආර්ථික ජීවිතය නියාමනය කිරීමේ හෝ මගපෙන්වීමේ අවශ්‍යතාවයෙන් රජය නිදහස් වේ. සැබැවින්ම, පූර්ණ නිදහස ලැබෙන ක්‍රමයක රජයට පැවරෙන්නේ වගකීම් තුනක් ඉටුකරන්නටයි: ආරක්ෂාව, යුක්තිය සහ සමහර මහජන පහසුකම්.

> පෞද්ගලික මිනිසුන්ගේ කාර්යශූරත්වය අධීක්ෂණය කරන වගකීමෙන්, සමාජයේ වාසිය පිණිස හොඳම රැකියා වලට මගපෙන්වීමට යෑමෙන්, එනම්, මිනිස් ප්‍රඥාවට කිසි සේත් කළ නොහැකි වූ ද, ඊට අවශ්‍ය දැනුම කිසිසේත්ම ප්‍රමාණවත් නොවූ ද වගකීමෙන් රජය සම්පූර්ණයෙන් නිදහස් කරනු ලබයි..[47]

## V පොත: රජයේ භූමිකාව

### ආරක්ෂණ වියදම්

රජයක පළමු වගකීම, ආක්‍රමණිකයන්ගේ ප්‍රචණ්ඩත්වයෙන් සමාජය ආරක්ෂා කිරීමයි. ඒ නිසා රජයකට අනිවාර්යෙන්ම ඇති වැය ආරක්ෂාව වෙනුවෙනි.

දඩයම් ජාතීන් අතර, නිදසුන් හැටියට උතුරු ඇමෙරිකාවේ ස්වදේශී ගෝත්‍රිකයන් වැනි, ජනතාවට දඩයක්කාරයන් මෙන්ම රණවිරුවන් වෙන්නට ද සිද්ධ විය. ඔවුන් යුද වැදෙද්දී පවා ජීවිකාව වෙනුවෙන් ද ශ්‍රමය වෙහෙසන්නට සිද්ධ විණ. ඔවුන් නඩත්තු කරන සම්පත් දායකත්වයට රජෙක් හෝ පොදු ජන සංවිධානයක් නොවීය.

---

[47] ජාතීන්ගේ ධනය, IV පොත, IX පරිච්ඡේදය. , 687 පිටුව, 51 වගන්තිය.

තැනින් තැන ගිය එඬේර ජාතීන්, ටාටාර් සහ අරාබි වැනි, සියල්ලන්ටම නායකයෙක් සිටිති. ඒත් රණවිරුවන් ඔවුන්ගේ කණ්ඩයමේ දායකත්වයෙන් ජීවත් විය යුතුයි. මේ අය සහ, සම්පූර්ණ ජාතියම ඔවුන් සමඟ යුද්ධයට එකතු වෙති. එහි දී සමහර විට පරාජය කළ හතුරන්ගේ ධනවස්තුව අල්ලා ගැනීමේ හැකියාව ද පවතී.

කෘෂිකාර්මික යුගයේ දී, ජනතාව ස්ථිර වාසස්ථාන හදා ගත්හ. ගොවි ඉඩම් අත්හැර දමා යා නොහැක. ඉතින් අනෙකුත් අය ගෙදර සිටිය දී මිලිටරි යුගයේ මිනිසුන් යුද්ධයට ගියහ. ධාන්‍ය බීජ පොළව යට පවතින තාක්, ඒ කාලයේ දී ස්වභාව ධර්මය වැඩිම වැඩ ප්‍රමාණය ඉටු කරන නිසා, රණවිරුවන් නැතිව ඒ තාක් කල් සමාජයට පැවතිය හැකියි.

කාර්මික යුගයේ දී තත්වය වෙනස් විය. යකඩ තලන්නන්, වඩුවැඩ කාර්මිකයන් හෝ රෙදි වියන්නන් හැටියට වැඩ කිරීම නැවැත්වූ සැණින් ඔවුන්ගේ ආදායම ක්ෂණයෙන් නැතිවිණ. ජාතිය ආරක්ෂා කරන්නට යුද පිටියට යද්දී, ඔවුනට තමන්ව නඩත්තු කරගන්නට නොහැකි විය. ඒ නිසා මහජන පසුම්බියෙන් ඔවුන් නඩත්තු කිරීම අනිවාර්යෙන් අවශ්‍ය වූයේ නූතන මිලිටරි මෙහෙයුම් මාස ගණන් පැවති නිසයි. එසේම හමුදා උපකරණ ද තවත් සංකීර්ණ වී තවත් භීතිය උපදවන ආයුධ බවට පත්වූහ. ඒ සඳහා විශේෂ දැනුමක් සහිත වූ ශික්ෂණයෙන් යුතු හමුදාවක් ද අවශ්‍ය විය. මේ සියළු හේතු නිසා, දියුණු රටවල ආරක්ෂාව රජයේ මූලායෙන් සිද්ධ විය යුතුයි.

යුක්තිය

විදේශීය හතුරන්ගෙන් ජනතාව ආරක්ෂා කරගැනීමට රජය කටයුතු කරන සේ ම, එය දේශීය හතුරන්ගෙන් ද ජනතාව ආරක්ෂා කළ යුතුයි.

දඩයම් යුගයේ ජාතීන් අතර සැලකිය යුතු තරම් දේපල නොතිබිණ. අනුන්ට කරන හානියෙන් ලබාගත හැකි වැඩි යමක් නොවීය. යුක්තිය ස්ථාපිතයට විධිමත් පරිපාලනයක අවශ්‍යතාවයක් නොවීය. ඒත් දේපල පවතින්නේ ද, තත්වය වෙනස් වේ. හොරකමෙන් ලබාගත හැකි වාසි ඇත. ධනවතුන්ගේ ආශාවන් සහ ලෝබයන් ද, දුප්පතුන්ගේ පහසුව සඳහා වූ කැමැත්ත සහ වින්දනය ද නිසා පුද්ගලික දේපල ආක්‍රමණයට පාර හැදිය හැකියි. අගනා දේපල එකතු කරගන්නට වසර ගණනාවක් යන නිසා, සමාජයේ සාමය සහ යුක්තිය පවත්වා ගන්නට සිවිල් ආණ්ඩුවක් හා මහේස්ත්‍රාත් ක්‍රමයක් අනිවාර්යෙන්ම අවශ්‍යයයි.

> ධනවතුන්ගේ ඉසුරුමත් බව දුප්පතුන්ගේ හෙළා දකින කෝපය අවුස්සයි, ඔහුගේ දේපල අල්ලා ගනු පිණිස ආක්‍රමණයට පෙළඹෙන්නේ අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා ද්වේශය මුල් කරගෙනය. වසර ගණනාවක ශ්‍රමයෙන්, නැත්නම් පරම්පරා කිහිපයකින් පසුව, එකතු කරගත් වටිනා දේපලේ අයිතිකරුවාට එක රැයක් ආරක්ෂා සහිතව නිදන්නට ලැබෙන්නේ සිවිල් මහේස්ත්‍රාත්වරයෙක් යටතේ පමණි.[48]

යථාර්ථවාදී සාධකයක් හැටියට, සියල්ලන්ම ස්වාධීන විනිසුරුවන්ගේ අධිකාරය පිළිගන්නේ නම් පැහැදිලිවම එය ප්‍රයෝජනවත්ය. ඒත්, මිනිසුන් අතර අධිකාරියට ස්වභාවික ගෞරවයක් තිබීම ද මේ

---

[48] ජාතීන්ගේ ධනය, V පොත, I පරිච්ඡේදය, I කොටස, 710 පිටුව, c2 වගන්තිය.

පිළිගැනීම පහසුවෙන් සිද්ධ වීමට බලපායි. ශක්තිය, ප්‍රඥාව, විචක්ෂණශීලීත්වය, සහ සද්ගුණය වැනි පෞද්ගලික ගුණාංග වලට ජනතාව ගෞරවයක් දක්වති. එසේම පරිනතභාවයට සහ වයසට ද ගෞරවයක් දක්වති. විශේෂයෙන්ම, එඬේර යුගය වැනි, මහා දේපල අයිතියකින් යුතු වූ අයට සිය ධනවස්තු තමන් නඩත්තු කළ අය හැර ගන්නට වෙනකක් නැති වූ යුගයක දී, ධනය ද ගෞරවයට පාත්‍ර වන තවත් සාධකයකි. අරාබි ශාරීෆ් නායකයෙකුගේ අධිකාරිය ඉතා දැඩි වූයේ ද, එසේම ටාටර් ඛාන් නායකයෙකුගේ නායකත්වය මුළුමනින්ම ආඥාදායක වූයේ ද ඒ නිසයි.

මිනිසුන් ගෞරවය දක්වන හතරවැනි හේතුව නම් උප්පත්තියෙන්ම අසමාන තත්වයන් ලැබීමයි: මෙය අසමාන ධනවස්තූන් තිබීමේ ප්‍රතිඵලයකි. දඩයම් යුගයේ ප්‍රධාන වශයෙන් ධන අසමානත්වයක් නොතිබිණ; ප්‍රඥාවන්ත හෝ නිර්භීත මිනිසෙකුගේ පුත්‍රයාට අනෙක් අයට වඩා ගෞරවයක් ලැබෙන්නට ඇත. ඒත් ඒ වෙනස්කම් එතරම් වැඩි වූවා යැයි කිව නොහැකියි. ඊට වෙනස් වෙමින් එඬේර යුගයේ, ධනය පරම්පරා ගණනාවක් යනතුරු පවුල් අතර පැවතිණ. උප්පත්තිය නිසා විශේෂ ගරු බුහුමන් ලැබිණ. දැඩි ධන අසමානත්වය පටන් ගත්තේ මේ යුගයේ දී ය. මේ ධනයත් සමඟ, දේපල ඇති අයව දේපල නැති අයගෙන් ආරක්ෂා කරන්නට පිහිටුවා ගත් ආයතන තුලින් සිවිල් ආණ්ඩු ක්‍රමය ද බිහිවිය.

> සිවිල් ආණ්ඩුව, දේපල ආරක්ෂාව සඳහා පමණක් එය පිහිටුවා ඇත්නම්, එවිට එය සත්‍යයෙන්ම දුප්පත් අයගෙන් ධනවතුන්ව ආරක්ෂා කරගන්නට, නැතහොත් දේපල කිසිත් නැති අයගෙන් යම් දේපල සඳහා අයිතියක් ඇති අයව ආරක්ෂා කරන්නට පිහිටුවන ලද්දකි.[49]

*නීතිය සහ රජය යනු, ධනවතුන්ව මංකොල්ලන්නට එන දුප්පතුන්ගෙන් ආරක්ෂා කරගන්නට පිහිටුවා ගත් ආයතන යැයි ස්මිත් ගෙනෙන තර්කයෙන් එය නරක ක්‍රමයක් යැයි කියැවෙන්නේ නැත. ජනතාවට ප්‍රාග්ධනය එකතු කරගන්නට නම්, එය කරන්නට වසර ගණනාවක් යන නිසා, ඔවුන්ගේ දේපල හොරකම් නොකරාවි යන සහතිකයක් ඔවුනට තිබිය යුතු යැයි මේ වෙද්දී ස්මිත් කියා තිබුණි. මේ ප්‍රාග්ධනය එකතු කිරීම යනු ආර්ථික වර්ධනයට අනිවාර්යෙන්ම අත්‍යාවශ්‍ය වූවකි.*

මහජන පහසුකම්

රජයේ තෙවැනි භූමිකාව වනුයේ, ඒකීයපුද්ගලයන්ට කිසිත් ලාබයක් උත්පාදනය නොකරන මහජන පහසුකම් ඉදිකර ඒවා නඩත්තු කිරීමයි: වානිජ්‍ය සඳහා ආයතන පිහිටුවීම, බාලයන්ට අධ්‍යාපනය සහ සියළු වියැති ජනතාවට දැනුම ලබාදීම.

රටක වානිජ කටයුතු වැඩිවෙද්දී, එයට මහා මාර්ග, පාලම්, ජල මාර්ග, සහ වරායන් වැනි මහජන පහසුකම් ද අවශ්‍ය වේ. මහජන මුදල් මත බර පටවන්නේ නැතිව එවැනි බොහෝ පහසුකම් ටොල් ගාස්තු වැනි අය කිරීම් වලින් මූල්‍යකරණය කළ හැකියි. වෙළඳාම පහසු කරවන මුදල් ක්‍රමය ද එහි වියදම් පියවමින් සුළු ලාබයක් රජයට ලබාදෙයි. තැපැල් කන්තෝරුව ලොකු ලාබයක් උපයා දෙයි.

[49] ජාතීන්ගේ ධනය, V පොත, I පරිච්ඡේදය, II කොටස, 715 පිටුව, 12 වගන්තිය.

> එවැනි මහජන පහසුකම්වල වැඩි කොටස, එයින් ඒවායේ වියදම් ද පියවා ගන්නට හැකි ලෙසින්, සමාජයේ පොදු අයහාරය වෙත බර පටවන්නේ නැතිව, ඉතා පහසුවෙන් කළමනාකරණය කළ හැකියි.[50]

එවැනි අය භාරයක් නිෂ්පාදනයට සමත් නොවන මහජන පහසුකම්, ඒත් යම් පළාතකට විශේෂයෙන් යහපතක් සිද්ධ වෙන්නක් නම්, එය වඩා හොඳින් නඩත්තු වෙන්නේ ඒ සඳහා ඒ පළාතෙන්ම මුදල් රැස් කර, බද්දක් මඟින් පරිපාලනය වෙද්දී ය. නිදසුන් වශයෙන්, ආලෝකය සැපයීම සහ පාර හැදීමේ වියදම් භාණ්ඩාගාරයට පැවරුනේ නම් ලන්ඩනයේ වීදි වලට ඔය තරම් හොඳින් පහන් ආලෝකය ලැබී ඒවායේ පාරවල් මනාව අතුරා නොතිබෙනු ඇත. ලන්ඩන් දිස්ත්‍රික්කයක හෝ මීසමක යම් වීදියක් නඩත්තු වෙන්නේ ඊට පැනවූ බද්දකිනි. එහෙම වූයේ නැත්නම් වියදම සියළු පුරවැසියන්ට පැනවෙන බද්දක් වනු ඇත. එවිට බහුතරය එයින් කිසිත් යහපතක් නොලබති.

*විසල් මහජන ව්‍යාපෘති වැයට සහාය පළකරන සමහරු ස්මිත් මේ මහජන පහසුකම් ගැන කියන කොටස සහ (පසුව පහළින්) අධ්‍යාපනය ගැන සඳහන් කරද්දී එයින් සැනසුමක් ලබති. එහෙත් එය වැරදි සැනසුමකි. මුලින්ම, ස්මිත් සිය අදහස් සීමා කරන්නේ වෙළඳාමට අනිවාර්යෙන්ම අවශ්‍ය, යටිතල පහසුකම් සහ අධ්‍යාපනය වැනි ව්‍යාපෘති සඳහා පමණි. පුද්ගලික වෙළඳාමට ආදේශකයක් වශයෙන් මහජන ව්‍යාපෘති සඳහා ඔහු සහාය පළ නොකරයි. ඔහු සඳහන් කරන මේ සීමිත සහාය සහ නූතන රාජ්‍යය බාරගන්නා මහා ව්‍යාපෘති අතර යා කළ නොහැකි තරම් දුරකින් වූ පරස්තරයක් පවතී. දෙවනුව, ස්මිත් විසින් යටිතල පහසුකම් හදාගන්නට මහජන වියදම් අවශ්‍ය යැයි පිළිගන්නා අවස්ථාවේ දී පවා, ඔහු හිතන්නේ එම වැය ඒවා පරිභෝජනය කරන අය ලවා ගාස්තු ගෙවා ගත යුතු බවයි. ඍජු බද්දක් පැනවීමෙන් නොවේ. එසේ ගාස්තු අය කරගැනීම කළ නොහැකිම වෙන්නේ ද, එවිට පරිස්ථානීය පාරිභෝගිකයන් විසින්ම එම බද්ද ගෙවිය යුතුයි. තෙවනුව, ස්මිත්ගේ කාලයේ විශාල පරිමාණයක යටිතල පහසුකම් සපයන්නට හැකි මූල්‍යයක් සතු කොම්පැණි ස්වල්පයක් පමණක් තිබුණි. (ඒ හැරෙන්නට පැවති ප්‍රාග්ධන-එකතු වලින් සැදුණු කොම්පැණි ස්වල්පය ගැන විවිධ හේතු නිසා ඔහු ඉතා සැකයෙන් පසුවිය.) මේ තත්වය අද වෙනස්ය. ටොල් හා ගාස්තු එකතු කරගන්නා ක්‍රම අද ඉතා දියුණුයි. මහජන යටිතල පහසුකම් ව්‍යාපෘති පෞද්ගලික අංශයෙන් ඉදිවී මෙහෙයවීම අද ස්මිත්ගේ කාලයට වඩා ඉතා ප්‍රායෝගිකව කළ හැකියි.*

මේ මහජන පහසුකම් වල අරමුණ පොදුවේ වෙළඳාම පහසු කරවීමයි. ඒත් සමහර වානිජ්‍ය අංශ, විශේෂයෙන්ම ම්ලේච්ඡ සහ අශිෂ්ට ජාතීන් හා වෙළඳාමේ යෙදුන අංශ, සඳහා වැඩි ආරක්ෂාවක් ලබාදිය යුතුයි. බටහිර අප්‍රිකාව හෝ හින්දුස්ථානය සමඟ ව්‍යාපාර කරන වෙළෙන්දන්ට සාමාන්‍ය කඩයක් හෝ ගණන්-නිවසක් තුලින් ඉතා සුළු ආරක්ෂාවක් පමණක් ලැබෙනු ඇත. වානිජ්‍ය අරභයා විදේශ රටවලට තානාපතිවරු පත්කර යැවීම බොහෝ දුරට අත්‍යවශ්‍ය වී ඇත: තුර්කි කොම්පැණිය සමඟ වූ වානිජ කටයුතු නිසා කොන්ස්තන්තිනෝපල් හි තානාපතිවරයෙක් පිහිටුවන ලදි; රුසියාවට යැවූ පළමු ඉංග්‍රීසි තානාපති සම්බන්ධතා සම්පූර්ණයෙන් සිද්ධ වූයේ වානිජ්‍ය කටයුතු ආරක්ෂා කරගන්නටයි.

එවැනි සුවිශේෂී වියදම් සඳහා එයින් බලපෑම් අත්විඳින අයට යම් මධ්‍යස්ථ ප්‍රමාණයක බදු ගෙවන්නට සිද්ධ වීම ඔවුනට දැරිය හැකි වූවක් යැයි පෙනේ. එසේම, වෙළෙන්දන් දුර බැහැර ම්ලේච්ඡ රටක් සමඟ කරන නව වෙළඳාමක් පිහිටුවද්දී ඔවුනට තාවකාලික ඒකාධිකාරයක් ද භුක්ති විඳින්නට ලැබෙන නිසා ද මෙය

---

[50]ජාතීන්ගේ ධනය, V පොත, I පරිච්ඡේදය, III කොටස, I ඛන්ඩය, 724 පිටුව, d2 වගන්තිය.

ඔවුනට දැරිය හැකි වුවක් යැයි පෙනේ. නව යන්ත්‍ර වලට ලැබෙන පේටන්ට් බලපත්‍ර ලෙසින්, ඔවුන් අනතුරුව පොදු ජනතාව සඳහා සලසන යහපත වෙනුවෙන් ඔවුන් ගන්නා අවදානමට ප්‍රතිලාභයක් දෙන පහසුම ක්‍රමය මෙයයි.

එසේ වුවත්, ජාතික ප්‍රතිපත්තිය හැම විටම නොගැළපෙන පරිද්දෙන් සිද්ධ වේ. සමහර අවස්ථාවල දී, මේ වෙළඳාමට ආරක්ෂාව සැපයීම පුද්ගලික කොම්පැණිවලට කොන්ත්‍රාත්තු හැටියට පවරන ලදි. ඒ කොම්පැණි වෙළඳාම වැරදි ලෙසින් කළමනාකරණය කිරීමේ සහ වෙළඳාම සීමා කිරීමේ ද නියැළුනහ. මේ සඳහනට අයිත් වන හැම්බර්ග්, රුසියා, ඊස්ට්ලන්ඩ්, තුර්කි සහ ඇප්‍රිකන් කම්පනීස් යන රෙගුලාසිකරණයට හසු වූ කොම්පැණි, ඕනෑම අයෙකුට ගාස්තුවක් ගෙවා සාමාජිකත්වය ගත හැකි ඒවා වෙති. තවත් විදියකින් කිවහොත්, ඒවා හරියට ශිල්ප ශ්‍රේණි සංවිධාන වැනිය. එයාකාරයෙන්ම හැසිරෙති. රජය විසින් පිහිටුවන ලද සාමූහික ප්‍රාග්ධනයෙන් යුතු, විදේශ වෙළඳාම සඳහා සුවිශේෂී වරප්‍රසාද හිමි වී ඇති සවුත් සී, හඩ්සන්'ස් බේ, සහ රෝයල් ඇප්‍රිකන් කොම්පැණීස් යනාදී කොම්පැණි ද මෙයට අයිතියි. එහෙත් එවැනි වරප්‍රසාද ප්‍රදානය වූ පමණින් එවැනි කොම්පැණි බංකොළොත්වී යාමෙන් වළක්වා ගන්නට හැකි වී නැත. ඉතින් එවැනි ඒකාධිකාරයන්ට දිගින් දිගටම අවසර දීම මහජනයා වෙත පැනවෙන අභූත බද්දකි.

බැංකු, රක්ෂණ, හෝ ජල මාර්ග වැනි පහසුකම් ඉදි කරන වැනි නැවත නැවත කළ යුතු වෙළඳාමේ දී, එවැනි විශේෂ වරප්‍රසාද නොමැතිව ද, සාමූහික ප්‍රාග්ධනයෙන් යුතු කොම්පැණි සාර්ථක විය හැකියි. කෙසේනමුත්, අනෙක් ආකාර ව්‍යාපාරයන් ඉතා ඉක්මණින් කටයුතු කරති. ඒ නිසා ඔවුන් අවදානම් ගත යුතුමයි. නිතර වෙනස්වෙන කාරණා ගැන අවධානය දැක්විය යුතුමයි. අධ්‍යක්ෂක මණ්ඩලයකින් පාලනය වෙන කොම්පැණියක් මෙවැනි ක්ෂේත්‍රයක සාර්ථකත්වයක් ලබන්නට නොහැකි තරමින් සෙමෙන් කටයුතු කරන ඒවා වෙති.

*සාමූහික ප්‍රාග්ධනයෙන් යුතු කොම්පැණි ගැන -වර්තමානයේ විසල් ව්‍යාපාර තුළ පවතින ආකාරයට- විරෝධයක් පාන ආයෙක් ලෙසින් ස්මිත්ව දැක්වීම සාමාන්‍යයෙන් දැකිය හැකි වුවකි. එනමුත් සැබැවින්ම, ඔහු මූලික වශයෙන් විරෝධය දක්වන්නේ සමහර කොම්පැණි වලට සුවිශේෂී වරප්‍රසාද ප්‍රදානය කිරීම ගැනයි. එසේම, අධ්‍යක්ෂක මණ්ඩලයේ විශාල පිරිසක් සිටින කොම්පැණියකට බොහෝ ක්ෂේත්‍ර තුළ සාර්ථකත්වයක් ලබාගත නොහැකි යැයි ද ඔහු විශ්වාස කරයි. කෙසේ නමුදු, අද, කොටස් අයිතිකරුවන් කුඩා පිරිසක් සිටින අධ්‍යක්ෂක මණ්ඩල තෝරාපත් කරගෙන, කුඩා විධායක කණ්ඩායමකට කොම්පැණිය මෙහෙයවන කාර්යයන් බාර දෙති. මේ ක්‍රමයෙන් විශාල කොම්පැණි වලට ඉතා යුහුසුලු ලෙසින් කටයුතු කරන්නට අවස්ථාව පැදේ.*

තරුණ අයට ඉගැන්වීම

ආර්ථික කාර්යක්ෂමතාවයෙන් සමාජයට ලැබෙන පැහැදිලි ප්‍රතිලාභ පැවතිය ද, විශේෂ ප්‍රාගුණ්‍ය තුලින් ඒකීයපුද්ගලයාට සිද්ධ වෙන හානිකර සාධක ද තිබිය හැකියි. වසර ගණනාවක් එකම සරල ක්‍රියාවක යෙදෙන පුද්ගලයාට නවෝත්පාදක වූ චින්තනයකට කිසිත් අවස්ථාවක් නොලැබෙන්නට පුළුවනි. රජය මැදිහත් වූයේ නැත්නම්, ඒකාකාර රක්ෂාවල නියුතු දුප්පත් ශ්‍රමිකයන් මානසික අලස බවට සහ පටු චින්තනයට පත්විය හැකියි, එසේම වෙනස සහ නොදන්නා දෑ ගැන බියක් ඇති කරගන්නට ඉඩ තිබේ.

*මෙහි දී ස්මිත් විසින්, නිමි භාණ්ඩය ගැන තැකීමක් නොමැති, ඒකාකාරී කටයුතු වල යෙදෙන ශ්‍රමිකයන් අතර පැන නැඟිය හැකි 'පරාරෝපණය' නම් කාල් මාක්ස්ගේ අදහස කල් තියා බලාපොරොත්තුවෙන් සිටි ආකාරය දකින්නට හැකියි.*

දඩයම්කරුවන් හා එඬේරුන් වෙතින් හැදෙන ම්ලේච්ඡ ජාතීන් අතර, ජනයාගේ විවිධාකාර වූ වෘත්තීන් සහ ඔවුන් එදිනෙදා ජයගත යුතු ගැටළු ඔවුන්ගේ මනස් සහ ඔවුන්ගේ විනිශ්චයන් තියුණු කරවති.

> සරල කටයුතු ස්වල්පයක් පමණක් කරමින් මුළු ජීවිතයම ගෙවන මිනිසෙකුට, එයින් ලැබෙන ඵලවිපාක ද සමහර විට ඒකාකාරීම විය හැකියි, නැත්නම් බොහෝ ආසන්න වශයෙන් ඒකාකාරී විය හැකියි. එහි දී කවදාවත් මුහුණ පාන්නට සිද්ධ නොවන දුෂ්කරතා විසඳන ඉක්මන් නවෝත්පාදන ක්‍රම සොයාගැනීමට, ඔහුට තමන්ගේ වැටහීමක් සඳහා වෙහෙසක් ගන්නට කිසිත් අවස්ථාවක් පැදෙන්නේ නැත.[51]

කෙසේවුවත්, ශිෂ්ට රටවල දී පොදු ජනතාවගේ අධ්‍යාපනය ගැන විශේෂ අවධානයක් යොමුකළ යුතුවේ. ධනවත් අය තම දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන්නට වැඩියෙන් කැමැත්ත දක්වති; එසේම ඔවුන් විවිධ විෂම වූ රස්සාවන් හි ද නියැළෙන බැවින් ඔවුන්ගේ මනස ද ව්‍යායාම් නැතිව අක්‍රිය වූ මනසක් නොවෙති. එහෙත් සාමාන්‍ය වැසියන් සතුව අධ්‍යාපනය සඳහා ඇත්තේ සුළු මුදලකි. එමෙන්ම සුළු කාලයකි. පවුලේ පැවැත්ම වෙනුවෙන් හැකි ඉක්මණින්ම ඔවුන්ගේ දරුවන්ට රැකියා පටන් ගන්නට සිද්ධ වේ.

නමුත් අධ්‍යාපනයක ප්‍රධාන මූලිකාංග ඉතා ළාබාල වියේ දී වර්ධනය කරගත හැකියි. එමෙන්ම ඉතා සුළු වැයකින්, මේ ප්‍රාථමික දැනුම සියල්ලන් විසින්ම ලබාගත යුතු වූවක් යැයි මහජනයාව ධෛර්යමත් කරත හෝ ඔවුන්ට එය අනිවාර්ය කිරීම පවා කළ හැකියි. මෙය කරන්නට, සාමාන්‍ය කම්කරුවෙකුට පවා දරාගත හැකි මධ්‍යස්ථ ගාස්තු ගෙවිය යුතු පරිස්ථානීය පාසැල් පිහිටුවිය හැකියි. ගුරුවරුන්ට කරන ගෙවීම් කොටසක් මහජන පසුම්බියෙන් කරත හැකියි (එහෙත් ඔවුන්ගේ වේතන සම්පූර්ණයෙන්ම එයින් ගෙවිය නොයුතුයි, මන්ද එවිට ඔවුන් සිය සිසුන් නොසලකා හරින නිසයි). ස්කොට්ලන්තයේ මෙවැනි මීසම් පාසැල් පිහිටුවීම තුලින් එහි සියළු පොදු ජනතාවට කියවන්නට ද, එමෙන්ම බොහෝ දෙනෙකුට ලියන්නට සහ ගණන් හදන්නට ද උගන්වා ඇත. එංගලන්තයේ ද පුන්‍යාධාර වලින් පවත්වාගෙන යන පාසැල් මෙයාකාර ඵලවිපාකයන්ම ලබා දී ඇත.

> ගුරුවරුන් සාර්ථක ලෙසින් සේවය කිරීමේ අවශ්‍යතාවය පාසැල් සහ විශ්ව විද්‍යාල අරමුදල් නිසා හීන කර ඇත. ඔවුන්ගේ පැවැත්ම ඔවුන්ගේ විශේෂ වූ වෘත්තියේ සාර්ථකත්වයෙන් සහ හොඳ නමෙන් ස්වාධීනව පවතී.[52]

*ස්මිත් අධ්‍යාපනය ලැබුවේ ද මෙවැනි පරිස්ථානීය වූ ද, මහජන අරමුදල් වලින් නඩත්තු වූ ද, ස්කොට්ලන්තයේ පාසැලක ය. නමුත් ඔහුගේ ප්‍රතිපත්ති රෙකමදාරුව, ත්‍යාගශීලීත්වය පෙරමුණු ගත්තක් වුව ද, සම්පූර්ණයෙන් සංස්ථිතික නොවේ. රජයේ මූල්‍යයෙන් පාසැල් ගොඩනැඟිලි හැදිය යුතු යැයි ද, එහෙත් ගුරුවරු නඩත්තුව සඳහා රජයේ යම් කොටසක් පමණක් ගෙවිය යුතු යැයි ද තර්ක කරමින්, ඔහු*

---

[51]ජාතීන්ගේ ධනය, V පොත, 782 පිටුව, f50 වගන්තිය.
[52]ජාතීන්ගේ ධනය, V පොත, I පරිච්ඡේදය, III කොටස, 760 පිටුව, f5 වගන්තිය.

*නර්තනය හා වෙනත් කලා විෂයයන් උගන්වන පෞද්ගලික පාසැල් ද එකවර ප්‍රශංසාවට පත් කරයි. ඔහු අදහස් කළේ, බොහෝ රටවල පොදුවේ අද දකින්නට ලැබෙන රාජ්‍ය අධ්‍යාපන ක්‍රමය ගැන නොවන බව නම් සහතිකයෙන්ම කිව හැකියි.*

පාසැල් පෙළ පොත් ද සැබැවින්ම මීට වඩා උපදේශාත්මක විය හැකියි: ලතින් වෙනුවට, මූලික ජ්‍යාමිතිය සහ යාන්ත්‍රික විද්‍යාව අධ්‍යයනය පොදු ජනතාවට වඩා ප්‍රයෝජනවත් වනු ඇත. අධ්‍යාපන ජයග්‍රහණය වෙනුවෙන් මහජන ත්‍යාග ප්‍රදානය ද සහාය විය හැකියි. එසේම වෘත්තීයකට බැඳෙන්නට අවසර දෙන්නට පෙර විභාගයක් ද පැවැත්විය හැකියි.

ග්‍රීක සහ රෝම ජනරජ ඔවුන්ගේ පුරවැසියන්ගේ සටන්කාමී ජවය නඩත්තු කළේ මෙසේය. ඔවුන්ගේ කායික හා ක්‍රීඩා අභ්‍යාස සඳහා ජිම්නේසියා ශාලා ඉදි කෙරිණ, (සිසුන් වෙතින් ගෙවීම් ලබන) ගුරුවරුන් පත් කෙරිණ, ඒ අභ්‍යාස විශිෂ්ට ලෙසින් කරන්නට සමත් වූවන්ට විශිෂ්ටත්වයේ ලාංඡන ප්‍රදානය කෙරිණ. බියගුලු ස්වභාවය සහ ස්ව-වටිනාකමක් ගැන සංවේදී නොවීම නුගත්කම සහ මෝඩකම වැනි ලොකු අවදානමක් හැටියට සලකන ස්විට්ස්සර්ලන්තයේ හැරෙන්නට, මෙවැනි සටන්කාමී ජවයක් සඳහා අද ඉතා සුළු පිරිසක් පමණක් පුහුණු කෙරේ.[53] ස්ව-වටිනාකම වැඩෙන්නට ඉඩදීම සහ දැනුම ප්‍රවර්ධනය යනු ශිෂ්ට සම්පන්නත්වය සහ නීත්‍යානුකූලත්වය වැඩිකරවන, සමාජයට කරන යහපතකි.

ආගමික අධ්‍යාපනය

සියළු වයස්වල අයට ඉගැන්වීම සඳහා වූ ආයතන ප්‍රධාන වශයෙන් මේ ආගමික ඉගැන්වීම් ලබාදෙන ආයතන වෙති. පිළිගත් ආගමික නියෝජිතයන්, දහයෙන් එකේ බද්දෙන් හෝ දේපොළ වලින් රැකෙද්දී, ඔවුන් තැකීමක් නැති අය වෙති. අලුතින් පටන් ගන්නා අයගේ කඩිසර සහ කැපවීම අස්සේ නොපෙනී යති. ඔවුන්ගේ තත්වය ආරක්ෂා කරගන්නට ඔවුන් නීතියේ පිහිට පතති: නිදසුන් වශයෙන් රෝමානු කතෝලික පූජකවරු දුර්ලබ්ධිකයන්ව හිංසා කිරීමට නීතිය යොදවා ගනිද්දී, පෙරලා ඔවුන්ට හිංසා කිරීම එංගලන්ත පල්ලියෙන් සිද්ධ විය.

ආචාර ධර්ම පද්ධතීන් කර්කශ හෝ ලිබරල් විය හැකියි. කාලයට හැඩගැසෙන ජනතාව ලිබරල් ක්‍රමයට හැරෙති, සුඛෝපභෝගීත්වයේ ගැලී, නොහික්මුණු සිනා හඬින්, සහ තරමක් සීමාව ඉක්මවා බේබදු ලෙසින් ද හැසිරෙති. නමුත් ඔවුනට එවැනි නොසැලකිලිමත්කම දරාගන්නට පුළුවන්. පොදු ජනතාව අතර ප්‍රඥාවන්ත පුද්ගලයන් ඊට පැහැදිලිවම වෙනස් වෙමින්, තමනට හානිකර විය හැකි යැයි ඔවුන් දන්නා අන්තගාමී හැසිරීම පිළිකුල් කරති. නගරයේ සිටිය දී ඔවුන්ගේ ආචාර ධර්මීය ගැටළුව විශේෂයෙන්ම තීව්‍ර වූවකි. මන්ද, ඔවුන්ව යම් කුඩා, කර්කශ, බොහෝවිට සමාජශීලීත්වයෙන් තොර වූ ආගමික නිකායක් විසින් අහුලාගත්තේ නැත්නම්, ඔවුන්ට අනන්‍යතාවය සඟවා ගන්නට හැකිවෙද්දී මිනිසුන් ඉතා පහසුවෙන් නාස්තිකාර හැදියවට සහ ස්වයං නොසැළකිල්ලකට වැටෙන්නට පුළුවන.

මේ ප්‍රශ්නය සඳහා ඇති පළමු විසඳුම නම් විද්‍යාව සහ දර්ශනය හැදෑරීමයි. ගුරුවරුන්ට වේතන දීමෙන් නොව (එයින් ඔවුන් නොසැලකිල්ලට සහ නිකම් ඉන්නට හුරුවෙන නිසා), ඒත් වෘත්තියකට යන්නට පෙර

---

[53] ජාතීන්ගේ ධනය, V පොත, I පරිච්ඡේදය, III කොටස, II ඛන්ඩය, 787-8 පිටු, f60 වගන්තිය.

ඉගෙන ගැනීම අනිවාර්ය කිරීමෙන්, මේ දැනුම පතුරුවන්නට රජයට හැකියි. අනෙක් විසඳුම නම් කලාව ප්‍රවර්ධනයෙන් මිනිසුන්ව විනෝදයට පත් කර ඒවායෙන් වෙනත් අතකට හැරවීමයි.

රජයේ වියදම් සඳහා අරමුදල් සැපයීම

ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා හැටියට කටයුතු කරන, ඒ නිසා පොදු ගෞරවයට පාත්‍ර විය යුතු රජුගේ අභිමානය රැකීම සඳහා යම් වියදමක් අවශ්‍යයයි. එයාකාරයෙන්ම, අපරාධ යුක්ති පද්ධතියේ වැය ද මුළු මහත් සමාජය විසින්ම දැරිය යුත්තකි. එනමුත්, සිවිල් නඩු යනාදියේ වියදම් දැරිය යුතු වනුයේ ඒවායෙන් ප්‍රතිලාභ ලබාගන්නා අය විසිනි, එනම් ඒවා භාවිතා කරන්නන්ය. සැබැවින්ම, මහජන සේවකයන්ට ඔවුන් ගෙනෙන ප්‍රතිඵල අනුව ගෙවිය යුතුයි.

> මහජන සේවා ඉටුකරන විට ඒවාට ආනුෂංගිකව වාසි ලැබෙද්දී තරම් හොඳින්, වාසිවලට සමානුපාතික ලෙසින් ඒවාට නිසි සැලකිල්ල දැක්වීම, ඒ සේවා සැපයෙන වෙනත් අවස්ථාවල දී සිද්ධ නොවේ.[54]

සමස්ථ සමාජයටම බද්දක් පනවන්නේ නැතිව, පරිස්ථානීය හෝ දිස්ත්‍රික්ක මට්ටමෙන් ලැබෙන යහපත සඳහා පරිස්ථානීය හෝ දිස්ත්‍රික්ක මට්ටමෙන් සිද්ධ වෙන වියදම් වලට පරිස්ථානීය හෝ දිස්ත්‍රික්ක බදු වලින් ගෙවිය යුතුයි. කෙසේවුවත්, හොඳ මහා මාර්ග සහ සන්නිවේදන සඳහා වැය පොදු බද්දක් ගෙවීමේ මූලාකරණය සාධාරණ විය හැකියි. නමුත්, එංගලන්තයේ අධිවේගී ටොල් සහ අනෙක් රටවල මාර්ග ගාස්තු මෙන්, වියදමේ බහුතරය පරිහරණ ගාස්තු වලින් පියවා ගත හැකියි.

අධ්‍යාපනයේ වියදම ද යුක්ති සහගතව පොදු බද්දකින් ගෙවිය හැකියි; නමුත් එහි දී සමානාත්මතාවයෙන් සරිලන පරිද්දෙන් සහ සමහර විට වාසිදායක අන්දමින් එය ගෙවිය හැකිවන්නේ අනන්තර ප්‍රතිලාභ ලබන අය විසින් ගෙවන්නේ නම් පමණි.

මහජන පහසුකම් සමස්ත සමාජයටම යහපතක් ගෙනෙන අනෙක් අවස්ථා වල දී ද, භාවිතා කරන අයට ඒවා ගෙවාගන්නට නොහැකි වෙද්දී, මදිපාඩුව පියවා ගැනීම බොහෝ විට සිද්ධ වෙනුයේ පොදු බද්දක් මාර්ගයෙනි.

වානිජ්‍ය ව්‍යාපෘති වලින් මුදල් සොයාගන්නට ආණ්ඩු උත්සාහ කරනු ඇත, නමුත් ඔවුන් ආසර්ථක වෙළඳුන් වෙති. රජයේ සේවකයන් මහජන පසුම්බිය දකින්නේ නිමා නොවෙන්නක් හැටියටයි. සාර්ථක ව්‍යාපාරිකයන් තම සීමිත සම්පත් ප්‍රවේසම් හා අරපරෙස්සම් වෙද්දී, ඔවුන් අනවශ්‍ය ලෙසින් වියදම් කරමින් තමන්ට හොඳින් ගෙවා ගනිති. එමෙන්ම, සමහර ආණ්ඩු රජයේ ඉඩම් හිමිකම් වලින් වැයභාරය උපයති. එහෙත්, සාමාන්‍යයෙන් මහජන පසුම්බියෙන් ගෙවන්නට යැයි ඉල්ලීම් සියල්ල සපුරාලන්නට මේවා ප්‍රමාණවත් නැත. රජයේ වත්කම් පොදුවේ කළමනාකරණය වෙන්නේ පෞද්ගලික වත්කම් තරම් හොඳින් නොවේ.

---

[54]ජාතීන්ගේ ධනය, V පොත, I පරිච්ඡේදය, II කොටස, 719 පිටුව, 20 වගන්තිය.

> ඔටුන්නට හිමි ඉඩම් පෞද්ගලික දේපල බවට හැරෙද්දී, ඒවා වසර කිහිපයක් යද්දී, හොඳින් දියුණු වී හොඳින් වගා කෙරීමට ලක් වේ රේගු බදු හා ඇක්සයිස් බදු වලින් ඔටුන්නට ලැබෙන ආදයම, ජනතාවගේ ආදායම් සහ පරිභෝජනය සමඟින් අනවරතයෙන්ම ඉහළ යයි.[55]

බදු මූලධර්ම

බදු සකස් කරන නීති සම්පාදකයන්ට මාර්ගෝපදේශයක් ගෙනෙන මූලධර්ම හතරකි.

> එක ආණ්ඩුවක් නිසා ජනතාවගේ පොකැට්ටුවෙන් මුදල් නිතිපතා හිඟ වී යාම ගැන අනෙක් ආණ්ඩුවක් ඉතා ඉක්මණින් දැනගැනීම තරම් වූ වෙනත් කලාවක් නොමැත.[56]

පළමුව, ජනතාව විසින් හැකි පමණින් ඔවුන්ගේ ආදායමට සමානුපාතිකව ඔවුන් රජයෙන් ලබන ආරක්ෂාව සඳහා ගෙවිය යුතුයි.

දෙවනුව, බදු නිශ්චිත විය යුතුයි, හිතුමතයේ පැනවෙන්නක් නොවිය යුතුයි. ගෙවීම කරන ආකාරය සහ ගෙවිය යුතු කාලය ගැන සියල්ලන්ටම පැහැදිලි විය යුතුයි. එසේ නොවේ නම්, බදු එකතු කරන්නන්ට පමණ ඉක්මවා ගිය සහ හිතුමතයේ යොදාගත හැකි බලයක් පැවරේ. එයින් වංචා දූෂණයට ඉඩ සහ තර්ජනාත්මකව පොළඹවා ගන්නට හැකියාව ලැබේ.

තෙවනුව, බදු ගෙවීමට සිද්ධ විය යුත්තේ පහසු කාලයක දී ය. උදාහරණයක් හැටියට නිවාස හෝ කුලී සඳහා වූ බදු ගෙවිය යුත්තේ කුලී ගෙවද්දී ය. පරිභෝජන භාණ්ඩ සඳහා ගෙවිය යුතු බදු ද පහසු විය යුතුයි. මන්ද ඒවා ගෙවෙන්නේ බඩු මිල දී ගන්නා විට ටිකින් ටික ය.

හතරවනුව, බදු අනවශ්‍ය පමණින් යුතු වැයක් විය නොයුතුයි. ඒවා එකතු කරන්නට වියදම් අධික නිලධාරීන් මහත් සංඛ්‍යාවක් අවශ්‍ය නොවේ. ඒවායෙන් කර්මාන්ත අධෛර්යමත් කරවීම ද, ප්‍රාග්ධනය විනාශ කිරීම ද සිද්ධ නොවිය යුතුයි. බදු ගෙවීම පැහැර හැරීම ධෛර්යමත් නොවිය යුතුයි, (අධික ඇක්සයිස් බදු හොරබඩු රටට ගෙන ඒම දිරිගන්වයි) එසේම දඩ තුලින් බදු ගෙවීම් පැහැර හරින්නට සිද්ධ වූ අයව විනාශයට පත්කිරීම ද කළ නොයුතුයි.[57]

*මේ බදු මූලධර්මයන් අද ඉතා ස්වභාවික යැයි පෙනෙනු ඇත. ඔහුට ඒවා සඳහන් කරන්නට සිද්ධ වීම තුලින් පෙනී යන්නේ ඔහුගේ කාලයේ පැවති බදු කොතරම් හිතුමතයේ හා අයුක්ති සහගත ලෙසින් සිද්ධ වෙන්නට ඇත්දැයි යන්නයි. කෙසේවෙතත්, ස්මිත්ගේ වෙනත් බදු යෝජනාවල අසංස්ථිතිකයන් පවතී. ඔහු පිරිභෝජනය සඳහා පනවන බදු වලට විරුද්ධ වේ, ඒත් සුඛෝපභෝගී භාණ්ඩ වලට (වර්තමානයේ අපි ඉතා ප්‍රාථමික ලෙසින් සලකන කුකුල් මස් වැනි දේවල් වලට ද ඇතුළුව) පනවන බදු වලට සහාය පළ කරයි. ජනතාව සිය ආදායම් සමානුපාතිකයට අනුව බදු ගෙවිය යුතු යැයි ඔහු කියයි, ඒත් ධනවත් අය 'ඒ සමානුපාතිකයට වඩා වැඩියෙන්' ගෙවිය යුතු යැයි ඉල්ලයි.*

---

[55]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, I කොටස, 824 පිටුව, a18 වගන්තිය.
[56]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, I සහ II බන්ධයන්ගේ පරිශිෂ්ටය , 861 පිටුව, h12 වගන්තිය.
[57]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, 827 පිටුව, b6 වගන්තිය.

ඉඩම් බදු

ඉඩම් කුලිය සඳහා බදු පැනවෙන්නේ නම්, කාලයෙන් කාලයට කුලිය වෙනස් වෙන බැවින්, එවිට ඒ සඳහා වාරික ඇස්තමේන්තු අවශ්‍යයයි. නැත්නම් බදු අසමාන සහ අසාධාරණ වෙයි. මෙයට යම් අධිකාරියක් අවශ්‍ය වේ. ඉඩම් හිමියන් සහ අඳගොවියන් අතර ප්‍රෝඩා සහගත දූස්සන්ධානය වැළැක්වීම සඳහා කුලී එකඟතා ප්‍රකාශයට පත් කර ලියාපදිංචි කරවීම අවශ්‍ය අතර (සැබැවින්ම අධීක්ෂණයකට ද ලක්විය යුතුයි).[58]

ඉඩමේ එලදාවට පනවන, දහයෙන් එකේ බද්ද වැනි බදු, ඉතා අසාධාරණ වෙති. අඩු එලදාවක් ගෙනෙන ගොවි බිම් අයිතිකරුවන්ට එයින් දැඩි පහරක් වැදේ. එයින් ඉඩම් හිමියන්ව සිය ඉඩම් වැඩි දියුණු කරවීමෙන් ද, නැත්නම් ගොවියන්ව වඩා හොඳ වගාවක් සඳහා ආයෝජන කිරීමෙන් ද, අධෛර්ය කරවති. ඒ දෙකටම යන වියදම් බරෙන් කොටසක් රජය හෝ පල්ලිය නොදරති. ඒත් ලාබයෙන් කොටසක් ගනිති. ඒ නිසා ඒවායෙන් ඉඩම් හිමියන් සහ ගොවියන් යන දෙගොල්ලන්වම අධෛර්ය කරවති.[59]

නිවසක් හදන්නට යොදාගත් ප්‍රාග්ධනයේ ලාබය -ගොඩනැඟිලි කුලිය- එය ඉදිකරන්නට යොදාගත් ඉඩමේ අයිතියෙන් ලැබෙන කුලිය -භූමි කුලිය- යනාදී ලෙසින් නිවාස කුලී බෙදිය හැකියි. නිවාස කුලී බොහෝ විට දැඩිසේ පැටවෙන්නේ ධනවතුන්ටය, එය සමහර විට අසාධාරණ නොවිය හැකියි, එසේම ඒ කුලී මොනවාදැයි කියා ඉතා පහසුවෙන් දැනගත හැකියි. භූමි කුලියට පනවන බදු ඉඩම් අයිතිය සඳහා වූ බද්දක් වෙන හෙයින් එයින් ගොඩනැඟීම සහ වැඩි දියුණුව අධෛර්යමත් නොකරයි. ඒත් සම්පූර්ණ කුලියෙන් කොපමණ ප්‍රමාණයක් භූමි කුලිය හැටියට සැලකිය යුතු දැයි තීරණය එතරම් පහසු නොවේ.[60]

මෙවැනි දුෂ්කරතා නිසා නීති සම්පාදකයන් කුලී ඇස්තමේන්තු හදන පහසු ක්‍රම යොදාගන්නට යොමු කර තිබේ. උදාහරණයක් හැටියට, දැන් බදු පැනවෙන්නේ නිවාසයක ඇති ජනේල සංඛ්‍යාවට සමානුපාතිකවය. අවාසනාවට, නගරයේ ධනවත් පවුලක් ජීවත්වන ඉහළ කුලියෙන් යුතු නිවාසයකට වඩා ජනේල වැඩි සංඛ්‍යාවක් ගමේ අඩු කුලියෙන් යුතු දුප්පත් පවුලක් ජීවත්වන නිවසකට තබා ගත හැකියි. ඉතින් මේ බද්දෙන් ඇතිවන බලපෑම අසාධාරණ සහ අසමාන වෙයි.[61]

ප්‍රාග්ධනයට සහ ලාබයට බදු

පොලිය සහ ලාබය නමින් ප්‍රාග්ධනයෙන් උත්පාදනය වන ආදායම් වර්ග දෙකකි. ලාබය බදු වැදීමට සුදුසු යුත්තක් නොවේ, මන්ද එය ප්‍රාග්ධනය යොදවන අපහසුවට සහ අවදානමට ලැබෙන ප්‍රතිලාභය වූ නිසයි. ඉතින් එයට බදු පැනවෙනවා නම්, සේවායෝජකයන්ට සිය ලාබ ආන්තිකයන් ඉහළ යවන්නට සිද්ධ වෙද්දී (පාරිභෝගිකයන්ට බඩු මිල වැඩිකරමින්), නැත්නම් (තැන්පතු සතු අයට නරක තත්වයක් ගෙනෙමින්) ණය දෙන්නන්ට ගෙවන පොලී අඩු කරන්නට ඔවුනට සිද්ධ වෙයි.[62]

---

[58]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, 832-3 පිටු, c17 වගන්තිය.
[59]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, 837-8 පිටු, d6 වගන්තිය.
[60]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, 843-4 පිටු, e7-e11 වගන්ති.
[61]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, 845-6 පිටු, e16-e20 වගන්ති.
[62]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, II ඛණ්ඩය, 847 පිටුව, f1-f2 වගන්ති.

කුලී වලට මෙන්ම පහසුවෙන් පොලියට ද බදු ගැසිය හැකි සේ පෙනී ගියත්, එය එසේ නොවේ. පළමුව, ඉඩම් හා කුලී වලට වඩා ණය සහ ණය ගෙවීම් සඟවන්නට වැඩියෙන් පහසුයි. ඒවා අධීක්ෂණය කිරීමට පුද්ගලයන්ගේ ජීවිත වලට එබී බලන බලාත්මක ප්‍රවේශයකින් යුතු අධිකාරියක් අවශ්‍ය වේ. දෙවනුව, ප්‍රාග්ධනය යනු ඉතා ජංගම වූවකි. එහි අයිතිකරුවන්ට බදු ගෙවීම මගහරින්නට (බදු එකතුකරන්නන්ගේ කරදර වලින් ගැලවෙන්නට ද) තමන්ගේ ප්‍රාග්ධනය පිටරටට යැවිය හැකියි. එහි දී වර්ධනය සඳහා ප්‍රාග්ධනය අවශ්‍ය දේශීය කර්මාන්ත වලින් එය හොරකම් කෙරෙයි.

> කොටස් අයිතිකාරයා ලෝක පුරවැසියෙකි, ඒ නිසා ඔහු අනවරතයෙන්ම යම් රටකට බැඳී සිටින අයෙක් නොවේ. දැඩි බරක් පැටවෙන බදු ගැසීම සඳහා ගෙනෙන නොරිස්සුම් සහගත විමර්ශනයන්ට මුහුණ දෙන්නට සිද්ධ වෙද්දී, ඔහු තමනට පහසු ලෙසින් සිය වස්තුව භුක්ති විඳින්නට හැකි, නැත්නම් පහසුවෙන් ව්‍යාපාරයේ යෙදිය හැකියාව ලැබෙන වෙනත් රටකට, සිය කොටස් ද රැගෙන, ඉක්මණින් රට අත්හැර දමා යන්නට පෙළඹෙනු ඇත.[63]

සංචාරක වෙළෙන්දන් සහ පදික වේදිකා වෙළෙන්දන්, කුලියට දුවන අශ්ව කරත්ත සහ දෝලා පුටු වැනි විශේෂ ක්ෂේත්‍ර වලින් උපයන ලාබ සඳහා සමහර රටවල් බදු පනවති. මත්පැන් අලෙවියට අවසරපත්‍රයක් නිකුත් කිරීම තවත් ආකාරයක බද්දකි. කෙසේවුවත්, අවසානයේ දී එවැනි බදු නිතරම පැටවෙන්නේ පාරිභෝගිකයාටයි. වෙළඳාමේ යෙදෙන්නාට නොවේ. වෙළඳාමේ යෙදනවුන් කරන්නේ බද්ද පියවා ගැනීමට හැකිවෙන ලෙසින් ලාබ ආන්තිකයන් ඉහළ යැවීමයි.[64]

දේපල වෙනත් අයෙකුට පවරද්දී බද්දක් ගැසිය හැකියි. මරාළ බද්ද සහ මුද්දර බද්ද ඒවාට නිදසුන් වෙති. නමුත් එවැනි බදු ද ජාතියක ප්‍රාග්ධනය අවසන් කරති. මහජන වැයභාරයේ සංවහන පරිභෝජනයට පැවරීමෙන් එහි දී ඵලදායී ව්‍යවසායකත්වයේ ආයෝජනය සඳහා ඉතිරි වෙන්නේ අඩු ප්‍රමාණයකි.[65]

වේතන සඳහා, ඒකීයපුද්ගලයන්ට සහ භාණ්ඩ වලට පැනවෙන බදු

නිෂ්පාදකයන් හැටියට, ඔවුන්ගේ ආන්තික පවත්වා ගැනීම සඳහා, ඔවුන් බදු පාරිභෝගිකයා මත පටවන ලෙසින්, වේතන සඳහා පැනවෙන බදු ද අවසානයේ දී ගෙවන්නේ සේවායෝජකයන් විසිනි. ඉතින් ඒ නිසා, නැවතත්, එය පැටවෙන්නේ පාරිභෝගිකයාටමයි. මෙවැනි බදු අභූත සහ විනාශාකාරී වුව ද, ඒවා බොහෝ රටවල තවමත් පවතී.[66]

පුද්ගලයෙකුගේ ධනය මොහොතෙන් මොහොතට වෙනස් වෙන නිසා, ධන බදු හිතුමතයේ පැනවෙන සහ අසාධාරණ වූවකි.[67] ප්‍රතිශීර්ෂ බද්ද (පුද්ගල බද්ද) අසාධාරණ වනුයේ ඒවායෙන් වැඩි බරක් දැනෙන්නේ දුප්පතුන්ට වීමෙනි. ආදායම් බදු මෙන්, ඒවා නිසා වේතන වැඩි වී ඒ නිසා අවසානයේ පරිභෝජන මිල

[63]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, 848-9 පිටු, f8 වගන්තිය.
[64]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, II ඛණ්ඩය, 852-3 පිටු, g1-g4 වගන්ති.
[65]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, I සහ II ඛණ්ඩයන්හි පරිශිෂ්ටය, 862 පිටුව, h14 වගන්තිය.
[66]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, I කොටස, I සහ II ඛණ්ඩයන්හි පරිශිෂ්ටය, 864-6 පිටු, 2 වගන්තිය.
[67]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, II ඛණ්ඩය, 867 පිටුව, j2-j4 වගන්ති.

ගණන් ද ඉහළ යයි.[68] ජීවිතයේ අවශ්‍යතා (ලුණු, හම් භාණ්ඩ, සබන් හා ඉටිපන්දම් වැනි) දේවල් සඳහා පැනවෙන බදු ද එයාකාරයෙන්ම වෙති.[69]

සුඛෝපභෝගී භාණ්ඩ සඳහා පැනවෙන බදු නිසා ඒවායේ මිල පමණක් ඉහළ යයි.[70] නමුත් රේගු ගාස්තු මෙන් ඒවා එකතු කරගන්නට යන වැය ඉතා අධිකයි. එයින් සමහර ක්ෂේත්‍රය අධෛර්යමත් වන අතර, මෙවැනි අධික බදු වලින් එය ගෙවීම මඟහරින්නට ජනතාව පොළඹවනු ලබයි. එවිට ඔවුන් විමර්ශනයට බලාත්මක ප්‍රවේශයකින් යුතු අධිකාරියක් අවශ්‍ය වේ.[71]

මහජන (රාජ්‍ය) ණය

මහජන (රාජ්‍ය) අංශය පවත්වාගෙන යෑමේ වියදම් මූල්‍යකරණය වනුයේ ණය ගැනීම් තුලින් වෙද්දී, රට තුල ගොඩනඟා ගත් ප්‍රාග්ධනයෙන් කොටසක් එවිට පරිභෝජනය වේ. ඵලදායී ශ්‍රමයේ නඩත්තුව අරභයා වූ පෞද්ගලික ප්‍රාග්ධනය එවිට ඵලදායී නොවන ශ්‍රමය නඩත්තු කරන්නට හැරවී යයි.[72]

*ස්මිත් මෙහි දී 'ඵලදායී නොවන' රජයේ සේවකයන් යනුවෙන් තර්ක කරනුයේ, (පෞද්ගලික ව්‍යාපාර වලට වඩා අඩු කාර්යක්ෂමත්වයෙන් ද, අඩුවෙන් පවතින නිසි-කළමනාකාරත්වයෙන් ද මහජන සේවා සිද්ධ වෙතැයි ඔහු සිතුව ද), ලෝකයේ අද අපට ඇති වැටහීම අනුව යමින් නොවේ. බහුතර මහජන සේවා පරිභෝජන ආකාරයක් යැයි කියන ඔහු දක්වන්නේ ඒවා ණයෙන් මූල්‍යකරණය වෙද්දී, එයින් රටක ප්‍රාග්ධනය පරිභෝජනයට ලක්වෙන බවයි.*

අනෙක් අතට, ණය ගැනීම වැඩිවෙද්දී, බදු වලින් උත්පාදනය කළ යුතු ප්‍රමාණය අඩු වී යයි. යුද්ධයක් වැනි විසාල, දීර්ඝ සහ අධික වැයෙන් යුතු වියදමක් යුක්ති සහගතව මූල්‍යකරණය කරන ක්‍රමයක් ණය ගැනීමෙන් කළ හැකියි. එකම අවස්ථාවක දී බදු මාර්ගයෙන් යුද්ධයක වැය පියවාගන්නට සිද්ධ වුවහොත් එවිට, (කෙටි වූ ද, ජනප්‍රියත්වය අඩු වූ ද, යුද්ධ එතරම් හටගත්තේ ද නැති වුවත්), පෞද්ගලික ප්‍රාග්ධනය බොහෝ දුරට පීඩා විඳිනු ඇත.

ඉතින් ඒත්, ණය ගැනීම රජයේ මූලධර්මයක් හැටියට පැලපදියම් වෙද්දී, ඒ හා එන බදු සංඛ්‍යාව මහජනතාවට ඔවුන්ගේ ප්‍රාග්ධනය නඩත්තු කරගන්නට දුෂ්කර වන ලෙසින් ඒ මත බරක් පටවයි. ණය ගැනීමේ ඵලවිපාකයක් හැටියට, සාමකාමී කාලයේ දී බ්‍රිතාන්‍යයේ අයවැය දැන් පවුම් මිලියන දහයකට වඩා වැඩියි -සාම්ප්‍රදායික බදු මත පදනම් වූ මූල්‍යකරණයක දී මෙය යුද්ධයක් කරන්නට ප්‍රමාණවත් ය.

මහජනතාව තර්ක කරනුයේ මහජන ණය සරල ලෙසකින් එක කොටසකගේ පොකැට්ටු වලින් වෙනත් අයගේ පොකැට්ටු වලට හරවා යැවෙන බවයි; කිසිම මුදල් ප්‍රමාණයක් විදේශයට නොයයි, රට සතේකින් වත් දුප්පත් නොවෙයි කියායි. නමුත් එය සත්‍යයක් නොවේ. උදාහරණයකට, ඕලන්දයන් අපේ මහජන ණයෙන් විශාල ප්‍රමාණයකට අයිතිය කියති. තව දුරටත් කිවහොත්, ණය නිසා ප්‍රාග්ධනය ඉඩම් හිමියන්

---

[68]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, IV ඛන්ඩය, 869 පිටුව, j8 වගන්තිය.
[69]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, IV ඛන්ඩය, 874-5 පිටු, k10-k13 වගන්ති.
[70]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, IV ඛන්ඩය, 873 පිටුව, k9 වගන්තිය.
[71]ජාතීන්ගේ ධනය, V පොත, II පරිච්ඡේදය, II කොටස, IV ඛන්ඩය, 896-9 පිටු, k60-65 වගන්ති.
[72]ජාතීන්ගේ ධනය, V පොත, III පරිච්ඡේදය.

වෙතින් සහ සේවායෝජකයන් වෙතින් රජයේ ණය අයිතිකරුවන් අතට හැරවෙයි. අඩු ප්‍රාග්ධනයෙන් යුතුවෙද්දී, ඉඩම් අඩුවෙන් වැඩි දියුණු වේ, කෘෂිකර්මය පරිහානියට යයි; කර්මාන්ත අංශයට ද එය එසේම බලපායි. ඔවුන් තවත් පීඩාවට පත් වීමෙන්, බදු එකතුකරන්නන් ඔවුන්ව හමුවීමේ අවශ්‍යතාවය ද වැඩි කරමින් එමඟින් එහි වියදම් ද වැඩි කරයි. ඉතින් ඵලදායී ලෙසින් ප්‍රාග්ධනය යොදවන්නට දැඩි උවමනාවක් ඇති අය වෙතින් එය ඉවත් කර, භූමියේ තත්වය දියුණු කරන්නට කිසිත් උවමනාවක් නැති එසේම නිසි ප්‍රාග්ධන කළමනාකාරණය ගැන කිසිත් උවමනාවක් නැති, නිකම්ම පැත්තකට වී සිටින ණය අයිතිකරුවන් වෙත ඒවා හැරවී යයි.

ණය ගැනීම එසේ ගත් සෑම රජයක්ම අඩපණ කර ඇත. ඉතාලි ජනරජ අතරින් ජෙනෝවා සහ වැනීසිය පමණක් ස්වාධීනව පවතියි. ස්පාඤ්ඤය හැදියාව ඉතාලියෙන් ඉගෙන ගෙන ඇති හැඩයි. ඉතින්, එංගලන්තය සිලිමක් හෝ ණය වෙන්නට පෙර, දාසය වැනි සියවස අගවෙද්දී ඔවුන් දැඩි ණය බරෙන් පෙළුණි. ප්‍රංශය ද විශාල ණය බරකින් පෙළෙති. සමහර විට එංගලන්තයේ හමුදා වැය, සහ බදු බර, අඩු වූ නිසා වෙන්නැති ඔවුනට සිය නාස්තිකාර හා පමණ ඉක්මවා වියදම් කළ ආණ්ඩුවේ අලාභය පියවාගන්නට හැකියාව ලැබුණේ, නමුත් තවත් යුද්ධයක් නිසා එය නැති වී යා හැකියි.

මහජන ණය ඉහළ යවද්දී, සාධාරණව සහ සම්පූර්ණයෙන්ම පෙරළා ගෙවීමක් සිදු වූ අවස්ථාවක් ගැන උදාහරණයක් හොයාගන්නට ඉතා දුෂ්කර බව අපි මතක තබාගත යුතුයි.

තම යටත්විජිත නඩත්තුවේ වැය බ්‍රිතාන්‍යයට ඉමහත් විය. අවසාන යුද්ධයේ වැය පවුම් මිලියන 90 කට වඩා ඉහළ විය. 1739 වසරේ ස්පාඤ්ඤ යුද්ධය, ප්‍රධාන වශයෙන් යටත්විජිත උදෙසාම මෙහෙය වූවේ වැය පවුම් මිලියන 40 ඉක්මවීය. මේ යුද්ධ නොවන්නට, මහජන ණය මේ වෙද්දී සම්පූර්ණයෙන්ම අයින් කර දමන්නට හැකිවනු ඇත.

ඒවා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ පළාත් නිසා, යටත්විජිත ආරක්ෂා කරගත යුතු යැයි තර්ක කෙරේ. නමුත් ඒවායෙන් අධිරාජ්‍යයට ආදායමක් හෝ හමුදාවක් සපයන්නේ නැත. ඒවා අධිරාජ්‍යය ලස්සන කරන්නට එල්ලා ගත් අනුබද්ධයන් පමණකි. මේ අනුබද්ධයන් නඩත්තු කරන වියදම් තව දුරටත් දරාගන්නට අධිරාජ්‍යයට නොහැකි නම්, එය ඒවා අත්හැර දැමිය යුතුයි, ඒවාට යන වියදම් ඉතිරි කරගෙන, තම හැකියාව පමණට ජීවත් විය යුතුයි.

# 3 ඉතාමත් අපූරු ලෙස සංක්ෂිප්ත කළ ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය

ස්වභාවික සහානුභූතිය සද්ගුණයේ පදනම ලෙස

මිනිස් සත්වයන් සියල්ලන්ටම අනෙකා ගැන සංවේදී දැනුමක් ස්වභාවයෙන්ම පිහිටා ඇත. අයෙක් වේදනාවෙන් සිටිය දී අප අතර ඉන්න නරකම පුද්ගලයාටත් යම් දුකක් හිතට දැනේ. වෙනකෙකුට පහරක් වැදෙන්න යද්දී අපිත් ගැස්සෙමු. කඹයක් මත හිටගෙන දක්කම් පෙන්වන අයෙක් දකිද්දී අපිත් නොසන්සුන්ව ඇඹරෙමු. එසේම අපි අනුන්ගේ සතුට ද බෙදාගන්නෙමු. මෙයට අපි අනුකම්පාව යැයි කියමු.[73]

මිනිසා කොතරම් ආත්මාර්ථකාමී දැයි කියැවෙතත්, ඔහුගේ ස්වභාවයේ සමහර මූලධර්ම වලින් සාක්ෂි කියා පාන්නේ අනුන්ගේ වාසනාව ගැන ඔහුට උනන්දුවක් ඇති බවයි. එය දකින සතුට හැරෙන්නට, එයින් කිසිවක් ආපසු ලැබෙන්නේ නැති වුවත්, අනුන්ගේ සතුට පැදීම ඔහුට අවශ්‍ය වූවකි.[74]

ඒත් මෙහි සීමාවන් ඇත. අපි අනිත් අය හා එකතුව දුක සහ සතුට බෙදා ගන්නේ ඔවුන් කරන ක්‍රියාවන් ඔවුන්ගේ ඒ හැඟීම් හටගත් සිද්ධියට අදාල පරිදි සුදුසු යැයි අපි සිතනවා නම් පමණි. අයෙක් දුකින් හඬා වැලපෙද්දී, අපට ඒ පුද්ගලයා එසේ වැලපෙන්නේ මන්දැයි දැන ගැනීමට උවමනාවක් ඇත. එනම්, අපේ අනුකම්පාව ඇති කරන ලද්දේ ඔවුන්ගේ දුක නම් ආවේගය නොවේ. අපිව උනන්දු කරවන්නේ ඔවුන්ගේ ආවේගය නොව, ඒ දුක ඇති වූයේ කුමන තත්වයක් නිසාදැයි කියා දැනගැනීමටයි. එසේම, දිමෙන්තියාව නිසා සමහරු ඉතා සතුටින් සිටිනු ඇත. මිය ගිය අයෙක්ට සංවේදී තත්වයක් නැති වෙන්නට පුළුවනි. නමුත් ඔවුන් ගැනත් අපි සංවේදී වෙමු. මන්ද, එවැනි අවසානාවන්ත තත්වයකට අපිත් පත්වෙන ආකාරය අපිට හිතාගත හැකි නිසයි. ඒත් යම් අයෙක් අනවශ්‍ය තරම් දුකකින් වැලපෙනවා යැයි දකිද්දී, අනවශ්‍ය කෝපයකින් හෝ අනවශ්‍ය ඇල්මකින් බැඳී ඇතැයි දකිද්දී, අපි එය ඒ පුද්ගලයාට හා අනිත් අයට ද හානිකර වූ තත්වයක් යැයි සලකා ඒ අය ගැන අනුකම්පාවක් ඇති කරගන්නේ නැත.

අනෙක් අතට, අපේ මත සහ ආවේග එයාකාරයෙන්ම බෙදාගන්නා අය හමුවෙද්දී අව්‍යාජ සතුටකින් අපේ සිත් පිරී යයි.[75] අපේ හිත්වල තියෙන දෑ අනුන්ට කියද්දී ඔවුන් වෙතින් ලැබෙන සහානුභූතියෙන් අපේ සිත් සැනසේ. අප සමඟ එකඟ වෙන අයගේ අදහස් යුක්ති සහගත, සුදුසු හා ඔබින ඒවා හැටියට අපි සලකමු. නමුත් අනිත් අයගේ ආවේගයන් බෙදා නොගන්නා අවස්ථාවල දී, අපි ඔවුන්ගේ ක්‍රියාවන්ට හා මත වලට අප්‍රසාදය දක්වමු. ඔවුන් වැරදි කරනවා යැයි සිතමු. එය ඔවුන්ගේ මෙන්ම අපේ ද සිත් කනස්සල්ලට පත් කරයි.

---

[73]ස්මිත් sympathy යනුවෙන් එය හැඳින්විය. ඒ නිසා අපිත් එයම භාවිතා කරමු. ඒත් සහකම්පනය/සහානුභූතිය යන අර්ථ දැක්වෙන empathy යන්න එය අද වඩා නිවැරදිව විස්තර කරන වචනයයි.

[74]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, I කොටස, I ඛන්ඩය, I පරිච්ඡේදය, 9 පිටුව, I වගන්තිය.

[75]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, I කොටස, I ඛන්ඩය, II පරිච්ඡේදය

එය එසේ වුවත්, ප්‍රේක්ෂකයෙක් හැටියට පමණක්, අපිට තවත් අයෙකුගේ ආවේගයන් වල රෞද්‍ර භාවය මුළුමනින්ම අත්දකින්නට නොහැකියි. අකටයුත්තකට ලක්වූ අයෙකුගේ දැඩි කෝපය, ළඟක දී සමීපවන්තයෙක් මිය ගිය අයෙකුට දැනෙන අතිශය ශෝකය අපිට එයාකාරයෙන් දැනගන්නට හැකියාවක් නැත. අපට දැනෙන අනුකම්පිත හැඟීම්, සත්‍ය වුවත්, එවැන්නා තුල වූ ආවේගයට වඩා බෙහෙවින් දුර්වල වූවකි.

අපි අනෙක් අයගේ ආවේග හඳුනා ගනිද්දී මේ අනික් අය ද අපේ ආවේග හඳුනා ගන්නා ප්‍රේක්ෂකයන් වෙති. ඔවුන්ට ලෙසින්ම තදින් අපිට දැනෙන්නේ නැතිබව ඔවුන් ද දකිති. මේ අසංගතය ඔවුන්ගේ සිත් කනස්සල්ලට පත් කරයි. ඒ නිසා ඔවුන් වැටී සිටින අභාග්‍ය තත්වය අපි දකින ආකාරයෙන් හැඩගස්වා ගන්නට ඔවුන්ගේ ආවේග මෙල්ල කරගන්නට ඔවුන් කටයුතු කරති. ටිකෙන් ටික අපි අනුන්ට පෙනෙන්නට සුදුසු වූ යැයි සිතෙන ආවේග හා ක්‍රියා මොනවාදැයි හඳුනා ගන්නෙමු. අපි ඒවා කොතරම් දුරකට පාලනය කරගන්නවා ද කියතොත්, පැත්තක් නොගන්නා ප්‍රේක්ෂකයෙක් අපේ මනෝභාවයන් සම්පූර්ණයෙන් බෙදාගන්නට තරම් ඒවා සුදුසු යැයි සිතන තරමට අපි එන්නෙමු. අපක්ෂපාතී ප්‍රේක්ෂකයා අනුමත කරන බව අපි දන්නා බැවින්, එයින් සතුටක් ලබන අපි, අනුන් ගැන සැබෑ සැලකිලිමත් බවක් පෙන්වන තරමට තවත් දුරට පෙළඹෙමු.

ඉතින් ඒ නිසා, අනුන්ට වැඩියෙන් ද අප වෙනුවෙන් ටිකක් ද සංවේදී වීමේ දී, අපි අපේ ආත්මාර්ථකාමය මෙල්ල කරගැනීමේ දී, අපේ ගුණවත් හොඳහිතට ඉඩදීමේ දී, පරිපූර්ණ මිනිස් ස්වභාවය නිමැවේ. ඉතින් එයින් පමණක් මිනිස් වර්ගයා අතර පූර්ණ ප්‍රසන්න භාවය සහ ශිෂ්ටත්වය පිහිටන්නා වූ මනෝභාවයන්හි සුසංවාදයක් සහ ලාලසයක් ඇති කළ හැකියි.[76]

*මෙයාකාරයෙන් ස්මිත් විසින් මිනිස් සද්ගුණයේ ප්‍රභවය පැහැදිලි කිරීම එවක දී සහමුලින් නව්‍ය උත්සාහයක් විය. සීනෝ වැනි පුරාතනයන් සිට ඩේවිඩ් හියුම් වැනි නූතනයන් දක්වා බොහෝ දාර්ශනිකයන් උත්සාහ කරන ලද්දේ ආචාර ධර්මීය ක්‍රියාවක් පුද්ගලයෙකුට නැත්නම් සමාජයට ප්‍රයෝජනවත් දෙයක් හැටියට පෙන්වන්නටයි. ආචාර ධර්මීය ක්‍රියාවක් සැබැවින්ම ප්‍රයෝජනවත් දෙයක් හැටියට දක්වන ස්මිත් ඒත් එය උවමනාවෙන් හිතාමතා කරන්නක් නොවන බව කියයි. ඒ වෙනුවට ඇත්තේ මිනිස් සත්වයාට එකිනෙකා සමඟ ස්වභාවික වූ සහානුභූතියකි. ඉතින්, අනිත් අය ඉවසන්නේ කොතරම්දැයි හා ඉවසා නොසිටින්නේ කොතරම්දැයි කියා අපි ඉතා ඉක්මණින්ම ඉගෙන ගන්නෙමු.*

වේදනාව, කුසගින්න, නැත්නම් ආදරය වැනි අනුරාග ඒකීයපුද්ගලයාට ඉතා සුවිශේෂී වෙති. එනමුත් අනෙකා ගැන හැඟීම වැනි සමාජ ලාලස ද ඇත. ද්වේෂය වැනි අනාශ්‍රේය වූ ලාලස ද ඇත. සහානුභූතිය ප්‍රධාන භූමිකාවක් රඟන්නේ මේවායේ දී ය.[77]

කෙනෙක්ගේ දුකට වඩා සතුට හමුවේ සහානුභූතිය දක්වන්නට අපි වැඩියෙන් කැමැත්තෙමු. දුප්පත් අය තම දරිද්‍රතාවය සඟවා ගන්නේ සහ ධනවත් අය සිය ධනවස්තු හැමට පෙන්වන්නේ මේ නිසයි. මුදල් වලින් ඇත්තටම සතුට මිල දී ගන්නේ නැත. එහෙත් එය එසේ කරනවා යැයි අපි සිතමු. ඉතින් ධනවතුන්ට

[76] ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, I කොටස, I බන්ධය, V පරිච්ඡේදය, 25 පිටුව, 5 වගන්තිය.
[77] ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, I කොටස, II බන්ධය

ඔවුන්ගේ මුදල් වලින් ඇත්තෙන්ම ලැබෙන අරුමෝසම් බඩු හා සුළු පහසුකම් වලට වඩා අපේ සම්පූර්ණ අවධානය, සහානුභූතිය සහ බුහුමන් වැඩි වටිනාකමෙන් යුතුයි.

සමාජ ලාලසය දිරිමත් කරනු සඳහා පාරිතෝෂිකය වැදගත් වෙයි. අනාශ්‍රේය හැදියාව අධෛර්ය කරන්නට දඬුවම වැදගත් වෙයි. ඉතින් ඒ නිසා, ප්‍රතිඵලයට වැඩියෙන් පරමාර්ථයයි අපේ කැමැත්ත හා අකමැත්ත උනන්දුවට පත්කරන්නේ.[78] ධනාත්මක අභිප්‍රායකින් එන උදව්වක් පමණක් තෑග්ගක් ලැබීමට සුදුසු යැයි අපි විශ්වාස කරන්නේ මේ නිසයි. එසේම, ඍණාත්මක අභිප්‍රායකින් එන හානිකර ක්‍රියාවක් පමණක් දඬුවම් ලැබිය යුතු යැයි සිතන්නේ ද මේ නිසයි.[79]

සමාජ ජීවින් හැටියට ඇති අපේ පැවැත්ම නිසා, අපි දඬුවම තුලින් බලාපොරොත්තු වෙන්නේ අපිට කිසිසේතම නොලැබිය යුතු යැයි දකින සහ අපි 'ඉල්ලන් කන' අවස්ථාවල දී නොවන ද්වේෂය මට්ටු කළ යුතු යැයි කියායි. මේ සඳහා ස්වභාව ධර්මයෙන් මාර්ගෝපදේශය අපිට ලැබී ඇත.[80] (ඒත් අපි උද්ධච්ච වෙමින් එය අපේ විචාරයෙන් ලැබුණ ලෙසින් හැසිරෙමු).[81]

අනුන්ගේ හදවත් තුලට එබී බලන්නට අපිට නොහැකි බව අපි පිළිගනිමු. ඒ නිසා නරක අභිප්‍රායයන් ඇති සියල්ලන්වම සැක කරමින් ඔවුන්ට දඬුවම් කරනවා වෙනුවට, අපි දඬුවම් කරන්නේ හානියක් කරන අරමුණක් ඇති ඔවුන්ගේ ක්‍රියාවන්ට පමණි.[82] එකිනෙකාව මංකොල්ලය හා මිනීමැරීමේ උත්ප්‍රාය මර්ධනය කරගන්නට හැකිනම් හොරුන් සහ මිනීමරුවන්ට ද සාමයෙන් එකට ජීවත්විය හැකියි.[83] ජනතාව එකිනෙකාට හානිකර ගැනීමෙන් වළක්වන්නට ගෙනෙන රීතීන්ට අපි යුක්තිය යැයි කියමු. යුක්තිය නැතිව කිසිම සමාජයකට පැවැත්මක් නැත. යුක්තිය ආරක්ෂා කරගන්නට ඇති අපේ සහජ ආශය ඉතාමත් දැඩි ලෙසකින් පිහිටා ඇත්තේ ඒ නිසයි.[84]

සවිඥානය

ඒත් අරමුණ වෙනුවෙන් මේ නීති සහ දඬුවම් වලටත් වඩා ඉතා වැඩියෙන් කාර්යක්ෂම වූවක් ස්වභාව ධර්මයෙන් අපිට ලැබී ඇත. එය සවිඥානය නම් වේ. අපි අනිත් පුද්ගලයන්ගේ ක්‍රියාවන් විනිශ්චය කරමු. එසේම අපි අපේ ක්‍රියාවන් ද විනිශ්චය කරමු.[85] ඒ තමන් ගැන තීන්දු දෙන විනිසුරුවා ඉතා දරුණු විවේචකයෙකි. අනිත් අය අපිව ප්‍රශංසා කළාට ප්‍රමාණවත් නැත: අප තුල ඒ ප්‍රශංසාව ලැබීමට සුදුස්සෙක් යැයි සිතට දැනීමේ අවශ්‍යතාවයක් පිහිටා තිබේ.[86]

---

[78]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, II කොටස, I බන්ධය, III සහ IV පරිච්ඡේද
[79]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, II කොටස, I බන්ධය, IV පරිච්ඡේදය
[80]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, II කොටස, I බන්ධය, V පරිච්ඡේදය, 77 පිටුව, 10 වගන්තිය
[81]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, II කොටස, II බන්ධය, III පරිච්ඡේදය
[82]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, II කොටස, III බන්ධය, I සහ II පරිච්ඡේද
[83]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, II කොටස, II බන්ධය, III පරිච්ඡේදය, 86 පිටුව, 3 වගන්තිය
[84]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, II කොටස, II බන්ධය, I පරිච්ඡේදය
[85]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, III කොටස, I පරිච්ඡේදය
[86]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, III කොටස, II පරිච්ඡේදය

සවිඥානය බලවත් සමාජ කාර්යයක් කරයි. අපි පමණට වඩා වැඩියෙන් අප ගැනම ගැල්වීමෙන් සහ අනෙක් අය ගැන නිතර අමතකවීමෙන් අපව නවත්වයි. මුළු චීනයම දෙදරවන ලද භූමිකම්පාවකට වඩා අපට අපේ සුළැඟිල්ල අහිමි වීම වැඩියෙන් දැනෙන්නකි. ඒත් අපේ සුළැඟිල්ල අත්හැරියොත් ඒ භූමිකම්පාව නවත්වා විශාල සංඛ්‍යාවක දුරස්ථ ජීවිත ගලවාගත හැකියාවක් ඇත්නම් එය කළ යුතු යැයි අපේ සවිඥානය අපිට කියයි. ස්වභාව ධර්මයට සියළු ජනතාව වැදගත්. සවිඥානය අපිට දෙන්නේ ඒ දැක්මෙන් කොටසකි. අපේ පුද්ගලික වාසිය උදෙසා අනික් අයට හානි කිරීමෙන් වැළකීමට අපිව පොළඹවන්නේ එයයි.[87]

රීති හදමින් ඒවා අනුගමනයට අපේ නැඹුරුවීම තවත් ප්‍රයෝජනවත් සහජ ආශයකි. අපේ ක්‍රියාවන් අනෙක් අයට බලපාන්නේ සහ ඔවුන්ගේ ක්‍රියාවන් අපිට බලපාන්නේ කෙසේදැයි අපි දකිමු. ක්‍රම ක්‍රමයෙන් අපි අදහස් වර්ධනය කරගන්නේ සුදුසු හා නුසුදුසු ක්‍රියාවන් මොනවාදැයි තෝරා බේරා ගන්නටයි. මේ ආචාර ධර්ම රීති අපිට දෙන්නේ සෑම අවස්ථාවක දී ම අලුතින් හිතන්නට අවශ්‍ය නොවී, සමාජයේ හැසිරිය යුත්තේ කෙසේදැයි ඉක්මණින් කරන්නට මගපෙන්වීමකි. විවිධ සමාජවල එකිනෙකට ටිකක් වෙනස් සම්මුති තියෙන්නට පුළුවනි. ඒත් ඒ හැම ක්‍රමයක්ම සමාජ සුබසාධනය සඳහා පෙනී නොසිටියේ නම් ඒ සම්මුති වැඩිකල් නොගිහින් වඳ වී යනු ඇත. අපි මේ රීති පිළිපදින්නේ සදොස් යැයි කොනහන සවිඥානයකින් ගැලවෙන්නට වුවත්, ඒ තුලින් අපි සමාජයේ හොඳ යහපත්බව ප්‍රවර්ධනයට සහාය වෙන්නන් බවට පත්වෙමු.[88]

*ආචාර ධර්ම සමාජ මනෝවිද්‍යාවක් හැටියට ස්මිත් සැලකීය. ක්‍රියාවන්හි සමහර රීති සමාජය හොඳින් ක්‍රියාකරවන්නට යොමු කරවයි. ඒවා පිළිපදින විට සමාජයක් සමෘද්ධිමත් වේ. ඒවා පිළි නොපදින විට, සමාජයක් විනාශ වේ. ස්මිත් ලියන්නේ ඩාවින්ට සියවසකට පෙර ය. එහෙත් ඔහු පරිනාමීය දැක්මක් ඉදිරිපත් කරන්නට උත්සාහ කරයි: ස්වභාව ධර්මය අපිට සවිඥානය සහ ආචාර ධර්ම ලබා දී ඇත්තේ අපේ පැවැත්ම ආරක්ෂා කරගන්නටයි.*

## ආචාර ධර්ම සහ මුදල්

ධනවතුන් ද, ඔවුන් අදහස් නොකරම, සෙසු අපේ යහපත සාධනය කරති. ඔවුන් ඉල්ලන සමාජ තත්වයන් හා සුඛෝපභෝගීත්වයන් හදන්නට සියළු ජනතාවට ඔවුන් රස්සා නිර්මාණය කරති. එය විශිෂ්ට සාමානකරණයකි. ධනවත්කමෙන් ලැබෙනවා යැයි කියන යහපත මුලාවක් විය හැකියි, ඒත් ධනවස්තු සොයා යන පුද්ගලයන් ඒ අරමුණ සඳහා ඉමහත් සේ වෙහෙසෙන්නට පොළඹවයි. එයින් කර්මාන්තයන් පමණක් නොව, විද්‍යාව, කලාව සහ විද්වත් ජීවිතය ද ඒ සමගින් දියුණු වේ.[89]

> පෘතුවිය එහි ජීවින් අතර එක හා සමාන ප්‍රමාණ වලින් බෙදා තිබී ඇත්නම්, ජීවිතයේ අවශ්‍යතාවන්ට එක හා සමාන ලෙසකින්ම බෙදාහැරීම සඳහා අදිසි හස්තය විසින් [ධනවතුන්] ව ද එයාකාරයෙන්ම දක්කනු ලබයි.[90]

---

[87] ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, III කොටස, III පරිච්ඡේදය
[88] ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, III කොටස, IV පරිච්ඡේදය, 159 පිටුව, 7-8 වගන්ති
[89] ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, IV කොටස, I පරිච්ඡේදය
[90] ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, IV කොටස, I පරිච්ඡේදය, 184-5 පිටු, 10 වගන්තිය

සද්ගුණය සහ යහපත් සමාජය

අව්‍යාජ සද්ගුණවත් පුද්ගලයා තුල *විචක්ෂණය*, *යුක්තිය* හා *පරෝපකාරීත්වය* පිළිබඳ බුද්ධිය ඇත. පමණට වඩා වැඩියෙන් කරන ක්‍රියා කටයුතු මැඩගන්නට ඒකීයපුද්ගලයාට විචක්ෂණ බුද්ධිය උපකාරී වීමෙන් සමාජයට යහපත් වේ.[91] යුක්තියේ රීති අනුන්ට හානි පැමිණවීමෙන් අපිව වළක්වනු ලබයි. පරෝපකාරීත්වය අනුන්ගේ සතුට ප්‍රවර්ධනය කරන නිසා එය ද සමාජයට හිතදායකයි.

අපේ උග්‍ර ලාලසය හමුවේ *ස්ව-පාලනයක්* තිබීම ද සද්ගුණවත් ය. ඒත් එය හිතක් පපුවක් නැති අවියක් ගත් අන්තවාදියෙකු බවට හැරවිය හැකි දෙපැත්තකින් යුතු වූවක් ද විය හැකියි. සාමාන්‍යයෙන් අපි වැඩියෙන් අවධානයක් දෙන්නේ අපිටයි. ඊ ළඟ අපේ පවුල ගැන. අනතුරුව පමණක් අපි අනිත් අය ගැන අවධානය යොමු කරමු.[92] ඒත් මිනිසත්බව යනු ඒකීයපුද්ගලයාට වඩා වැඩියෙන් වැදගත් නිසා, සමහර අවස්ථාවල දී ආත්ම පරිත්‍යාග අවශ්‍ය වේ.[93] ස්වභාව ධර්මයෙන් සමහර පුද්ගලයන්ට එවැනි පරිත්‍යාග කරන්නට ස්ව-පාලනයක් ලබා දී ඇත. එය විනාශකාරී නොව යහපත් අරමුණු සඳහා යොදා ගනිද්දී පමණක් එය අපි අගයමු.

අපි අපේ රටට ආදරයේ කියද්දී අපි අදහස් කරන්නේ එහි ආයතන වලට ඇති අපේ ගෞරවයයි. එය ජනතාවට දක්වන අනුකම්පාව හා සමාන නොවූවකි. අර්බුද කාලවල දී, රටක ආයතන එහි පුරවැසියන්ගේ සතුට හා ගැටෙන්නට හැකියි.[94] එවිට දේශපාලනඥයන් පවතින ආයතන පන්නා දමා ඒ වෙනුවට 'යථාර්ථවාදී' විකල්ප ආයතන ගෙනෙන්නට යෝජනා කරති. ඒත් අපි මතක තබාගත යුත්තේ, මේ ප්‍රතිසංස්කරණවාදීන්ට පැහැදිලිව නොපෙනෙන සැබෑ යහපතක් ඒ පැරණි ආයතන වලින් ලබාදෙනවා විය හැකි බවයි. එසේම අපි මතක තබාගත යුත්තේ, දේශපාලනඥයන්ගේ විසල් සැලසුම් වලට ඉතා ලේසියෙන් නතුවෙන සියළු ඒකීයපුද්ගලයන්ට ඔවුන්ගේම වූ ඒකීය අභිමතාර්ථයන් ද ඇති බවයි. අනාගතය සැලසුම් කරන්නන්ට සහ අන්තගාමීන්ට වඩා නිදහස සහ මිනිස් ස්වභාවය යනු සුසංවාදී වූ, ක්‍රියාකරන සමාජයක් සඳහා වැඩියෙන් සහතික වූ මාර්ගෝපදේශයක් සපයයි.

> සැලසුම් ක්‍රමයේ මිනිසා ... චෙස් ලෑල්ලක විවිධ ඉත්තන්ව අතින් එහා මෙහා යවනවා සේ පහසුවෙන්, ශ්‍රේෂ්ඨ සමාජයක විවිධ සාමාජිකයන්ව පිළිවෙලකට හැඩගසන්නට හැකි යැයි පරිකල්පනය කරන බවක් පෙනේ. මිනිස් සමාජය යන ශ්‍රේෂ්ඨ චෙස් ලෑල්ලේ සෑම ඒකීය ඉත්තෙක්ටම ඔහුගේම කියා එහා මෙහා යන සිද්ධාන්තයක් ඇතැයි කියාත්, එය නීතිකාරකය තුලින් ඔහු වෙත බලපෑම් කරන්නට සමත් වූවට වඩා බෙහෙවින්ම වෙනස් වූවක් යැයි ද සැලසුම් ක්‍රමයේ මිනිසා සලකා බලන්නේ නැත.[95]

*මෙහි දී ආචාර ධර්ම ගැන ස්මිත් කරන විශ්ලේෂණය ඔහුගේ ආර්ථික විශ්ලේෂණයට බෙහෙවින් සමාන වූවකි. ආචාර ධර්ම හා වෙළඳපොල යන දෙකම ක්‍රියාකාරීත්වයෙන් යුතු පද්ධති දෙකකි. ඒවා සහජ ආශයෙන් යුතු සිද්ධාන්ත වලින් ක්‍රියා කරති. ඒවාට එසේ ක්‍රියාකරන්නට ඉඩ හරිද්දී, මිනිස් සුබසිද්ධිය*

---

[91]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, VI කොටස, I ඛන්ඩය, I පරිච්ඡේදය.
[92]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, VI කොටස, I ඛන්ඩය, I පරිච්ඡේදය.
[93]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, VI කොටස, III ඛන්ඩය, 235 පිටුව, 3 වගන්තිය.
[94]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, VI කොටස, II පරිච්ඡේදය, 229 පිටුව, 4 වගන්තිය.
[95]ආචාර ධර්ම මනෝභාවයේ න්‍යාය, VI කොටස, II ඛන්ඩය, 233-4 පිටුව, 17 වගන්තිය.

*ප්‍රවර්ධනයට ඒවා හොඳින් වැඩ කරයි. අපිට වෙනත්, විනාශකාරී සහජ ආශයන් තිබුණා නම්, අපි ඒ ගැන කතා කරන්නට අද මෙතැන සිටින්නේ නැත. ඒ නිසා අපි මේ පද්ධති අපිට හරි යැයි හිතෙන විදියකට නැවත හැඩ ගැසීම ගැන විපරම්කාරී විය යුතුයි. නැත්නම් සම්පූර්ණ ක්‍රියාවලියම අපි අස්ථාවර කර දමනු ඇත.*

## 4 වැඩිදුර කියැවීම්


Butler, Eamonn (2007) Adam Smith – *A Primer*, Institute of Economic Affairs, London. ස්මිත්ගේ ජීවිතය සහ කෘති ගැන කෙටි, සරල හැඳින්වීමකි.

Haggarty, J. (1976) *The Wisdom of Adam Smith*, Liberty Fund Indianapolis, IN, USA. උපුටා දැක්වීම සඳහා ඔබ ස්මිත්ගේ පාඨ හොයන්නේ ද, එහෙනම් මේ පොත ඔබටයි.

O'Rourke, P. J. (2006) *On The Wealth of Nations*, Atlantic Monthly Press, New York, USA. ස්මිත්ගේ ප්‍රධාන අදහස් ගැන වාග් විදග්ධ වූ එහෙත් ප්‍රහග්‍රහණය කරගත හැකි සම්පිණ්ඩනයකි.

West, E. G. (1976) *Adam Smith: The Man and His Works*, Liberty Fund Indianapolis, IN, USA. ස්මිත්ගේ ජීවිතය, නිර්මාණ සහ බලපෑම ගැන කෙටි චරිතපදානමය වූ සාරාංශයකි.